# 2

# ජාතික නිෂ්පාදිතය සහ වියදම

## 2.1 සමස්ත නිරීක්ෂණ

**ශ්‍රී ලංකා ආර්ථිකය අඛණ්ඩව වසර දෙකක කාලයක් තුළ සියයට 8 ක වර්ධනයක් ලැබූ පසුබිමක සිට 2012 වසර තුළ සියයට 6.4 ක මූර්ත ආර්ථික වර්ධනයක් අත්පත් කර ගත්තේය.** මෙම වර්ධනය අභියෝගාත්මක පරිසරයක් මධ්‍යයේ අත්පත් කර ගත් බැවින් ප්‍රශංසනීය වේ. පසුගිය වසර කිහිපය තුළ ආර්ථික වර්ධනයට දායක වූ ඉහළ මට්ටමක පැවති ආයෝජක විශ්වාසය තුළින් වර්ධනය වූ ආර්ථික ක්‍රියාකාරකම්, සාපේක්ෂ ලෙස අඩු මට්ටමක පැවති පොලී අනුපාතික, ස්ථාවර විනිමය අනුපාතික සහ පහත හෙලන ලද රාජ්‍ය බදු වැනි කරුණු 2011 වසරේ දී ආර්ථික වර්ධනය ඉහළ නැංවූ නමුදු මෙය ගෙවුම් තුලනයෙහි වෙළෙඳ ගිණුමේ අසමතුලිත තත්ත්වයක් ඇති වීමට තුඩු දුන් අතර, පුළුල් මුදල් වර්ධනය වේගවත්ව ඉහළ යාම හේතුවෙන් ණය වර්ධනය ද වේගවත් විය. සාර්ව ආර්ථික වාතාවරණය වඩා යහපත් කිරීම උදෙසා 2012 වසරේ පළමු කාර්තුව තුළ රජය සහ මහ බැංකුව අනුගමනය කළ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග හේතුවෙන් දේශීය ඉල්ලුම පහත වැටෙනු දක්නට ලැබුණි. මෙයට අමතරව, සංවර්ධිත මෙන්ම නැගී එන ආර්ථිකයන්ගේ මන්දගාමීත්වය, යුරෝපා ස්වෛරීත්ව ණය අර්බුදය, එක්සත් ජනපදයේ රාජ්‍ය මූල්‍ය ගැටළු, භූ දේශපාලනික අවිනිශ්චිතතාවයන් සහ ඉහළ ඛණිජ තෙල් මිල ගණන් අපනයනය සඳහා පැවති ඉල්ලුම කෙරෙහි අයහපත් ලෙස බලපෑවේය. මේ අතරතුර රටට බලපෑ අයහපත් කාලගුණික තත්ත්වය, විශේෂයෙන්ම වසරේ දෙවන භාගයේ දී කෘෂිකාර්මික කටයුතුවලට හා ආර්ථික වර්ධනයට අහිතකර ලෙස බලපාන ලදී.

**නිෂ්පාදන අංශය සලකන විට, ආර්ථික වර්ධනයට මූලික ජවය සපයන ලද්දේ කාර්මික අංශයෙහි වූ ඉහළ වර්ධනයයි.** පසුගිය වසරේ දී මෙන් ඉහළ වේගයකින් වර්ධනය වූ ඉදිකිරීම් කටයුතු 2012 වසර තුළ කාර්මික අංශයේ සියයට 10.3 ක වර්ධනයක් පවත්වා ගෙන යාම සඳහා ප්‍රමුඛ ලෙස දායකත්වය සැපයීය. ඉදිකිරීම් උප අංශයෙහි වර්ධනය පතල් හා කැණීම් උප අංශයේ නිෂ්පාදිත වර්ධනයට ද හිතකර ලෙස බලපාන ලදී. කාර්මික අංශය තුළ විශාලතම උප අංශය වන නිෂ්පාදන කර්මාන්ත උප අංශයෙහි එකතු කළ අගය මත වර්ධනය, දේශීය සහ විදේශීය ඉල්ලුමෙහි අහිතකර තත්ත්වයන් නිසා මන්දගාමී විය. එසේම, පසුගිය වසරේ දී අත්කරගත් ඉහළ වර්ධනයට සාපේක්ෂව සේවා අංශයේ වර්ධනය 2012 වසරේ දී සියයට 4.6 කට සීමා විය. මෙම මන්දගාමීත්වය සඳහා විදේශ වෙළෙඳ කටයුතුවල ක්‍රියාකාරිත්වය පහත වැටීම සහ ප්‍රවාහන උප අංශයේ දක්නට ලැබුණු පසුගාමීත්වය ප්‍රධාන වශයෙන් දායක විය. මේ අතරතුර දී, බැංකු, රක්ෂණ සහ දේපළ වෙළෙඳාම් යනාදිය හා හෝටල් සහ ආපනශාලා යන උප අංශ පසුගිය වසරට සාපේක්ෂව අඩු වේගයකින් ප්‍රසාරණය විය. වසරේ දෙවන භාගයෙහි පැවතුණු අයහපත් කාලගුණික තත්ත්වයන් මගින් වර්ධන ගාමකත්වය වෙත සිදු වූ බාධාවන් මධ්‍යයේ වුව ද කෘෂිකාර්මික අංශය පසුගිය වසරේ දී අත්කරගත් සියයට 1.4 ක වර්ධනයට සාපේක්ෂව 2012 වසරේ දී සියයට 5.8 ක යහපත් වර්ධනයක් වාර්තා කළේය. 2012 වසර තුළ මහ කන්නයේ වී නිෂ්පාදනය ඉහළ වර්ධනයක්

**2.1 සංඛ්‍යා සටහන**

**කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය සහ වර්ධනය (2002 ස්ථාවර මිල අනුව)**

| අංශය | වෙනස්වීමේ අනුපාතය (%) | | ද.දේ.නි.හි වෙනස්වීමේ දායකත්වය (%) | | ද.දේ.නි.යට දායකත්වය (%) | |
|---|---|---|---|---|---|---|
| | 2011 (අ) | 2012 (ආ) | 2011 (අ) | 2012 (ආ) | 2011 (අ) | 2012 (ආ) |
| **කෘෂිකාර්මික** | **1.4** | **5.8** | **2.1** | **10.0** | **11.2** | **11.1** |
| 1 **කෘෂිකර්මය, පශු සම්පත් සහ දැව ආදී වන ද්‍රව්‍ය** | **- 0.2** | **5.3** | **- 0.2** | **8.2** | **9.9** | **9.8** |
| 1.1 තේ | - 1.2 | - 1.2 | - 0.2 | - 0.2 | 1.0 | 0.9 |
| 1.2 රබර් | 2.1 | - 6.8 | 0.1 | - 0.3 | 0.2 | 0.2 |
| 1.3 පොල් | 3.0 | 6.0 | 0.4 | 1.0 | 1.0 | 1.0 |
| 1.4 සුළු අපනයන බෝග | - 19.0 | - 5.0 | - 1.3 | - 0.3 | 0.4 | 0.4 |
| 1.5 වී | - 8.4 | 1.3 | - 1.9 | 0.3 | 1.5 | 1.5 |
| 1.6 පශු සම්පත් | 7.3 | 6.4 | 0.7 | 0.8 | 0.8 | 0.8 |
| 1.7 අනෙකුත් ආහාර බෝග | 2.4 | 10.0 | 1.1 | 5.6 | 3.6 | 3.7 |
| 1.8 වතු සංවර්ධනය | 5.7 | 8.8 | 0.2 | 0.3 | 0.3 | 0.3 |
| 1.9 දැව සහ වන සම්පත් | 4.1 | 5.4 | 0.3 | 0.5 | 0.6 | 0.6 |
| 1.10 වෙනත් කෘෂිකාර්මික නිෂ්පාදන | 7.0 | 6.8 | 0.3 | 0.4 | 0.4 | 0.4 |
| 2 **ධීවර කර්මාන්තය** | **15.5** | **9.3** | **2.3** | **1.9** | **1.3** | **1.3** |
| **කාර්මික** | **10.3** | **10.3** | **36.0** | **47.1** | **29.3** | **30.4** |
| 3 **පතල් සහ කැණීම්** | **18.5** | **18.9** | **5.1** | **7.3** | **2.5** | **2.8** |
| 4 **නිෂ්පාදන කර්මාන්ත** | **7.9** | **5.2** | **16.7** | **14.1** | **17.3** | **17.1** |
| 4.1 සැකසුම් (තේ, රබර් සහ පොල්) | 0.9 | 6.5 | 0.1 | 0.6 | 0.6 | 0.6 |
| 4.2 කර්මාන්තශාලා නිෂ්පාදන | 8.3 | 5.2 | 15.7 | 12.8 | 15.7 | 15.5 |
| 4.3 ගෘහ කර්මාන්ත | 7.0 | 4.6 | 0.9 | 0.7 | 1.0 | 1.0 |
| 5 **විදුලිය, ගෑස් සහ ජලය** | **9.2** | **4.4** | **2.7** | **1.7** | **2.4** | **2.4** |
| 5.1 විදුලිය | 9.6 | 4.3 | 2.5 | 1.4 | 2.2 | 2.1 |
| 5.2 ගෑස් | 5.7 | 5.1 | 0.1 | 0.1 | 0.2 | 0.2 |
| 5.3 ජලය | 6.1 | 7.1 | 0.1 | 0.1 | 0.1 | 0.1 |
| 6 **ඉදිකිරීම්** | **14.2** | **21.6** | **11.6** | **23.9** | **7.1** | **8.1** |
| **සේවා** | **8.6** | **4.6** | **61.9** | **42.9** | **59.5** | **58.5** |
| 7 **තොග සහ සිල්ලර වෙළෙඳාම** | **10.3** | **3.7** | **29.0** | **13.5** | **23.6** | **23.0** |
| 7.1 ආනයන වෙළෙඳාම | 14.3 | 1.0 | 14.0 | 1.4 | 8.5 | 8.1 |
| 7.2 අපනයන වෙළෙඳාම | 10.1 | 0.8 | 4.9 | 0.5 | 4.1 | 3.9 |
| 7.3 දේශීය වෙළෙඳාම | 7.5 | 6.8 | 10.1 | 11.7 | 11.0 | 11.1 |
| 8 **හෝටල් සහ ආපනශාලා** | **26.4** | **20.2** | **1.7** | **1.9** | **0.6** | **0.7** |
| 9 **ප්‍රවාහනය සහ සන්නිවේදනය** | **11.3** | **6.2** | **19.1** | **13.9** | **14.3** | **14.3** |
| 9.1 ප්‍රවාහනය | 11.3 | 6.0 | 15.6 | 11.0 | 11.8 | 11.7 |
| 9.2 භාණ්ඩ මෙහෙයවීම - වරාය සහ සිවිල් ගුවන් සේවා | 7.2 | 5.7 | 0.6 | 0.6 | 0.7 | 0.7 |
| 9.3 තැපැල් සහ විදුලි සංදේශ | 13.4 | 7.9 | 2.9 | 2.3 | 1.9 | 1.9 |
| 10 **බැංකු, රක්ෂණ සහ දේපළ වෙළෙඳාම් යනාදිය** | **7.9** | **6.7** | **8.5** | **9.3** | **8.8** | **8.9** |
| 11 **නිවාස අයිතිය** | **1.2** | **1.7** | **0.4** | **0.7** | **2.6** | **2.5** |
| 12 **රාජ්‍ය සේවා** | **1.2** | **1.4** | **1.2** | **1.6** | **7.1** | **6.8** |
| 13 **පෞද්ගලික සේවා** | **7.2** | **5.5** | **2.1** | **2.0** | **2.3** | **2.3** |
| **දළ දේශීය නිෂ්පාදිතය** | **8.2** | **6.4** | **100.0** | **100.0** | **100.0** | **100.0** |
| විදේශීය ශුද්ධ සාධක ආදායම | 4.3 | - 89.2 | | | | |
| **දළ ජාතික නිෂ්පාදිතය** | **8.4** | **5.5** | | | | |


(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

වාර්තා කළ ද යල කන්නයේ වී නිෂ්පාදනයට අයහපත් කාලගුණ තත්ත්වය බලපෑ අතර, බොහෝ අපනයන කෘෂිකාර්මික බෝගවලින් ලද දායකත්වය ද මෙම වසර තුළ දී පහළ මට්ටමක පැවතිණි. අනෙකුත් ආහාර බෝග මෙන්ම ධීවර සහ පශු සම්පත් යන ක්ෂේත්‍ර තුළ යහපත් ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කරන ලදී.

ඉල්ලුම් අංශයේ ඇස්තමේන්තුවලට අනුව, 2012 වසර තුළ වාර්තා වූ අඩු ආර්ථික වර්ධනයට ප්‍රධාන ලෙස දේශීය පරිභෝජනයෙහි අඩු වර්ධනය හේතු විය. 2011 වසර තුළ මූර්ත වශයෙන් ඉහළ වර්ධනයක් වාර්තා කළ පරිභෝජන වියදමෙහි වර්ධන වේගය ද 2012 වසර තුළ දී පහළ ගිය අතර මෙය දේශීය නිෂ්පාදනය සහ භාණ්ඩ

**2.1 රූප සටහන** **වාර්ෂික වර්ධන අනුපාතිකය**




ආනයනය මන්දගාමී වීම තුළින්ද පිළිඹිබු වේ. එසේම, ආයෝජන වියදම 2011 වසරට වඩා මූර්ත වශයෙන් අඩු වර්ධන වේගයක් පෙන්නුම් කළත් මෙම වසර තුළ ද අඛණ්ඩව වර්ධනය වූ අතර, මෙය අනාගත වර්ධන ප්‍රවණතා කෙරෙහි සුබවාදී ලෙස ඉවහල් වනු ඇතැයි සැළකිය හැකිය. ආනයනය මූර්ත වශයෙන් සැලකිය යුතු ලෙස මන්දගාමී වීම මගින් දේශීය ඉල්ලුමේ පහළ යාම පිළිබිඹු විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස ශුද්ධ විදේශීය ඉල්ලුමෙහි පුළුල් වීම 2012 වසරේ දී පැහැදිලිවම මන්දගාමී වනු දක්නට ලැබුණු අතර, එමගින් සාර්ව ආර්ථික ස්ථායිතාවයට ඇති කළ සෘණාත්මක බලපෑම ද පහත වැටුණි.

**දළ ජාතික නිෂ්පාදිතය (ද.ජා.නි.) හෙවත් විදේශීය ශුද්ධ සාධක ආදායමට (වි.ශු.සා.ආ.) ගලපන ලද දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.), 2012 වසර තුළ සමස්ත ද.දේ.නි. හි වර්ධනයට වඩා අඩු වේගයකින් වර්ධනය විය.** පොලී ගෙවුම් ඉහළ යාම සහ මෙරට මෙහෙයුම් කටයුතු සිදු කරන විදේශ ආයතනයන් සිය ලාභ ආපසු මව් රටවල් කරා යොමු කිරීම් ඉහළ යාම මගින් වසර තුළ ආදායම් ගිණුමේ ගෙවීම් වඩා වැඩි වේගයකින් වර්ධනය වීම මෙමගින් පිළිබිඹු වේ. මේ අතරතුර විදේශ වෙළෙඳපොළෙහි පැවති අඩු පොලී අනුපාත හේතුවෙන් වසර තුළ ආදායම් ගිණුමේ ලැබීම්වල පහළ යාමක් සිදු විණි.

**2012 වසරේ දී ඒක පුද්ගල ආදායම 2011 වසරේ දී පැවති රුපියල් 313,576 ක අගයේ සිට රුපියල් 373,001 දක්වා වැඩි වී ඇත.** වසර තුළ දී නාමික ද.දේ.නි. හි සිදුවූ වර්ධනය මෙසේ ඒක පුද්ගල ආදායම වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. ආදායමෙහි ඉහළ යාම, රජයේ සහ විධිමත් පෞද්ගලික අංශයේ වැටුප්වල වර්ධනය මගින් ද පිළිබිඹු වේ. කෙසේ වෙතත්, එ.ජ. ඩොලර් අගයෙන් සලකන විට මෑත කාලීන වසරවලදී වැඩි වේගයකින් වර්ධනය වූ ඒක පුද්ගල ආදායම 2012 වසරේ දී අඩු වේගයකින් වර්ධනය විය. විනිමය අනුපාතික නිර්ණය කිරීම සඳහා වඩාත් නම්‍යශීලී පිළිවෙතක් අනුගමනය කිරීම හේතුවෙන් එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි අගය සැලකිය යුතු ලෙස අවප්‍රමාණ වීම මෙයට ප්‍රධාන ලෙස බලපෑවේය.

**පවත්නා වෙළෙඳපොළ මිල අනුව සලකන විට 2012 වසරේ දී ද.දේ.නි. හි වර්ධනය 2011 වසරට සාපේක්ෂව ආන්තික වශයෙන් අඩු වේගයකින් වර්ධනය විය.** මෙම මන්දගාමී වර්ධනය මූර්ත ආර්ථික වර්ධනයෙහි පසුබෑම සහ 2012 වසරේ ද.දේ.නි. අවධමනකයෙහි වර්ධනය ඉහළ මට්ටමක පැවතීමෙහි ඒකාබද්ධ ප්‍රතිඵලයක් විය. සමස්ත ආර්ථික ක්‍රියාවලියම නියෝජනය කරනු ලබන ගම්‍ය මිල දර්ශකයක් වන ද.දේ.නි. අවධමනකය, කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි සංචලන ප්‍රවණතාවට අනුගාමීව වෙනස් විය. මේ අතර, දේශීය ආර්ථිකයේ අගය රුපියල් බිලියන 7,582 ක් දක්වා වර්ධනය වූ අතර, එය එ.ජ. ඩොලර් බිලියන 59 කට අනුරූප වටිනාකමකි.

**2011 වසරේ දී සංකෝචනය වූ දේශීය ඉතුරුම් මෙම වසර තුළ දී යථාතත්ත්වයට පත්වෙමින් සියයට 27.6 කින් වර්ධනය විය.** ඒ අනුව, ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස දේශීය ඉතුරුම් 2012 වසරේ දී සියයට 17.0 ක් ලෙස වාර්තා විය. විශේෂයෙන්ම ආනයනික භාණ්ඩ ඇතුළුව සමස්ත පරිභෝජන වියදමෙහි වූ අඩු වර්ධන වේගය ඉතුරුම්වල මෙම දියුණුව සඳහා ඉවහල් විය. එසේම, දේශීය ඉතුරුම්වල වර්ධනය මැඩ පැවැත්වීම සඳහා තරමක් දුරට රාජ්‍ය අංශයේ නිර්-ඉතුරුම්වල ඉහළ යාම හේතු විය. මෙම තත්ත්වය 2012 වසරේ දී රාජ්‍ය ආදායමෙහි වූ වර්ධනය මන්දගාමී වීමේ ප්‍රතිඵලයක් වූ අතර, ජංගම ගිණුමෙහි හිඟය පුළුල් කිරීමට ද හේතු විය. මේ අතර, විදේශීය ශුද්ධ සාධක ආදායමෙහි වූ පිරිහීම මෙම වසර තුළ ජාතික ඉතුරුම් කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇති කළ නමුදු පෞද්ගලික අංශයෙහි වර්තන සංක්‍රාමවල නොකඩවා සිදු වූ පුළුල්වීම ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස ජාතික ඉතුරුම් සියයට 24.0 දක්වා වර්ධනය වීමට හේතු විය. මේ හේතුවෙන් ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස ආයෝජන සියයට 30.6 දක්වා ඉහළ ගිය ද ජාතික ඉතුරුම් හා ආයෝජනවල වෙනස හෙවත් සම්පත් පරතරය ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස වසර තුළ දී පහළ ගියේය.

## 2.2 ආංශික නිමැවුම, ප්‍රතිපත්ති, ආයතනික පහසුකම් සහ ගැටළු

### කෘෂිකාර්මික අංශය

බාධක මධ්‍යයේ වුව ද, 2012 වසරේ දී **සමස්තයක් ලෙස කෘෂිකාර්මික අංශය 2011 වසරට සාපේක්ෂව ඉහළ වේගයකින් වර්ධනය විය.** හිතකර කාලගුණික තත්ත්වයන් යටතේ වසරේ ප්‍රථම භාගය තුළ මහ කන්නයේ දී සරුසාර අස්වැන්නක් ලැබුණි. කෙසේ වෙතත් වසරේ දෙවන භාගය තුළ දී නියඟය සහ ජලගැලීම් වැනි ස්වභාවික ආපදාවන් හේතුකොට ගෙන සාමාන්‍ය කෘෂිකාර්මික කටයුතු කෙරෙහි බාධා එල්ල විණි. මෙවැනි කාලගුණික තත්ත්වයන් යටතේ වුවද කෘෂිකාර්මික අංශය, 2011 වසරේ දී වාර්තා වූ සියයට 1.4 ක අඩු වර්ධන වේගයට සාපේක්ෂව සියයට 5.8 කින් වර්ධනය විය. තේ, රබර් සහ සුළු අපනයන බෝග උප අංශයන් හැරුණු විට අනෙකුත් සියලුම උප අංශයන් මෙම වර්ධනයට දායක විය. හතර වන කාර්තුවේ දී සුළු වශයෙන් සංකෝචනය වූ පොල් නිෂ්පාදනය සමස්තයක් ලෙස වසර තුළ දී වැඩි වූ අතර එය කෘෂිකාර්මික අංශයේ වර්ධනයට දායක විය. යල කන්නයේ සැලකිය යුතු ලෙස වී නිෂ්පාදනය පසුබෑමකට ලක් වුවද 2011 වසරේ දී වාර්තා වූ සියයට 8.4 ක සංකෝචනයට සාපේක්ෂව වී උප අංශය සියයට 1.3 ක වේගයකින් වර්ධනය විය. මෙම වසර තුළ දී පශු සම්පත්, අනෙකුත් ආහාර බෝග, වතු සංවර්ධන, දැව සහ වන සම්පත් සහ අනෙකුත් කෘෂිකාර්මික බෝග උප අංශයන් කෘෂිකාර්මික අංශයේ වර්ධනයට දායක විය. ධීවර කර්මාන්ත උප අංශය ද සියයට 9.3 ක අනුපාතයකින් කෘෂිකාර්මික අංශයේ වර්ධනයට දායකත්වය සපයන ලදී. විශේෂයෙන්ම වසරේ පළමු අර්ධය තුළ දී පැවතුණු යහපත් කාලගුණික තත්ත්වයත්, ධීවර යාත්‍රා සංඛ්‍යාව ඉහළ යාම සහ වැඩි අස්වැන්නක් සඳහා ධීවරයින් උනන්දු කරවන ඉහළ මිල ගණන් පැවතීම යන කරුණු මෙම වර්ධනයට හේතු වශයෙන් දැක්විය හැකිය. ඉහත සියලු සාධකයන්ගේ ප්‍රතිඵලයක් ලෙස කෘෂිකාර්මික අංශයෙන් ද.දේ.නි. යට 2011 වසරේ දී ලබාදුන් සියයට 11.2 ක දායකත්වයට සාපේක්ෂව 2012 වසරේ දී සියයට 11.1 ක දායකත්වයක් සපයන ලදී.

### අපනයන කෘෂිකර්මය

**2012 වසරේ දී පැවති අහිතකර කාලගුණික තත්ත්වයන් හේතුවෙන් තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 326.3 ක් දක්වා සියයට 0.4 කින් සුළු වශයෙන් පහළ යන ලදී.** වසරේ පළමු භාගය තුළ සියලුම තේ වගාකරන ප්‍රදේශ තුළ පැවති වියළි කාලගුණික තත්ත්වය හා වසර අග භාගයේ දී උස් බිම් තේ ප්‍රදේශවල පැවති සාමාන්‍යයෙන් නොපවතින ශීත

**2.2 සංඛ්‍යා සටහන**

**කෘෂිකර්මාන්ත නිෂ්පාදන දර්ශක (2007-2010=100) (අ)**

| අයිතමය | 2011 (ආ) | 2012 (ඇ) | වර්ධන වේගය (%) 2011/12 |
|---|---|---|---|
| කෘෂිකාර්මික සහ මත්ස්‍ය | 111.2 | 116.3 | 4.6 |
| 1. කෘෂිකර්මය | 106.6 | 110.1 | 3.3 |
| 1.1 කෘෂිකාර්මික බෝග | 106.8 | 109.2 | 2.3 |
| තේ | 105.1 | 104.7 | -0.4 |
| රබර් | 117.9 | 113.3 | -3.9 |
| පොල් | 99.1 | 103.8 | 4.7 |
| වී | 104.1 | 102.8 | -1.2 |
| අනෙකුත් බෝග | 110.6 | 119.3 | 7.9 |
| 1.2 පශු සම්පත් | 105.0 | 116.7 | 11.1 |
| 2. මත්ස්‍ය | 133.3 | 145.7 | 9.3 |

(අ) නිෂ්පාදන දර්ශකය ගණනය කිරීමේදී පදනම් අගයන් ලෙස භාවිත කළ 1997 2000 කාලපරිච්ඡේදය තුළ සාමාන්‍ය අගයන් වෙනුවට මෙම වසර තුළදී 2007-2010 කාලපරිච්ඡේදය තුළ සාමාන්‍ය අගයන් පදනම් අගයන් ලෙස භාවිත කර ඇත.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

කාලගුණය තේ නිෂ්පාදනය කෙරෙහි බලපාන ලදී. තේ නිෂ්පාදනයේ පහළ යාම ප්‍රධාන වශයෙන් පිළිබිඹු වූයේ උස් බිම් තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 72.7 ක් දක්වා සියයට 7 කින් පහළ යාමත් මැදි බිම් තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 52.3 ක් දක්වා සියයට 0.5 කින් සුළු වශයෙන් පහළ යාමත් මගිනි. එසේ වුවත්, පහත් බිම් තේ නිෂ්පාදනය 2011 ට සාපේක්ෂව කිලෝග්‍රෑම් මිලියන 201.2 ක් දක්වා සියයට 2 ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. සමස්ත තේ නිෂ්පාදනය තුළ සියයට 71.4 ක ඉහළ ම දායකත්වයක් සපයන කුඩා තේ වතු හිමි අංශයේ තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 233 ක් දක්වා සියයට 2.7 කින් වර්ධනය විය. මේ අතර ප්‍රධාන වශයෙන් උස් හා මැදි බිම්වලින් සමන්විත වතු සමාගම් අංශයේ තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 93.2 ක් දක්වා සියයට 7.4 කින් පහළ ගියේය. 2012 වසරේ තේ නිෂ්පාදිතයේ ප්‍රභේදයන් සලකා බැලීමේ දී සම්ප්‍රදායික කළු තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 300.1 ක් දක්වා සියයට 0.6 කින් පහළ ගිය අතර, කැඩුණු, ඉරුණු හා එතුණු (CTC) තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 23.2 ක් දක්වා සියයට 2.65 කින් ඉහළ ගියේය. මේ අතර අගය එකතු කළ තේ (කාබනික සහ ක්ෂණික තේ) නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 2.6 ක් දක්වා සියයට 16 කින් පහත වැටුණි.

**කොළඹ තේ වෙන්දේසියේ (CTA) තේ මිල ගණන් වසර තුළ ඉහළ මට්ටමක පැවතුණි.** උස්, මැදි සහ පහත් බිම් තේ වල සාමාන්‍ය මිල ගණන් පෙර වසරට සාපේක්ෂව සියයට 13.6 ක් සියයට 9.5 ක් සහ

**2.3 සංඛ්‍යා සටහන** **ප්‍රධාන කෘෂි බෝගවල උපනතීන්**

| අයිතමය | ඒකකය | 2011 (අ) | 2012 (ආ) |
|---|---|---|---|
| 1. තේ | | | |
| 1.1 නිෂ්පාදනය (ඇ) | කි.ග්‍රෑ. මිලියන | 327.5 | 326.3 |
| 1.2 මුළු වගා බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 222 | 222 |
| 1.3 දළු කැඩීම සිදුකරන ලද බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 186 | 184 |
| 1.4 නිෂ්පාදන පිරිවැය (ඈ) | රුපියල්/කි.ග්‍රෑ. | 355.02 | 391.39 |
| 1.5 සාමාන්‍ය මිල | | | |
| - කොළඹ වෙන්දේසිය | රුපියල්/කි.ග්‍රෑ. | 360.68 | 392.4 |
| - අපනයන (නැ.වි.ස.) | රුපියල්/කි.ග්‍රෑ. | 510.41 | 563.94 |
| 1.6 නැවත වගා කිරීම | හෙක්ටයාර | 1,209 | 1,288 |
| 1.7 අළුතින් වගා කිරීම | හෙක්ටයාර | 31 | 280 |
| 1.8 එකතු කළ අගය ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් (ඉ) | | 1.3 | 1.3 |
| 2. රබර් | | | |
| 2.1 නිෂ්පාදනය | කි.ග්‍රෑ. මිලියන | 158.2 | 152.0 |
| 2.2 මුළු වගා බිම් ප්‍රමාණය (ඊ) | හෙක්ටයාර දහස් | 129 | 131 |
| 2.3 කිරි කපන ලද බිම් ප්‍රමාණය (ඊ) | හෙක්ටයාර දහස් | 101 | 104 |
| 2.4 නිෂ්පාදන පිරිවැය | රුපියල්/කි.ග්‍රෑ. | 129.56 | 136.00 |
| 2.5 සාමාන්‍ය මිල | | | |
| - කොළඹ වෙන්දේසිය (ආර්.එස්.එස්.නො.1) | රුපියල්/කි.ග්‍රෑ. | 508.80 | 416.47 |
| - අපනයන (නැ.වි.ස.) | රුපියල්/කි.ග්‍රෑ. | 535.40 | 420.74 |
| 2.6 නැවත වගා කිරීම (උ) | හෙක්ටයාර | 3,050 | 2,161 |
| 2.7 අළුතින් වගා කිරීම (උ) | හෙක්ටයාර | 3,004 | 2,449 |
| 2.8 එකතු කළ අගය ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් (ඉ) | | 1.2 | 0.9 |
| 3. පොල් | | | |
| 3.1 නිෂ්පාදනය | ගෙඩි මිලියන | 2,808 | 2,940 |
| 3.2 මුළු වගා බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 395 | 395 |
| 3.3 නිෂ්පාදන පිරිවැය | ගෙඩියකට රුපියල් | 10.27 | 11.63 |
| 3.4 සාමාන්‍ය මිල | | | |
| - නිෂ්පාදන මිල | ගෙඩියක් රුපියල් | 28.98 | 22.90 |
| - අපනයන (නැ.වි.ස.) (ඌ) | ගෙඩියක් රුපියල් | 39.15 | 28.80 |
| 3.5 නැවත වගා කිරීම/ යටි වගාව (එ) | හෙක්ටයාර | 1,517 | 4,774 |
| 3.6 අළුතින් වගා කිරීම (එ) | හෙක්ටයාර | 1,553 | 4,814 |
| 3.7 එකතු කළ අගය ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් (ඉ) | | 1.4 | 1.1 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) හරිත තේ ඇතුළුව
(ඈ) අමු තේ දළු සැපයුම්කරුවන්ගේ ලාභාංශද ඇතුළත් වේ.
(ඉ) වගා කිරීම සහ සැකසුම් කටයුතු සිදු කළ ප්‍රමාණය පමණි.
(ඊ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2003 දී පවත්වන ලද කෘෂිකර්ම සංගණනය මත පදනම්ව රබර් වගාව යටතේ ඇති බිම් ප්‍රමාණය සංශෝධනය කර ඇත.
(උ) රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ වගා සහන යෝජනා ක්‍රමය අනුව වගා කළ බිම් ප්‍රමාණය
(ඌ) ප්‍රධාන පොල් මද නිෂ්පාදන තුන සඳහා පමණි.
(එ) පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් දෙනු ලබන වගා සහනාධාර ක්‍රමය යටතට අයත් ඉඩම් ආවරණය වේ.

මූලයන් : ශ්‍රී ලංකා තේ මණ්ඩලය
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
පොල් වගා කිරීමේ මණ්ඩලය
පොල් සංවර්ධන අධිකාරිය
පොල් සංවර්ධන සහ ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය
වැවිලි සමාගම්
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

සියයට 7 බැගින් පිළිවෙළින් කිලෝග්‍රෑමයකට රුපියල් 379 ක්, රුපියල් 352 ක් සහ රුපියල් 408 ක් දක්වා ඉහළ ගියේය. මේ නිසා, 2011 වසරේ දී කොළඹ තේ වෙන්දේසියේ සියලුම තේ වර්ග සඳහා වාර්ෂික සාමාන්‍ය මිල කිලෝග්‍රෑමයකට රුපියල් 359.89 ක් වූ අතර 2012 වසරේ දී එය කිලෝග්‍රෑමයකට රුපියල් 391.64 ක් දක්වා ඉහළ යන ලදී. වසරේ දෙවන කාර්තුවේ සිට කොළඹ තේ වෙන්දේසියේ මිල ගණන් ඉහළ යාමට වැඩි වශයෙන් දායක වූයේ ගෝලීය කළු තේ සැපයුමේ පැවති හිඟයයි. එසේ වුවත්, 2011 වසරේ දී තේ වල සාමාන්‍ය අපනයන මිල ගණන් කිලෝග්‍රෑමයකට එ.ජ.ඩොලර් 4.62 සිට 2012 වසරේ දී කිලෝග්‍රෑමයකට එ.ජ.ඩොලර් 4.41 ක් දක්වා පහත වැටුණි.

**පෙර වසරට සාපේක්ෂව 2012 වසරේ දී රබර් නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 152 ක් දක්වා සියයට 3.9 කින් පහත වැටුණි.** අධික වර්ෂාපතනය නිසා කිරි කපන දින ගණන් අඩුවීම සහ 2011 වසරේ මෙතෙක් ස්වාභාවික රබර් සඳහා පැවති ඉහළම මිල 2012 වසරේ දී පහළ යාම නිෂ්පාදනය අඩුවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබේ. සමස්ත රබර් නිෂ්පාදනයට ප්‍රධාන දායකත්වයක් සපයන ෂීට් රබර් සහ ලේටෙක්ස් රබර් නිෂ්පාදන පිළිවෙළින්, සියයට 2.4 කින් හා සියයට 39 කින් කිලෝග්‍රෑම් මිලියන 59.2 ක් හා කිලෝග්‍රෑම් මිලියන 36.6 ක් දක්වා පහත වැටුණි. පහළ ගිය රබර් මිල ගණන් කුඩා වතු හිමියන්ට වඩා හොඳ කෘෂි භාවිතයන් පවත්වා ගෙන යාම කෙරෙහි අහිතකර ලෙස බලපාන ලදී. මේ හේතුවෙන් වගාව සඳහා පොහොර සහන වැඩපිළිවෙළ ක්‍රියාත්මක වුවද, නිෂ්පාදන ඵලදායීතාවය අඩු විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, 2012 වසරේ රබර් ඵලදාව 2011 වසරේ පැවති හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 1,566 සිට හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 1,459 ක් දක්වා අඩු විය. මේ අතර, මූලික වශයෙන් ලේටෙක්ස් රබර් ප්‍රධාන අමුද්‍රව්‍යයක් ලෙස භාවිතයට ගනිමින් ඉහළ මිලක් සහිත භාණ්ඩ, අපනයන වෙළෙඳපොළ සඳහා නිපදවනු ලබන නිෂ්පාදන කර්මාන්තයන්ගේ ඉල්ලුමේ ඇති වූ පහළ යාම 2012 වසර තුළ දී දේශීය ස්වාභාවික රබර් පරිභෝජනය කිලෝග්‍රෑම් මිලියන 110.04 ක් දක්වා සියයට 1.5 කින් අඩු වීමට හේතු විය.

**2011 වසරේ වාර්තා වූ ඉහළම රබර් මිල ගණන්වලට සාපේක්ෂව 2012 වසරේ විවිධ රබර් වර්ගවල සාමාන්‍ය මිල ගණන්වල අඩුවීමක් දක්නට ලැබිණි.** නැගෙනහිර ආසියාවේ ප්‍රධාන ටයර් නිෂ්පාදන වෙළෙඳපොළවල්වල ඉල්ලුමේ පහළ යාම සමඟ අනෙකුත් ස්වාභාවික රබර් නිෂ්පාදනය කරන රටවල්වල රබර් නිෂ්පාදනයෙහි සිදු වූ වර්ධනය හා ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ අතිරික්ත රබර් තොග පැවතීම නිසා ස්වභාවික රබර් මිල ගණන් පහළ යන ලදී. 2012 වසරේ දී දුම් ගැසූ

දාර රබර් 1 (ආර්.එස්.එස්.1) සහ ලේටෙක්ස් ක්‍රේප් IX යන දෙවර්ගයෙහිම සාමාන්‍ය මිල ගණන් කොළඹ රබර් වෙන්දේසියේ 2011 වසරට සාපේක්ෂව පිළිවෙළින් කිලෝග්‍රෑමයකට රුපියල් 417 ක් හා කිලෝග්‍රෑමයකට රුපියල් 411 ක් දක්වා සියයට 19 කින් හා සියයට 29 කින් පහත වැටුණි. මෙම කාලසීමාව තුළ දී ආර්.එස්.එස්.1 සහ ලේටෙක්ස් ක්‍රේප් IX හි අපනයන මිල ද පිළිවෙළින්, කිලෝ ග්‍රෑමයකට රුපියල් 447 ක් සහ රුපියල් 407 ක් දක්වා සියයට 24 කින් සහ සියයට 23 කින් පහත වැටුණි.

**වසර 2001 න් පසු ඉහළම පොල් නිෂ්පාදනය 2012 වසරේ දී වාර්තා විය.** 2012 වසරේ නිෂ්පාදනය පොල් ගෙඩි මිලියන 2,940 ක් දක්වා සියයට 4.7 කින් වර්ධනය වූ අතර මේ සඳහා ජාතික පොල් නිෂ්පාදනයට ඉහළම දායකත්වය සපයන ගම්පහ, කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්ක ඇතුළත් පොල් ත්‍රිකෝණය තුළ පසුගිය වසරේ පැවති හිතකර කාලගුණික තත්ත්වයේ පසු බලපෑම ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, පොහොර භාවිතයේ වැඩි දියුණුව සහ පාංශු ජල සංරක්ෂණ ක්‍රම ආදී මනා කළමනාකරණ ක්‍රම වගාකරුවන් විසින් අනුගමනය කිරීම ද ඉහළ නිෂ්පාදනයක් ලබාගැනීමට දායක විය.

**කපාපු පොල් හැරුණු විට, සියලුම පොල් මද නිෂ්පාදන වසර තුළ දී වැඩි වර්ධනයක් වාර්තා කරන ලදී.** 2012 වසරේ පොල් තෙල් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 81,862 (පොල් ගෙඩි මිලියන 649.2) ක් දක්වා සියයට 46.2 කින් වර්ධනය වීමට පොල් නිෂ්පාදනයේ වර්ධනය හා වසර තුළ පාම් තෙල් ආනයන මත බදු ඉහළ දැමීම බලපා තිබේ. දේශීය පොල් තෙල් නිෂ්පාදනය ධෛර්යමත් කිරීම සඳහා ආහාරමය තෙල් ආනයන මත විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද (SCL) 2012 වසරේ මැයි මස දී හඳුන්වා දුන් අතර, 2012 නොවැම්බර් මස දී එය තවදුරටත් ඉහළ දමන ලදී. එම නිසා, 2011 වසරේ මෙට්‍රික් ටොන් 135,340 ක් වූ පාම් තෙල් (පාම් මද තෙල් හා පිරිසිදු නොකළ පාම් තෙල්) ආනයනය 2012 වසරේ දී මෙට්‍රික් ටොන් 63,723 ක් දක්වා සැලකිය යුතු ලෙස පහත වැටුණි. එසේ වුවත්, පැවති අඩු අපනයන ඉල්ලුම හේතුවෙන් කපාපු පොල් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 41,645 ක් දක්වා (පොල් ගෙඩි මිලියන 324.8) සියයට 12.7 කින් පහත වැටුණි. ඒ අනුව, 2012 දී කපාපු පොල් අපනයනය ද මෙට්‍රික් ටොන් 41,776 ක් දක්වා සියයට 8.9 කින් පහත වැටුණි. මේ අතර, ප්‍රධාන වශයෙන් අපනයන වෙළෙඳපොළ සඳහා නිපදවන පොල් ක්‍රීම්, පොල් කිරි සහ පිටි කළ පොල් කිරි ඇතුළු අගය එකතු කළ කර්මාන්තවල වර්ධනය සඳහා වසර තුළ පොල් නිෂ්පාදනයේ සිදු වූ ඉහළ යාම උපකාරී විය.

**2012 වසරේ දී, කොළඹ පොල් වෙන්දේසියේ පොල් මිල ගණන් 2011 වසරට සාපේක්ෂව පහළ යාම සඳහා පොල් සැපයුමේ වර්ධනය හේතුවිය.** 2011 වසරේ කොළඹ පොල් වෙන්දේසියේ පොල් ගෙඩියක සාමාන්‍ය මිල රුපියල් 34.70 ක් වූ අතර 2012 වසරේ දී එය රුපියල් 27.80 ක් දක්වා පහත වැටුණි. මේ අතර, වසර තුළ දී පොල් ගෙඩියක සාමාන්‍ය සිල්ලර මිල රුපියල් 32.40 ත් රුපියල් 38.20 ත් අතර පරාසයක පැවතිණි. කොළඹ පොල් වෙන්දේසියේ පොල් තෙල් හා කපාපු පොල් ආදී අනෙකුත් පොල් නිෂ්පාදනවල ද මිල ගණන් පහත වැටීමක් දක්නට ලැබුණි.


**2012 වසරේ, අනෙකුත් අපනයන කෘෂි බෝග අංශය මිශ්‍ර ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කළේය.** කුරුඳු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 17,165 ක් දක්වා සියයට 5.9 කින් පහත වැටුණි. පොහොර සහන වැඩපිළිවෙළ ක්‍රියාත්මක වීම, පසුගිය වසර ගණනාවක් පුරා සිදු කළ නව කුරුඳු වගාවන් පරිණත වීම, ශ්‍රී ලංකාවේ කුරුඳු පොතු නිෂ්පාදන සඳහා සතුටුදායක අපනයන ඉල්ලුමක් පැවතීම වැනි කුරුඳු වගාවට හිතකර තත්ත්වයන් මධ්‍යයේ වුවද, 2012 වසර තුළ ප්‍රධාන කුරුඳු වගා කරන ප්‍රදේශවල පැවති වියළි කාලගුණික තත්ත්වය හේතුවෙන් අපේක්ෂිත මට්ටමේ ඉහළ කුරුඳු අස්වැන්නක් ලබාගැනීමට නොහැකි විය. 2012 වසරේ ගම්මිරිස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 18,604 ක් දක්වා සියයට 72 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. ප්‍රධාන ගම්මිරිස් වගා කරන ප්‍රදේශවල මල් සහ ඵල හට ගන්නා කාලයන් තුළ සතුටුදායක කාලගුණ තත්ත්වයක් පැවතීම හා නව වගාවන්හි පරිනත බිම් ප්‍රමාණයේ වර්ධනය මේ සඳහා බලපා තිබේ. ඒ අනුව, වසර පුරා පැවති සතුටුදායක මිල ගණන්වල ආධාරය සහිතව ගම්මිරිස් අපනයනය මෙට්‍රික් ටොන් 10,532 ක් දක්වා සියයට 108 කින් පමණ ඉහළ ගියේය. හෝටල් සහ සංචාරක ක්ෂේත්‍රය තුළින් මතුවෙමින් පවත්නා ඉහළ ඉල්ලුම කජු නිෂ්පාදනය ඉහළ යාම කෙරෙහි බලපා තිබේ. 2012 වසරේ දේශීය කජු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 2,000 ක් දක්වා සියයට 67 කින් වර්ධනය වූ අතර ඉහළ යන දේශීය ඉල්ලුම පිළිබිඹු කරමින් කජු අපනයනය මෙට්‍රික් ටොන් 145.8 ක් දක්වා සියයට 53 කින් පමණ පහත වැටුණි. ගැටුම් නිමා වීමත් සමඟ උතුරු පළාතේ බොහෝ වගාබිම් මගින් කජු කර්මාන්තයට දායකත්වයක් ලබාදීමත් සමඟ කජු වගාව යටතේ පවතින බිම් ප්‍රමාණය සැලකිය යුතු ලෙස ඉහළ යමින් පවතී. 2012 වසරේ කරාබු නැටි නිෂ්පාදනය පෙර වසර පරිදිම අඩු වීමට බලපෑවේ කරාබු නැටිවල චක්‍රීය අස්වනු රටාවයි. (මෙම සුළු අපනයන බෝගවල නිෂ්පාදන හා වගා බිම් ප්‍රමාණයන් පිළිබඳ තොරතුරු සංඛ්‍යා ලේඛන පරිශිෂ්ටය වගු අංක 14 හි දැක්වේ.)

### දේශීය කෘෂිකර්මය

**2011/12 මහ කන්නයේ වී නිෂ්පාදනයේ ඉහළ යාම සහ 2012 යල කන්නයේ වී නිෂ්පාදනය පහළයාමේ ඒකාබද්ධ ප්‍රතිඵලය වූයේ, 2012 වසරේ සමස්ත වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 3.84 ක් දක්වා සියයට 1.2 කින් ආන්තික වශයෙන් අඩු වීමයි.** 2011/12 මහ කන්නයේ වී නිෂ්පාදනය, 2010/11 මහ කන්නය හා සසඳන කල අපේක්ෂිත මට්ටමටත් වඩා යථා තත්ත්වයට පත්වෙමින් මෙට්‍රික් ටොන් මිලියන 2.72 ක් දක්වා සියයට 36 ක ඉහළ වර්ධනයක් වාර්තා කළේය. වී නිෂ්පාදනයේ මෙම ඉහළ වර්ධනය සඳහා මහ කන්නය පුරා පැවති යහපත් කාලගුණික තත්ත්වයන් සහ කුඩා හා මහා පරිමාණ වාරි සම්පාදනයේ දායකත්වයත් ප්‍රධාන වශයෙන් හේතුවිය. 2011/12 මහ කන්නය තුළ දී වී නිෂ්පාදනයේ ඵලදාව, පසුගිය වසර පහක කාලපරිච්ඡේදය තුළ සාමාන්‍ය වී ඵලදාවට සාපේක්ෂව හෙක්ටයාරයකට වී කිලෝ ග්‍රෑම් 4,444 ක් දක්වා සියයට 5 කින් පමණ වර්ධනය විය. වයඹ පළාත තුළ වී වගා කළ බිම් ප්‍රමාණය එම පළාත තුළ සුළු වාරි ක්‍රමයන්හි පැවති සීමිත ජල සැපයුම හේතුවෙන් හෙක්ටයාර 23,522 කින් අඩු විය. මේ අතර, අස්වැන්න නෙලා ගන්නා බිම් ප්‍රමාණය සහ වී ඵලදාවේ ඉහළ යාම හේතුවෙන්, උතුරු පළාතේ වී නිෂ්පාදනය 2012 වසරේ දී මෙට්‍රික් ටොන් 259,936 දක්වා සියයට 24 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය.

**නිරිත දිග මෝසම් වර්ෂාවේ දීර්ඝ ප්‍රමාදය 2012 යල කන්නයේ වී නිෂ්පාදනය කෙරෙහි බලපාන ලදී.** මෙම කාල පරිච්ඡේදය තුළ පැවති වියළි කාලගුණික තත්ත්වයන්ගේ බලපෑම හේතුවෙන්, 2012 යල කන්නයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 1.13 ක් දක්වා සියයට 41 කින් අඩු විය. මෙය පසුගිය වසර පහක කාල පරිච්ඡේදය තුළ වගා කන්නයක වාර්තාගත අඩුම වී නිෂ්පාදනය වේ. සාමාන්‍ය ඍතුමය වර්ෂාපතන රටාවට සාපේක්ෂව, 2012 යල කන්නයේ පැවති අඩු සහ කෙටිකාලීන වර්ෂාපතනයෙහි ප්‍රතිඵලයක් ලෙස සුළු හා මහා පරිමාණ ජලාශයන්ගේ ජල මට්ටම ඉතා අඩු මට්ටමක පැවතුණි. වී වගා බිම් හෙක්ටයාර 35,800 ක් පමණ නියගයෙන් මුළුමනින්ම විනාශ වූ අතර නිෂ්පාදන ඵලදාව හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 4,145 ක් දක්වා සියයට 5 කින් අඩු විය. කෙසේ වෙතත්, 2012 වසරේ වී නිෂ්පාදනයට අනුරූපී සහල් නිෂ්පාදනය, රටේ වාර්ෂික සහල් පරිභෝජන අවශ්‍යතාවය ඉක්මවා ඇතැයි ඇස්තමේන්තු කර ඇත. 2013 අය වැය මගින් රජයේ වී මිල දී ගැනීමේ මිල ගණන්, නාඩු වී සඳහා කිලෝග්‍රෑමයක් රුපියල් 28 සිට රුපියල් 32 දක්වාත් සම්බා වී කිලෝග්‍රෑමයක් රුපියල් 30 සිට රුපියල් 35 දක්වාත් ඉහළ නැංවීය.

**2.2 රූප සටහන** **සහල්: සැපයුම සහ ඉල්ලුම**




**මහ කන්නයේ නිෂ්පාදනයෙහි වැඩිවීම සහ පැවති සීමිත ජල සැපයුම හේතුවෙන් යල කන්නය තුළ දී ගොවීන් අනෙකුත් ක්ෂේත්‍ර බෝග වගාවන්ට යොමු වීම 2012 වසර තුළ දී අනෙකුත් ක්ෂේත්‍ර බෝග බොහොමයක නිෂ්පාදනයේ වැඩිවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබේ.** ඉරිඟු, මුං ඇට, කව්පි, උඳු, රටකජු, අර්තාපල්, ලොකු ළූණු සහ අමුමිරිස් ඇතුළත් අනෙකුත් ක්ෂේත්‍ර බෝගවල සමස්ත නිෂ්පාදනය 2011 වසර හා සසඳන කල 2012 වසරේ දී මෙට්‍රික් ටොන් 935,180 ක් දක්වා සියයට 18.25 කින් වර්ධනය විය. (2012 වසරේ මහ කන්නයේ සහ යල කන්නයේ ක්ෂේත්‍ර බෝග වගා බිම් ප්‍රමාණය හා නිෂ්පාදනය පිළිබඳ තොරතුරු සංඛ්‍යා ලේඛන පරිශිෂ්ටය වගු අංක 18 හි දැක්වේ). දේශීය වෙළෙඳපොළ තුළ මෙම බෝග සඳහා ලාභදායී මිල ගණන් පැවතීම, බීජ නිෂ්පාදනය ඉහළ යාම සහ ඉහළ වෙළෙඳපොළ සැපයුම, උතුරු පළාත තුළ වගා කරන බිම් ප්‍රමාණය වැඩිවීම සහ පොහොර සහන වැඩසටහන හේතුවෙන් පොහොර භාවිතය ඉහළ යාම ද, ක්ෂේත්‍ර බෝග බහුතරයක නිෂ්පාදනය වර්ධනයට බලපා තිබේ. මෙම බෝග නිෂ්පාදනයන්ගේ වැඩිවීම අනුව යමින්, එම බෝග ආනයනය 2012 වසරේ දී අඩු විය. තවද, මෙම බෝගයන්ගේ දේශීය නිෂ්පාදනයන් ඉහළ නැංවීම සඳහා විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද වැඩිකිරීම තුළින් ආනයනයන් අධෛර්යමත් කිරීම සිදුවිය. ඒ අනුව, 2012 වසරේ දී, මුං ඇට, උඳු, ලොකු ළූණු, මිරිස්, රටකජු, අර්තාපල්, මෙනේරි සහ කුරක්කන් මත වූ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු ඉහළ දැමීය. 2012 වසරේ දී, ඉරිඟු, කව්පි සහ රටකජු යන බෝග, ඇස්තමේන්තුගත ජාතික ඉල්ලුමට වඩා රට තුළ නිෂ්පාදනය කර ඇති අතර, උඳු සහ රතු ළූණු යන බෝගවල දේශීය

**2.4 සංඛ්‍යා සටහන** — **වී වගා අංශය පිළිබඳ සංඛ්‍යා**

| අයිතමය | ඒකකය | 2011 (අ) | | | 2012 (ආ) | | |
|---|---|---|---|---|---|---|---|
| | | මහ | යල | එකතුව | මහ | යල | එකතුව |
| වපුරන ලද බිම් ප්‍රමාණය දළ වශයෙන් | හෙක්ටයාර දහස් | 730 | 493 | 1,223 | 702 | 365 | 1,067 |
| අස්වැන්න නෙලා ගන්නා ලද දළ බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 613 | 489 | 1,103 | 685 | 305 | 990 |
| අස්වැන්න නෙලා ගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 544 | 437 | 981 | 611 | 272 | 883 |
| නිෂ්පාදනය | මෙ.ටො.දහස් | 1,996 | 1,898 | 3,894 | 2,717 | 1,129 | 3,846 |
| | බුසල් දහස් | 95,655 | 90,965 | 186,620 | 130,212 | 54,107 | 184,319 |
| ඵලදාව (ඇ) | හෙක්ටයාරයට කි.ග්‍රෑ. | 3,668 | 4,347 | 3,970 | 4,444 | 4,145 | 4,353 |
| දෙන ලද ණය ප්‍රමාණය | රුපියල් මිලියන | 2,340 | 1,958 | 4,298 | 3,694 | 1,785 | 5,479 |
| සහල් ආනයනය | මෙ.ටො.දහස් | - | - | 28 | - | - | 36 |
| සහල් ආනයනයට සමාන වී ප්‍රමාණය | මෙ.ටො.දහස් | - | - | 40 | - | - | 52 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) අස්වනු කැපීමේ සමීක්ෂණයන්ගෙන් රැස්කළ දත්ත පදනම් කොට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද සංඛ්‍යා තොරතුරු උපයෝගී කරගෙන මහ සහ යල කන්න සඳහා වූ හෙක්ටයාරයක ඵලදාව ගණනය කර ඇත. මුළු නිෂ්පාදනය අස්වැන්න නෙලා ගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණයෙන් බෙදීමෙන් හෙක්ටයාරයක වාර්ෂික සාමාන්‍ය ඵලදාව ගණනය කෙරේ.

මූලයන් : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

නිෂ්පාදනය ජාතික ඉල්ලුමෙන් පිළිවෙළින් සියයට 87 ක් සහ සියයට 98 ක් සපුරාලීම සඳහා ප්‍රමාණවත් විය. මේ අතර, දේශීය ලොකු ළූණු නිෂ්පාදනය, ඇස්තමේන්තුගත ජාතික ඉල්ලුමෙන් සියයට 37 ක් පමණ සපුරාලීම සඳහා ප්‍රමාණවත් විය. අනෙකුත් ක්ෂේත්‍ර බෝග බහුතරයක සමස්ත දේශීය අවශ්‍යතාවය වසර 2015 වන විට රට තුළම නිෂ්පාදනය කිරීමටත් ජාතික ඉල්ලුම සපුරාලීමෙන් පසුව පවතින අතිරික්ත නිෂ්පාදනය අපනයනය කිරීමටත් රජය අපේක්ෂා කරයි.

**2011/12 මහ කන්නය තුළ දී ඵලවළු නිෂ්පාදනය ඉහළ ගිය අතර යල කන්නයේ දී නිෂ්පාදනයෙහි පහළයාමක් සිදු විය.** 2011/12 මහ කන්නයේ ඵලවළු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 587,975 ක් දක්වා සියයට 15 කින් වර්ධනය වූ අතර, නියඟයේ බලපෑම හේතුවෙන් යල කන්නයේ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 411,293 ක් දක්වා සියයට 7.8 කින් අඩු විය. මේ අනුව, 2012 වසරේ සමස්ත ඵලවළු නිෂ්පාදනය 2011 වසරට සාපේක්ෂව මෙට්‍රික් ටොන් 999,268 දක්වා සියයට 4.4 කින් වර්ධනය විය. සමස්ත ඵලවළු සැපයුමට නැගෙනහිර පළාතේ දායකත්වය 2011 වසරේ පැවති සියයට 4.3 සිට 2012 වසරේ දී සියයට 7.3 ක් දක්වා වර්ධනය වූ අතර වයඹ පළාතේ දායකත්වය ද, පෙර වසරේ පැවති සියයට 8.4 සිට සියයට 10 දක්වා ඉහළ ගියේය. මේ අනුව, ඇතැම් පළාත්වල ඵලවළු සැපයුමෙහි පුළුල්වීමක් දැකිය හැකි අතර එය අනාගත මිල මට්ටම් කෙරෙහි යහපත් බලපෑමක් ඇති කරනු ඇතැ'යි අපේක්ෂා කෙරේ. මේ අතර, වසර තුළ දී ඵලවළු නිෂ්පාදනයේ ඉහළ යාම කෙරෙහි පොහොර සහන වැඩසටහන සැලකිය යුතු ලෙස දායක වී ඇත.

**2012 වසරේ සමස්ත සීනි නිෂ්පාදනය සඳහා පැල්වත්ත, සෙවණගල සහ ගල්ඔය යන සීනි කර්මාන්ත ශාලා තුන දායක විය.** 2012 වසර තුළ දී සීනි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 35,658 දක්වා සියයට 2 කින් සුළු වශයෙන් වර්ධනය විය. 2012 වසරේ ජාතික සීනි නිෂ්පාදනය සඳහා පැල්වත්ත සීනි කර්මාන්ත ශාලාවේ දායකත්වය සියයට 64 ක් වන අතර, සෙවණගල සහ ගල්ඔය සීනි කර්මාන්ත ශාලා පිළිවෙළින් සියයට 27 ක් හා සියයට 9 ක් වශයෙන් දායක විය. වර්ෂා පෝෂක වගා භූමි සහිත පැල්වත්ත සීනි කර්මාන්ත ශාලාවේ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 22,712 ක් දක්වා සියයට 21 කින් අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ වගා ප්‍රදේශවල පැවති නියඟය නිසා වසර තුළ දී උක්දඬු සැපයුම සැලකිය යුතු ලෙස පහළ යාමයි. කෙසේ වෙතත්, සෙවනගල සීනි කර්මාන්ත ශාලාවේ සීනි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 9,631 දක්වා සියයට 60 කින් වර්ධනය වූ අතර, කලින් වී සහ කෙසෙල් වගා කළ බිම්වල උක් වගාකිරීම හේතුවෙන් උක් වගාබිම් ප්‍රමාණය ඉහළයාම සහ උක් ඵලදාව වර්ධනය වීම මෙයට බලපා තිබේ. උක්දඬුවල සාමාන්‍ය නිෂ්පාදන මිල මෙට්‍රික් ටොන් එකක් සඳහා රුපියල් 4,000 ක් දක්වා ඉහළ යාම ගොවීන් වෙනත් වගාවන් වෙතින් උක් වගාව වෙත යොමුවීමට බලපා තිබේ. පෙර හිඟුරාණ සීනි කර්මාන්ත ශාලාව ලෙස හැඳින් වූ ගල්ඔය වැවිලි සමාගම සිය වාණිජ මෙහෙයුම් 2012 වසරේ දී ආරම්භ කරන ලදී. 2012 වසරේ සීනි නිෂ්පාදනය සඳහා ඔවුන්ගේ දායකත්වය මෙට්‍රික් ටොන්

3,316 ක් වන අතර 2013 වන විට නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 13,200 ක් දක්වා ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ. ඉහළ ඵලදාවක් සහිත ප්‍රභේද වගා කිරීම, සුදුසු වාරිමාර්ග ක්‍රම, ක්ෂේත්‍ර නඩත්තුව, ගොවීන් සඳහා නියමිත වේලාවට යෙදවුම් ද්‍රව්‍ය සැපයීම වැනි යහපත් කෘෂිකාර්මික භාවිතයන් නව වගාවන් සඳහා යොදාගැනීමත් සමග ගල්ඔය වැවිලි සමාගමේ සාමාන්‍ය නිෂ්පාදන ඵලදාව හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 83 ක් වැනි ඉහළ මට්ටමක පැවතුණි. 2012 වසරේ දී, රටේ වාර්ෂික සීනි අවශ්‍යතාවයෙන් සියයට 6 ක ප්‍රමාණයක් සපුරාලීමට දේශීය සීනි නිෂ්පාදනය ප්‍රමාණවත් විය. 2020 වන විට දේශීය සීනි නිෂ්පාදනය සමස්ත දේශීය සීනි අවශ්‍යතාවයෙන් සියයට 40 ක් දක්වා වර්ධනය කිරීමට රජය බලාපොරොත්තු වේ.

## ධීවර

**වෙරළබඩ මුහුදු මත්ස්‍ය සහ මිරිදිය මත්ස්‍ය අංශයන්හි සැලකිය යුතු වර්ධනය හේතුවෙන් 2012 වසර තුළ සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 486,170 දක්වා සියයට 9.3 කින් වර්ධනය විය.** වෙරළබඩ මුහුදු මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 257,540 ක් දක්වා සියයට 15.8 කින් වර්ධනය වීම, සමස්ත මුහුදු මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 417,220 ක් දක්වා සියයට 8.3 කින් වර්ධනය වීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබේ. කෙසේ වෙතත්, ගැඹුරු මුහුදු මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 159,680 ක් දක්වා සියයට 2 කින් පහළ වැටුණි. 2012 පෙබරවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි ඉන්ධන මිල ඉහළ දැමීම සහ ඉහළ ගිය විදුලි ගාස්තුවල බලපෑම පිළිබිඹු කරමින් අයිස් මිල ගණන් ඉහළ යාම හේතුවෙන් බහුදින ධීවර යාත්‍රාවක එක් මුහුදු ගමනක් සඳහා වැය වන පිරිවැය ඉහළ යන ලදී. 2012 මාර්තු මස සිට ධීවර බෝට්ටු සඳහා රජය විසින් හඳුන්වා දුන් ඉන්ධන සහනාධාර වැඩසටහන මගින් මෙම ඉහළ ගිය පිරිවැය තරමක් දුරට ආවරණය වන ලදී. මෙම ක්‍රියාවලියත් සමඟ බහුදින ධීවර යාත්‍රාවක මුහුදු ගමනක යෙදෙන කාලය අඩු වූ අතර වෙරළබඩ මත්ස්‍ය නිෂ්පාදනය ධෛර්යමත් වීමත් සිදු විය. 2012 වසර තුළ දී, මුහුදු මත්ස්‍ය අංශයේ ඉහළම වර්ධනය උතුරු පළාතෙන් වාර්තා වී ඇති අතර, එම පළාතේ මුහුදු මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 59,340 ක් දක්වා සියයට 28 කින් වර්ධනය විය. එහි ප්‍රතිඵලයක් ලෙස සමස්ත මුහුදු මත්ස්‍ය නිෂ්පාදනය සඳහා උතුරු පළාතේ දායකත්වය සියයට 14 ක් දක්වා වැඩි විය. මේ සඳහා ඉහළම දායකත්වය සපයන ලද්දේ යාපනය දිස්ත්‍රික්කයෙනි. මේ අතර, 2012 වසර තුළ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 68,950 ක් දක්වා සියයට 16 කින් වර්ධනය විය. ප්‍රජා පාදක මසුන් බෝ කිරීමේ කුඩා මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම, ප්‍රජා සහභාගිත්වය සමග

**2.5 සංඛ්‍යා සටහන** — **මත්ස්‍ය නිෂ්පාදනය**

| උප අංශය | 2011 (අ) | 2012 (ආ) |
|---|---|---|
| මුහුදු මත්ස්‍ය (ඇ) | 385 | 417 |
| ජල ජීවී සහ මිරිදිය මසුන් | 60 | 69 |
| එකතුව | **445** | **486** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) මුහුදුබඩ සහ ගැඹුරු මුහුදු ධීවර අංශයන්

මූලය : ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යාංශය

ජලාශ සුදුසු ලෙස කළමනාකරණය කිරීම, මත්ස්‍ය පැටවුන් නිෂ්පාදනය ඉහළ යාම සහ මත්ස්‍ය පැටවුන් නොමිලේ නිකුත් කිරීම වැනි ක්‍රියාමාර්ග, මිරිදිය මත්ස්‍ය අංශයේ වර්ධනයට දායක විය.

## පශු සම්පත්

**කිරි ගව නිෂ්පාදන අංශය ප්‍රවර්ධනය කිරීමේ රජයේ සැළසුම් සහගත ප්‍රයත්නය හේතුවෙන්, දේශීය කිරි නිෂ්පාදනයේ ඉහළ යාමේ ප්‍රවණතාවය 2012 වසර තුළ දී අඛණ්ඩව දක්නට ලැබුණි.** එළකිරි සහ මී කිරි ඇතුළත් සමස්ත කිරි නිෂ්පාදනය 2012 වසර තුළ මිලියන ලීටර 299.3 ක් දක්වා සියයට 16 කින් වැඩි විය. මහා පරිමාණ කිරි සැකසුම්කරුවන් ඇතුළත් විධිමත් අංශයේ කිරි එකතු කිරීම 2011 වසරේ පැවති මිලියන ලීටර් 143.7 සිට 2012 වසර තුළ මිලියන ලීටර් 183.6 ක් දක්වා සියයට 28 කින් වර්ධනය විය. දියර කිරි සඳහා ගොවිපළ මිල ලීටරයකට රුපියල් 50 දක්වා ඉහළ යාම හේතුවෙන් 2012 වසර තුළ කිරි ගවයන් සංඛ්‍යාව සියයට 11 කින් වර්ධනය වූ අතර එය 2012 වසරේ සමස්ත කිරි නිෂ්පාදනය ඉහළ

**2.6 සංඛ්‍යා සටහන** — **පශු සම්පත් අංශය පිළිබඳ සංඛ්‍යා**

| උප අංශය | 2011 (අ) | 2012 (ආ) |
|---|---|---|
| 1. ජාතික ගවයන් සංඛ්‍යාව (මිලියන) | 1.6 | 1.6 |
| එළ ගවයන් | 1.2 | 1.2 |
| මී ගවයන් | 0.4 | 0.4 |
| 2. ජාතික කිරි නිෂ්පාදනය (ලීටර් මිලියන) | 258.3 | 299.3 |
| එළ කිරි | 203.5 | 237.6 |
| මී කිරි | 54.8 | 61.6 |
| 3. කිරි ආහාර නිෂ්පාදනය (ලීටර් මිලියන) | 21.4 | 29.3 |
| 4. නිෂ්පාදන මිල - එළකිරි (රු./ලීටර්) | 50.00 | 50.00 |
| 5. ජාතික බිත්තර නිෂ්පාදනය (මිලියන) | 1,185.3 | 1,457.1 |
| 6. ජාතික කුකුළු මස් නිෂ්පාදනය (මෙ.ටො.දහස්) | 116.8 | 122.5 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයන්: පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

යාමට තුඩුදුන් ප්‍රධාන සාධකය විය. උතුරු හා නැගෙනහිර පළාත්වල දායකත්වය වැඩිවීම, කුඩා හා මහා පරිමාණ කිරි එකතුකිරීමේ මධ්‍යස්ථානවල ශීතාගාර පහසුකම් වැඩිදියුණුවීම වැනි යටිතල පහසුකම් වල වර්ධනය සහ රජය විසින් කිරි ගව ක්ෂේත්‍රයේ වර්ධනය උදෙසා ක්‍රියාත්මක කළ විවිධ සංවර්ධන වැඩසටහන් වැනි කරුණු රාශියක් කර්මාන්තයේ සමස්ත වර්ධනය කෙරෙහි බලපා තිබේ. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය යටතට අයත් ගොවිපළවල නිෂ්පාදනය මිලියන ලීටර 3.4 ක් දක්වා සියයට 20 කින් ඉහළ යාම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ, ආනයනික කිරි ගවයින්ගේ ඉහළ ඵලදායිතාවයයි. තවද, මිල්කෝ සමාගම මගින් 2012 වසර තුළ රැස් කරන ලද දියර කිරි ප්‍රමාණය ලීටර මිලියන 68 ක් දක්වා සියයට 30 කින් ඉහළ ගොස් ඇති අතර එය ආයතනයේ කිරිපිටි නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 4.6 ක් දක්වා සියයට 25 කින් වර්ධනය වීමට බලපා තිබේ. එසේම, මෙය 2012 වසරේ දී කිරි නිෂ්පාදන මිල රුපියල් 50 මට්ටමේ ස්ථාවර කර ගැනීමට උපකාරී විය. 2012 වසරේ දී සමස්ත දේශීය කිරි නිෂ්පාදනය, සමස්ත ජාතික කිරි පරිභෝජන අවශ්‍යතාවයෙන් (දෛනික ඒක පුද්ගල පරිභෝජනය මිලි ලීටර 100) සියයට 40 ක් සපුරාලීමට ප්‍රමාණවත් වූ අතර 2011 වසරේ දී එම අගය සියයට 33 ක් විය. එසේම, 2012 වසර තුළ දී ආනයනික කිරි පිටි ප්‍රමාණය කිලෝ ග්‍රෑම් මිලියන 79.4 ක් දක්වා සියයට 5.5 කින් පහත වැටුණි.

**කුකුළු මස් හා බිත්තර නිෂ්පාදකයින් සඳහා තරගකාරී වෙළෙඳපොළ පරිසරයක් ගොඩනැංවීම උදෙසා රජය විසින් නොකඩවා ගනු ලැබූ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන්, 2012 වසර තුළ එම නිෂ්පාදන ඉහළයාම කෙරෙහි දායක විය.** 2012 වසර තුළ කුකුළු මස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 122,490 දක්වා සියයට 5 කින් වර්ධනය වූ අතර බිත්තර නිෂ්පාදනය සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරමින් බිත්තර මිලියන 1,457 දක්වා සියයට 23 කින් වර්ධනය විය. 2011 වසරේ දී පැවති දිනක් වයසැති කුකුළු පැටවුන්ගේ හිඟය දුරලීම සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සහ පෞද්ගලික අභිජනන ගොවිපළ හිමියන් විසින් දිනක් වයසැති කුකුළු පැටවුන්ගේ වෙළෙඳපොළ සැපයුම ඉහළ නැංවීම සඳහා ගනු ලැබූ ඒකාබද්ධ ක්‍රියාමාර්ගයන්ගේ ප්‍රතිඵලයක් ලෙස 2012 වසර තුළ දී දිනක් වයසැති කුකුළු පැටවුන් නිෂ්පාදනයේ සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස 2012 වසර තුළ මෙම කුකුළු පැටවුන්ගේ මිල ගණන් පහළ ගිය අතර එය කුකුළු මස් සහ බිත්තර නිෂ්පාදනය වර්ධනය වීමට උපකාරී විය. ඉහළ වෙළෙඳපොළ සැපයුම හේතුවෙන් දිනක් වයසැති කුකුළු පැටවුන්ගේ මිල පහළ ගිය නමුත් ආනයනික අමුද්‍රව්‍යයන්ගේ පිරිවැය ඉහළ යාම, වසර තුළ දී සත්ව ආහාර මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ යාමට බලපාන ලදී. කෙසේ වෙතත්, නිෂ්පාදකයින්ගේ ලාභ ආන්තිකයන් වැඩි කිරීමට දායක වෙමින් 2012 නොවැම්බර් සිට ක්‍රියාත්මක වන පරිදි සන්නාම සහිත බ්‍රොයිලර් කුකුළු මස් සඳහා උපරිම මිල කිලෝග්‍රෑමයකට රුපියල් 350 සිට කිලෝග්‍රෑමයකට රුපියල් 380 ක් දක්වා ඉහළ දමන ලදී. මේ අතර, වසරේ පළමු භාගය තුළ පහළ ගිය බිත්තර මිල ගණන් වසරේ දෙවන භාගය තුළ ඉහළ යාම කෙරෙහි නිෂ්පාදන පිරිවැය ඉහළ යාම බලපාන ලදී.

### වන සම්පත්

**ජීවනෝපාය සංවර්ධන කටයුතුවලට දායක වෙමින්, ස්වාභාවික සම්පත් කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා 2012 වසර තුළ දී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාවට නංවන ලදී.** ඒ අනුව, ඕස්ට්‍රේලියාව සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මෙන්ම, ගෝලීය ස්වභාවධර්ම පහසුකම් සහ කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික පදනමේ මූල්‍ය සහාය ඇතිව "ශ්‍රී ලංකා ප්‍රජා වන වැඩසටහන", "සුනාමියෙන් පසු ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ සහභාගිත්ව වෙරළ සංරක්ෂණ සහ තිරසාර කළමනාකරණය", යන ව්‍යාපෘතීන් වසර තුළ දී ආරම්භ විය. තවද, ශ්‍රී ලංකාවේ වන හායනයෙන් සහ වන විනාශයෙන් සිදුවන වායු විමෝචනය අඩු කිරීමට පූර්ව සූදානම්වීම සඳහා වන ව්‍යාපෘතිය ("Sri Lanka REDD readiness") වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ මෙම වැඩසටහන මගින් වසර 2013 සිට වසර තුනක් සඳහා එ.ජ.ඩොලර් මිලියන 4 ක ප්‍රතිපාදන අනුමත කරන ලදී. දේශගුණික විපර්යාසයන්ට මුහුණදීමේ ගෝලීය මෙහෙයුමට දායකවෙමින්, වන සම්පත වඩා විචක්ෂණශීලී ලෙස භාවිත කිරීම සහ මනා ලෙස කළමනාකරණය කිරීම මෙම ව්‍යාපෘතියෙන් ඉලක්ක කෙරේ. තවද, රටේ වන සම්පත පෝෂණය කිරීම සඳහා 2012 වසර තුළ දී පෞද්ගලික සමාගම් 24 ක් විසින් වාණිජ මට්ටමෙන් හෙක්ටයාර 452 ක වන වගාව සිදුකර ඇත.

### කෘෂිකාර්මික ප්‍රතිපත්ති සහ ආයතනික සහාය

**තේ නිෂ්පාදන ඵලදායීතාව, එකතු කළ අගය සහ තරගකාරිත්වය වැඩිදියුණු කිරීම ඉලක්ක කරමින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ තේ පර්යේෂණ ආයතනය විසින් තේ නිෂ්පාදන ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ගනු ලැබූ උපාය මාර්ග 2012 වසර තුළ අඛණ්ඩව ක්‍රියාත්මක විය.** ශ්‍රී ලංකා තේ මණ්ඩලය යටතේ "තේ ප්‍රවර්ධන සහ අලෙවිකරණ අරමුදල" මගින් 2012 වසර

තුළ දී සිය ඉලක්කගත ගෝලීය තේ ප්‍රවර්ධන සහ අලෙවිකරණ කටයුතු ආරම්භ කරන ලදී. මේ අනුව, ගෝලීය මට්ටමෙන් ලංකා තේ සහ සිංහ සලකුණ ප්‍රචාරණ කටයුතු සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය ජාත්‍යන්තර වෙළෙඳ ප්‍රදර්ශන 16 කට සහභාගී වූ අතර වෙනත් ප්‍රවර්ධන කටයුතු රාශියක් වසර තුළ දී ක්‍රියාවට නංවන ලදී. තේ දළුවල දුර්වල ප්‍රමිතිය, බොහෝ තේ කර්මාන්ත ශලා මුහුණ දෙන ප්‍රධාන ගැටළුවක් බවට පත්ව ඇත. තේ කර්මාන්ත ශාලාවල තේ දළු ප්‍රමිතිය ඉහළ මට්ටමකට ගෙන ඒම අරමුණු කරමින්, අමු තේ දළුවල අවම වශයෙන් පැවතිය යුතු ගුණාත්මක බව එනම්, පරිණත නොවූ සහ හානි නොවූ දළු ප්‍රමාණය සියයට 60 ක මට්ටමක පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් තේ කර්මාන්ත ශාලාවලට උපදෙස් ලබාදෙන ලදී. ඒ තුළින් තේ අපනයනවල ඉහළ ගුණත්වය සහතික කෙරේ. තවද, උසස් නිෂ්පාදන ක්‍රම ප්‍රවර්ධනය සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ආරම්භ කළ විවිධ සහනාධාර ව්‍යාපෘති 2012 වසර තුළ දී අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. 2012 වසර අවසානය වන විට "තේ කර්මාන්ත ශාලා නවීකරණ සහන වැඩසටහන" යටතේ තේ කර්මාන්ත ශාලා 43 කට ඔවුන්ගේ නිෂ්පාදන පරිමාව වැඩිදියුණු කිරීම සඳහා මූල්‍යාධාර සපයන ලද අතර ඒ අනුව, එසේ මූල්‍යාධාර සැපයූ සමස්ත තේ කර්මාන්ත ශාලා සංඛ්‍යාව 240 ක් බවට පත්විය. තවද, තේ දළු ප්‍රවාහන ක්‍රම වැඩිදියුණු කිරීම, තේ දළු එකතු කරන මධ්‍යස්ථාන සහ තේ දළු එකතු කරන ඇසුරුම් පෙට්ටි වැඩි දියුණු කිරීම සඳහා තේ වගාකරුවන්ට සහ නිෂ්පාදකයින්ට සහන ලබා දුන් අතර, නැවත වගාව සහ නව වගාවන්ගේ ඉහළ යන පිරිවැය සපුරාලීම සඳහා නැවත වගාව සහ නව වගා සඳහා ලබාදෙන මූල්‍ය සහනය පිළිවෙළින් හෙක්ටයාරයකට රුපියල් 350,000 ක් සහ හෙක්ටයාරයකට රුපියල් 250,000 ක් දක්වා පිළිවෙළින් රුපියල් 50,000 කින් හා රුපියල් 100,000 කින් ඉහළ නංවන ලදී. මේ අතර, දැරිය හැකි පිරිවැයකට බලශක්තිය නොකඩවා සපයා ගැනීම තේ නිෂ්පදාන සැකසුම් ක්ෂේත්‍රය මුහුණ දෙන අභියෝගයක් බවට පත්ව ඇත. කර්මාන්තශාලාවල තාප බලශක්තිය සපයා ගැනීම සඳහා යොදා ගනු ලබන දරවල සංතෘප්ත තෙතමනය සියයට 48 ක සිට සියයට 25 දක්වා අඩුකිරීමෙන්, විදුලිබල ශක්තිය සියයට 23 කින් ඉතිරි කරගත හැකි බව, තේ පර්යේෂණ ආයතනය විසින් කඳුරට තේ කර්මාන්ත ශාලාවක් ආශ්‍රිතව කරන ලද අත්හදා බැලීමකින් සනාථ වී ඇත. තේ කර්මාන්ත ශාලාවල තාප ශක්තිය ජනනය කිරීම සඳහා යොදාගනු ලබන ප්‍රධාන මූලාශ්‍රය වන දරවලින් සියයට 40 ක් දළු වියලීම සඳහා ද, සියයට 60 ක් තේ වියළීම සඳහා ද භාවිත වන අතර, කාර්යක්ෂම ලෙස දර භාවිත කිරීම තේ කර්මාන්ත ශාලා සඳහා වාසිදායක වනු ඇත.

**රබර් වගාවේ ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා සහ රබර් වගා කරන බිම් ප්‍රමාණය ව්‍යාප්ත කිරීම සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් 2012 වසර තුළ දී ක්‍රියාවට නැංවිණි.** රබර් වගාව ව්‍යාප්ත කිරීම සඳහා, 2015 වසර වන විට අම්පාර සහ මහඔය ප්‍රදේශවල හෙක්ටයාර 10,000 ක කුඩා රබර් වතු සංවර්ධනය කිරීමට 2012 අය වැයෙන් යෝජනා කළ අතර, 2012 වසරේ දී ඉන් හෙක්ටයාර 550 ක වගා කටයුතු අවසන් විය. තවද, කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික පදනම (IFAD) විසින් මූල්‍යාධාර සපයන "කුඩා වතු ව්‍යවසායය සංවර්ධන වැඩසටහන" යටතේ, රබර් වගා කරන සම්ප්‍රදායික නොවන ප්‍රදේශයක් වන මොනරාගල දිස්ත්‍රික්කය තුළ 2008 - 2012 කාලපරිච්ඡේදය තුළ හෙක්ටයාර 5,000 ක රබර් වගා කර අවසන් කරන ලදී. (2012 වසරේ දී වගා කළ බිම් ප්‍රමාණය හෙක්ටයාර 1,202 කි). තවද, වව්නියා සහ මුලතිව් දිස්ත්‍රික්කවල රබර් වගාව සඳහා සුදුසු බිම් හඳුනා ගැනීමට සහ පැළ සැපයීම සඳහා නව පැළ තවාන් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය සමීක්ෂණයන් වර්තමානයේ සිදු කරමින් පවතී. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2010 - 2011 වර්ෂයේ දී පවත්වන ලද රබර් ඉඩම් සංගණනය අනුව, 2002 වසරේ දී සිදුකළ සංගණනය හා සසඳන කල සමස්ත රබර් වගා කළ බිම් ප්‍රමාණය හෙක්ටයාර 125,645 ක් දක්වා සියයට 8 කින් වැඩි වී ඇත. තවද, මෑත කාලීනව ස්වාභාවික රබර් සඳහා පැවති ඉහළ මිල ගණන්වලින් දිරිමත් වී පෞද්ගලික අංශය තුළ වගාව ව්‍යාප්ත වීම හේතුවෙන් අක්කර 50 ට අඩු වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර 75,119 ක් දක්වා සියයට 28 කින් වර්ධනය වී ඇති අතර අක්කර 50 ට වඩා වැඩි රබර් ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 50,526 ක් දක්වා සියයට 13 කින් අඩු වී ඇති බව රබර් ඉඩම් සංගණනයෙන් හෙළිදරව් වේ. කෙසේ වෙතත්, සමස්ත පුද්ගලික අංශයේ රබර් වගා බිම්වලින් (හෙක්ටයාර 79,395) සියයට 71 ක් පමණ ප්‍රමාණයක් අක්කර පහට වඩා අඩු බිම් වන අතර, රබර් ක්ෂේත්‍රයේ ඵලදායීතාවය ඉහළ නැංවීමේ දී එය ප්‍රධාන සීමාකමක් ලෙස පවතී. මේ අතර ඉහළ ඇව පරිමාවක් සහිත සහ රෝගයන්ට ඔරොත්තු දීමේ ශක්‍යතාවය වැනි වැඩිදියුණු කළ ද්විතීයික ලක්ෂණ සහිත ඉහළ ඵලදාවක් ලබාදෙන වගාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා රබර් පර්යේෂණ ආයතනය විසින් 2012 වසර තුළ දී නව ක්ලෝන ප්‍රභේද කිහිපයක් (95-55, 87-372 හා 90-1) වාණිජ වගාව සඳහා හඳුන්වා දුන් අතර, ප්‍රාදේශීය වැවිලි

සමාගම් සඳහා අඩු තීව්‍රතා කිරි කැපීමේ තාක්ෂණ ක්‍රමවේදයක් (S4/D4) හඳුන්වා දෙන ලදී.

**පොල් වගා අංශයේ අභියෝගවලට මුහුණ දීමට අවශ්‍ය ආයතනික සහය පුළුල් කරමින් වසර 2016 දී පොල් නිෂ්පාදනය ගෙඩි මිලියන 3,650 ක් කරා ළඟා වීමට සැලසුම් කෙරේ.** මෙම වසර තුළදී පොල් වගා අංශය මුහුණ පෑ ප්‍රධාන අභියෝගයන් වූයේ වැලිගම කොළ මැලවීමේ රෝගය, පොල් මයිටා වසංගත රෝගය, පොල් වගා කරන ප්‍රදේශවල පැතිරුණු අධික නියගය, නිෂ්පාදන මිල පහත වැටීම සහ අපනයන ඉල්ලුම අඩුවීම යනාදියයි. වැලිගම කොළ මැලවීමේ රෝගය කල්තබා රෝග හඳුනා ගැනීමේ හැකියාව දියුණු කිරීමට, රෝගය ව්‍යාප්තවීම වැළැක්වීම ප්‍රචලිත කිරීමට හා රෝගය ඒකාබද්ධව කළමනාකරණය සඳහා ලෝක ආහාර සහ කෘෂිකර්ම සංවිධානයේ සහයෝගය පොල් පර්යේෂණ ආයතනයට ලැබිණ. මේ අනුව, 2012 වසර අවසානය වන විට වැලිගම කොළ මැලවීමේ රෝග යෙන් බලපෑමට ලක්වූ පොල් ගස් 179,000 ක් කපා ඉවත් කර (2012 වසරේ දී ඉවත් කළ පොල් ගස් 86,000 ක් ද ඇතුළත්ව) ඒ සඳහා වන්දි ගෙවීම් සිදුකරන ලදී. පොල් මයිටා වසංගත ගැටළුවට මුහුණදීම සඳහා මහා පරිමාණයෙන් මයිටා විලෝපීයන් බෝ කළ හැකි පරීක්ෂණාගාර හයක් ස්ථාපනය කළ අතර පොල් පර්යේෂණ ආයතනය මගින් විලෝපීය මයිටාවන් 48,850 ක් වගාකරුවන්ට බෙදාහරින ලදී. තවද, පැළ අවස්ථාවේ දී වගාවට බරපතල හානි සිදුකරන පළිබෝධකයන් වන "ප්ලෙසිස්පා කුරුමිණියන්" මර්ධනය කිරීම සඳහා ජෛව පාලන වැඩසටහනක් දියුණු කිරීමට තායිලන්තයෙන් පරපෝෂිතයන් ආනයනය කරන ලදී. වඩා වැඩි ඵලදාවක් ලබා දෙන ප්‍රභේද ලෙස "කප් සුවය" (RISL-2012) සහ "කප් සෙත" (RISL-2013) යන ප්‍රභේද 2012 වසරේ දී පොල් වගාකරුවන් සඳහා නිකුත් කරන ලදී. පොල් කිරි උපයෝගී කරගෙන නිෂ්පාදනය කළ අයිස්ක්‍රීම් සහ පොල් සීනි යන අගය එක් කළ නව නිපැයුම් 2012 වසරේ දී වෙළෙඳපොළට හඳුන්වා දෙන ලදී. මේ අතර, රජය මගින් නියගය හේතුවෙන් බලපෑමට ලක්වූ වගාකරුවන්ට වන්දි වශයෙන් එක් වගාකරුවෙකුට අක්කර 5 ක් දක්වා පොල් පැළ නොමිලයේ ලබා දෙන ලදී.

**2012 වසරේ දී නිෂ්පාදනය වේගවත් කිරීමටත්, ඵලදායීත්වය හා ශස්‍යවිද්‍යා භාවිතයන් වැඩිදියුණු කිරීමට හා ප්‍රචලිත කිරීමටත් නොයෙකුත් ක්‍රියාමාර්ග හඳුන්වා දෙන ලදී.** වී අංශයේ පුබුදුව තුළින් වඩා වැඩි ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා "වී අපනයන කලාප" පිහිටුවීමට කෘෂිකාර්මික ප්‍රතිපත්තිවල ප්‍රමුඛතාවය ලැබිණි. 2012 වසරේ දී වැඩි වී ඵලදාවක් ලබාදෙන ප්‍රදේශ "වී අපනයන කලාප" ලෙස හඳුනා ගත් අතර මෙම ප්‍රදේශවල හෙක්ටයාර 2,214 ක ගොවීන් 3,300 ක් සම්බන්ධ කරමින් වගා කටයුතු සිදුකරන ලදී. මෙම වී අපනයන කලාපවල වගා කළ වී සැකසුම් කටයුතු සඳහා මෝල් හිමියන් 22 ක් හඳුනා ගත් අතර පසු අස්වනු තාක්ෂණ ආයතනය මගින් මෙම මෝල් හිමිකරුවන් සහ ගොවියන් සඳහා පසු අස්වනු තාක්ෂණ පරිහරණය පිළිබඳව පුහුණුවක් ලබා දෙන ලදී. තවද, මුං ඇට, කුරක්කන් හා බඩ ඉරිඟු වගාකරුවන්ට සම්ප්‍රදායික වගා චක්‍රයට පිටතින් අගෝස්තු සිට ඔක්තෝබර් මාස අතර නව කන්නයක වගා කිරීමට දිරිගැන්විය. 2012 වසරේ දී මෙම නව කන්නය තුළ හම්බන්තොට හා මොණරාගල දිස්ත්‍රික්කවල මුං ඇට වගාව සැළකියයුතු භූමි ප්‍රමාණයක සිදුකරන ලදී. මේ අතර පසු අස්වනු තාක්ෂණ ආයතනය, සහල් සැකසුම් ක්‍රියාවලිය තුළ ධාරිතාවය වැඩිකර ගැනීම මගින් සැකසුම් වියදම් අඩුකර ගැනීම සඳහා බලශක්ති කාර්යක්ෂම, අධි ධාරිතාවයකින් හා ඉහළ ගුණත්වයෙන් යුතු සහල් පිටි නිපදවීමේ උපකරණයක් වැඩි දියුණු කරන ලදී. මෙමගින් සහල් පිටි මිල අඩුකර ගත හැකි අතර සහල් පිටි නිෂ්පාදනය වඩා ප්‍රචලිත කළ හැකි වේ. වී පර්යේෂණ ආයතනය, දැනට පවතින මාස 3 1/2 ක වී ප්‍රභේද වෙනුවට නව වී ප්‍රභේද තුනක් (Bw 367, Ld 368 සහ Bg 369) 2012 වසරේ දී හඳුන්වා දෙන ලදී. තවද, ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා දියුණු කිරීමේ ආයතනය වැඩි ඵලදාවක් ලබා දෙන සෝයා ප්‍රභේදයක් (MISB-1) දියුණු කරන ලදී. මෙය දේශීය සෝයා බෝංචි වගාව වැඩි කිරීමට හේතු වන අතර, එමගින් අඛණ්ඩ දේශීය සෝයා බෝංචි සැපයුම මත පදනම් වූ කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශයක් වැඩිදියුණු කිරීමට දායකත්වය සපයනු ඇත. පසු අස්වනු කටයුතුවල නියැලෙන පාර්ශ්වයන්ගේ එම කටයුතුවල ගුණාත්මක බව වැඩි දියුණු කිරීම සඳහා තෝරාගත් පළතුරු සහ එළවළු, ප්ලාස්ටික් කූඩ මගින් ප්‍රවාහනය කිරීම අනිවාර්ය කරමින් නීති ක්‍රියාත්මක කිරීම සිදුකරන ලදී. මේ අතර වාරිමාර්ග හා වර්ෂාපෝෂක තත්ත්ව යටතේ ඉහළ උක් හා සීනි ඵලදාවක් ලබා දෙන නව උක් ප්‍රභේද තුනක් (SL 90 6237, SL 95 4443 හා SL 96 128) වගාව සඳහා නිර්දේශ කර නිකුත් කරන ලදී. සීනි පර්යේෂණ ආයතනය, මෙම ප්‍රභේද වැඩිදියුණු කරමින් එම උක් බීජ දඬු තවදුරටත් ප්‍රතිනිෂ්පාදනය සඳහා සීනි කර්මාන්ත ශාලාවලට සපයන ලදී.

**රජය විසින් ඉදිරිපත් කරන ලද මූලික පශු සම්පත් සැලසුමට අනුව කිරි ගව ක්ෂේත්‍රය තුළ සංවර්ධන කටයුතු වේගවත් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබීය.** රටේ කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා කිරි දෙනුන්ගේ සංඛ්‍යාව වර්ධනය කිරීම අත්‍යවශ්‍ය බව

හඳුනාගෙන තිබේ. ජාතික පශු සම්පත් හා සංවර්ධන මණ්ඩලයට සත්ත්ව අභිජනන කටයුතුවලට අනුබල සැපයීමේ කටයුත්ත පවරමින් ප්‍රධාන සත්ත්ව අභිජනන ගොවිපළවල් ස්ථාපිත කරන ලදී. ඒ අනුව, ජාතික පශු සම්පත් හා සංවර්ධන මණ්ඩලය 2012 වසර තුළ දී ප්‍රිසියන් හා ජර්සි ප්‍රිසියන් වර්ගවලට අයත් වැඩි ඵලදාවක් ලබා දෙන කිරි ගවයින් 2,000 ක් ඕස්ට්‍රේලියාවෙන් ආනයනය කරන ලදී. එසේම වසර තුළ දී "පශු සම්පත් (කිරි ගව) අභිජනන ව්‍යාපෘතිය" ගව හා මී ගව කෘත්‍රිම සිංචනයන් 203,753 ක් සිදුකිරීම සඳහා දායකත්වය ලබා දෙන ලදී. තවදුරටත් "වැස්සි පැටවුන් ඇතිකිරීමේ ව්‍යාපෘතිය" යටතේ කෘත්‍රිමව බෝ කරනු ලැබූ වැස්සි පැටවුන්ට කෑම සැපයීම හා සතුන් කළමනාකරණය සඳහා ගොවීන්ට ආධාර ලබාදෙන ලදී. මේ අතර, දේශීය කිරි පිටි නිෂ්පාදනය ධෛර්යමත් කිරීම සඳහා ආනයනික කිරි පිටි සඳහා අයකරනු ලබන විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද 2012 නොවැම්බර් මස සිට කිලෝ ග්‍රෑමයකට රුපියල් 107 ක් දක්වා ඉහළ දමන ලදී. එසේම, රජය යටතේ පවතින මිල්කෝ සමාගමේ කිරි එකතු කිරීමේ වර්ධනයන්ට අනුරූප වන පරිදි, ඔවුන්ගේ කිරිපිටි නිෂ්පාදන කර්මාන්ත ශාලා වැඩිදියුණු කිරීම සඳහා යූරෝ මිලියන 30 ක ණයක් එම සමාගමට ලබා ගැනීමට පහසුකම් සලසනු ලැබීය.

**ධීවර ක්ෂේත්‍රයේ මෑතකාලීනව ඇති වූ වර්ධනය, පැන නැගුණු නව අභියෝගයන් හමුවේ අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා, රජය විසින් ගනු ලැබූ ඇතැම් ප්‍රතිපත්තීන් ඉවහල් විය.** 2012 පෙබරවාරි මාසයේ දී ඉන්ධන මිල ගණන් සංශෝධනයත් සමඟ නිෂ්පාදන පිරිවැය ඉහළ යාමේ බලපෑම යම්තරමකට පාලනය කර ගැනීම සඳහා රජය විසින් ඉන්ධන සහන වැඩපිළිවෙළක් ධීවර ක්ෂේත්‍රය තුළ ක්‍රියාවට නැංවීය. මේ යටතේ, 2012 වසර තුළ දී, රජය විසින් රුපියල් මිලියන 2,970 ක් ප්‍රතිපාදන ලබාදෙන ලදී. තවදුරටත්, ධීවර සම්පත් වැඩිදියුණු කිරීම සඳහා ලබාදුන් සහනදායී ණය යෝජනා ක්‍රමයක් වන "දියවර දිරිය" යටතේ රුපියල් මිලියන 908 ක මුදලක් සියයට 4 ක පොලී සහනයක් යටතේ ප්‍රතිලාභීන් 632 දෙනෙකු අතරේ බෙදා දීම 2012 වසර තුළ දී සිදුවිය. නවීන පහසුකම්වලින් සමන්විත රටේ විශාලතම ධීවර වරාය වන දික්ඕවිට ධීවර වරායේ ඉදිකිරීම් කටයුතු 2012 වසර තුළ දී සම්පූර්ණ කරන ලදී. මෙය ගැඹුරු මුහුදේ ධීවර නිෂ්පාදනය ඉහළ දමමින් එමගින් දේශීය මත්ස්‍ය අවශ්‍යතාවය හා අපනයන ඉහළ දැමීමට උපකාරී විය. තවද, 2012 වසර තුළ දී ටින් මාළු සැකසුම් කර්මාන්ත ශාලා තුනක් නිෂ්පාදන කටයුතු ඇරඹීමත් සමඟ රට තුළ ක්‍රියාත්මක වන මෙම කර්මාන්ත ශාලා සංඛ්‍යාව 04 ක් දක්වා ඉහළ ගියේය. 2012 වසර තුළ දී, මෙම කර්මාන්ත ශාලාවක දෛනික නිෂ්පාදනය ටින් එකක ශුද්ධ මාළු බර ග්‍රෑම් 280 බැගින් වූ ටින් මාළු 38,000 ක් විය. එය සමස්ත වෙළෙඳපොළ සැපයුමෙන් සියයට 22 ක් පමණ විය. 2012 වසර තුළ දී ශ්‍රී ලංකාව මෙට්‍රික් ටොන් 18,857 ක ටින් මාළු ප්‍රමාණයක් ඇ.එ.ජ.ඩොලර් මිලියන 41.8 ක වියදමක් දරා ආනයනය කරන ලදී. ටින් මාළු සැකසුම් කර්මාන්ත අංශය තුළ දේශීය ආයෝජන ධෛර්යමත් කිරීම සඳහා 2012 නොවැම්බර් මස සිට ආනයනය කරනු ලබන ටින් මාළු මත අයකරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද කිලෝ ග්‍රෑමයකට රුපියල් 75 සිට රුපියල් 100 ක් දක්වා ඉහළ දමන ලදී.

**2013 වසර සඳහා ඉදිරිපත් කරන ලද රජයේ අය වැය ලේඛනය මගින් කෘෂිකර්මාන්ත අංශයට සහන සැලසීමටත් වසර තුළ අයහපත් කාලගුණ තත්ත්වයන්ගේ බලපෑමට ලක් වූ පාර්ශවකරුවන්ට සහන ලබාදීම සඳහාත් විවිධ ක්‍රියාමාර්ගයන් හඳුන්වා දෙනු ලැබීය.** නියඟයේ බලපෑමට ලක්වූ වී ගොවීන්ට ලබාදුන් ණය මුදල්වල පොලිය කපා හැරීමටත් එම ණය ප්‍රතිලේඛනගත කිරීමටත් 2013 වසර සඳහා ඉදිරිපත් කළ රජයේ අය වැය මගින් යෝජනා කළ අතර එළඹෙන මහ කන්නයේ වගා කටයුතු අඛණ්ඩව සිදුකිරීම සඳහා මෙම ගොවීන්ට නොමිලයේ බීජ වී ලබාදීමටත් යෝජනා කරන ලදී. තවදුරටත්, දැනට ක්‍රියාත්මක වන පොහොර සහන වැඩපිළිවෙළ යටතේ ප්‍රතිලාභ ලබන ගොවීන් සඳහා "භෝග රක්ෂණ යෝජනා ක්‍රමයක්" ක්‍රියාත්මක කිරීමට යෝජනා කරන ලදී. එසේම, වී සඳහා ස්ථාවර වෙළෙඳපොළක් සහතික කිරීම සඳහා රජයේ සහතික මිලට වී මිලදී ගැනීමේ යෝජනා ක්‍රමය යටතේ වී මිලදී ගැනීමේ මිළ ඉහළ නංවන ලදී. එසේම, කාබනික පොහොර භාවිතය දිරිගැන්වීම සඳහා, කාබනික පොහොර භාවිත කර නිපදවන වී සඳහා කිලෝ ග්‍රෑමයකට රුපියල් 40 ක් වැනි ඉහළ මිලක් යෝජනා කරන ලදී. තවදුරටත්, සිලාවතුර, ගන්දර, ගුරුනගර්, කලාමටිය ධීවර වරායන් සංවර්ධනය කිරීමටත්, මිරිස්ස, හික්කඩුව, බේරුවල, ගාල්ල හා හම්බන්තොට යන ධීවර වරායන් හා සියලුම ධීවර යාත්‍රා නැංගුරම් ස්ථාන හා නැවතුම්පොළවල් පුනරුත්ථාපනය කිරීමටත් යෝජනා කරන ලද අතර එමගින් දියුණු ධීවර වරාය ජාලයක් හරහා ධීවර ක්ෂේත්‍රයේ වේගවත් වර්ධනයක් සඳහා පහසුකම් සැපයීමටත් අපේක්ෂා කෙරේ. කුකුළු නිෂ්පාදන ක්ෂේත්‍රයේ වර්ධනය සඳහා දැනට පවතින කුකුළු මස් සඳහා පවතින උපරිම පාලන මිල වෙනුවට නිෂ්පාදන පිරිවැය සැලකිල්ලට ගනිමින් කුකුළු මස් සඳහා මිල සමීකරණයක් යෝජනා කරන ලදී. එසේම, කුකුල් මස් නිෂ්පාදකයින්ගේ ආදායම් බද්ද ද සියයට 10 කින් අඩු කිරීමටත් යෝජනා විය.

### කාර්මික අංශය

**සියලුම උප අංශයන් මගින් ලද දායකත්වය සමග කාර්මික අංශය, 2011 වසරේ දී මෙන්ම 2012 වසරේ දී ද සියයට 10.3 ක වර්ධනයක් වාර්තා කළේය.** කාර්මික අංශයෙහි විශාලතම උප අංශය වන කර්මාන්තශාලා නිෂ්පාදන උප අංශය 2011 සහ 2010 වසරවල දී පිළිවෙළින් සියයට 8.3 ක් සහ සියයට 7.5 ක් ලෙස වාර්තා කළ වර්ධනයන්ට සාපේක්ෂව 2012 වසර තුළ දී සියයට 5.2 ක වර්ධනයක් වාර්තා කරන ලදී. ගෝලීය වෙළෙඳපොළ තුළ අපනයන සඳහා පැවති උදාසීන ඉල්ලුම සහ හඳුන්වා දුන් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල බලපෑම නිසා පහත වැටුණු දේශීය ඉල්ලුම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. විදුලිය උප අංශයෙහි වැඩි එකතු කළ අගයක් ඇති ජල විදුලිබල උත්පාදනය පහත වැටීම හේතුවෙන්, පෙර වසර දෙක සමග සැසඳීමේ දී විදුලිය, ගෑස් සහ ජලය උප අංශය ද මන්දගාමීත්වයක් පෙන්නුම් කළේය. රට පුරා ක්‍රියාත්මක වූ ඉහළ මට්ටමේ පෞද්ගලික මෙන්ම රාජ්‍ය අංශයේ ද ඉදිකිරීම් කටයුතු සමග ඉදිකිරීම් සහ පතල් සහ කැණීම් උප අංශ ආකර්ෂණීය වේගයකින් ප්‍රසාරණය විය. මෙම වසර තුළ දී කාර්මික අංශය මුළු දළ දේශීය නිෂ්පාදිතයට සියයට 30.4 ක දායකත්වයක් සපයන ලද අතර, 2011 වසරේ දී එය සියයට 29.3 ක් විය.

### පතල් සහ කැණීම්

**පතල් සහ කැණීම් උප අංශය 2011 වසරේ දී පැවති සියයට 18.5 ක වර්ධනයට සාපේක්ෂව 2012 වසරේ දී සියයට 18.9 කින් ප්‍රසාරණය විය.** මෙම උප අංශය, පිළිවෙළින් සියයට 18.5 ක සහ සියයට 81.5 ක දායකත්වය සපයන මැණික් පතල් සහ අනෙකුත් පතල් කටයුතු යන දෙඅංශයෙන් සමන්විත වේ. මෙම උප අංශයට විශාලම දායකත්වය සපයනු ලබන අනෙකුත් පතල් කටයුතු අංශයට ඉදිකිරීම් ආශ්‍රිත ද්‍රව්‍ය, ග්‍රැෆයිට්, පොස්පේට්, ඛනිජ වැලි වැනි ද්‍රව්‍ය නිස්සාරණය සහ ලුණු නිෂ්පාදනය ආදිය ඇතුළත් වෙයි. මෙම උප අංශය 2011 වසරේ දී වාර්තා කළ සියයට 18.8 ක වර්ධනය සමග සැසඳීමේ දී 2012 වසරේ දී එකතු කළ අගය සියයට 21.1 කින් ප්‍රසාරණය වූ අතර ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය වන වැලි, කළුගල් සහ හුණු වැනි ද්‍රව්‍ය සඳහා වූ ඉහළ ඉල්ලුම මෙම වර්ධනයට බෙහෙවින් උපකාරී වී ඇත. එසේම, වසර තුළ ග්‍රැෆයිට් නිෂ්පාදනය ද වර්ධනය විය. කෘෂිකාර්මික අංශයට අහිතකර ලෙස බලපෑ කාලගුණික තත්ත්වයන්හි ප්‍රතිඵලයක් ලෙස පොහොර සඳහා වූ අඩු ඉල්ලුම හේතුවෙන් පොස්පේට් නිෂ්පාදනය පෙර වසරට සාපේක්ෂව සංකෝචනය වූ අතර, ඛණිජ වැලි නිෂ්පාදනයේ ද පහළ යාමක් දක්නට ලැබුණි. ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝපීය රටවලින් පැන නැගුණු දුර්වල ඉල්ලුම මධ්‍යයේ වුව ද මැණික් පතල් කැණීම් උප අංශය 2012 වසරේ දී එකතු කළ අගය අනුව සියයට 10.2 කින් ප්‍රසාරණය විය. කෙසේ වෙතත්, දේශීය මැණික් සහ ස්වර්ණාභරණ අපනයනකරුවන් චීනය, මැලේසියාව සහ ඉන්දුනීසියාව වැනි ධනවත් ආසියානු වෙළෙඳපොළ තුළට යොමු වීම මගින් බටහිර රටවල්වලින් වූ සෘණාත්මක බලපෑම තරමක් දුරට අඩු කර ගැනීමට හැකි විය. මෙම උප අංශය තුළ එකතු කළ අගය මත දායකත්වයෙහි ප්‍රසාරණය සහ ආසියානු වෙළෙඳපොළ වෙත වූ ව්‍යාප්තිය මධ්‍යයේ වුව ද අපනයන වෙළෙඳපොළ තුළ දක්නට ලැබුණු අඩු ඉල්ලුම විදහා පෙන්වමින් මැණික් සහ ස්වර්ණාභරණ අපනයන පරිමාව 2012 වසර තුළ දී සියයට 7.8 කින් සංකෝචනය විය.

## නිෂ්පාදන කර්මාන්ත

### සැකසුම්

**තේ, රබර් සහ පොල් සැකසුම් අයත් කර්මාන්ත නියෝජනය කරන සැකසුම් උප අංශය 2011 වසරේ වාර්තා වූ සියයට 0.9 ක වර්ධනයට සාපේක්ෂව 2012 වසරේ දී සියයට 6.5 කින් වර්ධනය විය.** මෙම උප අංශයෙහි එකතු කළ අගය වර්ධනය සඳහා, වසර තුළ තේ සහ රබර් නිෂ්පාදනයේ පසුබෑමෙන් සිදුවූ බලපෑම අභිබවා යාමට පොල් සැකසුම් කර්මාන්තයන්හි වූ වර්ධනය උපකාරී විය. එසේම, 2012 අයවැය යටතේ ප්‍රධාන කෘෂිකාර්මික අපනයනවල දේශීයව එකතු කළ වටිනාකම දිරිගැන්වීමට හඳුන්වා දෙන ලද බදු සහන ද සැකසුම් කර්මාන්තවල දියුණුවට දායක විය. තවද, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මගින් දියත් කරන ලද, වසා දැමූ තේ කර්මාන්තශාලා නැවත වැඩ ඇරඹීම සහ නව කර්මාන්තශාලා ඇරඹීම ද තේ කර්මාන්තශාලා නවීකරණ වැඩසටහන් ද සැකසුම් කර්මාන්තයන්හි වර්ධනයට උපකාරී විය.

### කර්මාන්තශාලා අංශය

**මන්දගාමී ගෝලීය ආර්ථික පරිසරය සහ දේශීය ආර්ථිකය ස්ථායීව පවත්වා ගැනීමට ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හමුවේ වුවද, විවිධ කර්මාන්තයන් හි නිෂ්පාදනය පුළුල් වීම, 2012 වසරේ කර්මාන්තශාලා අංශයේ ක්‍රියාකාරිත්වය ඉහළ නැංවීමට හේතු විය.** උසස් තත්ත්වයේ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ හැකියාව සහ නව වෙළෙඳපොළවල් සොයා ගැනීම මගින් අපනයන ඉලක්කකරගත් බොහෝ

**2.7 සංඛ්‍යා සටහන**

**කාර්මික නිෂ්පාදන දර්ශකය**
**2010 = 100**

| කාණ්ඩය (කාර්මික නිෂ්පාදන දර්ශකයේ බර තැබීම වරහන් තුළ දක්වා ඇත) | දර්ශකය | | |
|---|---|---|---|
| | 2011 (අ) | 2012 (ආ) | වාර්ෂික වෙනස් වීම % |
| 1. ආහාර නිෂ්පාදිත (23.7%) | 108.5 | 106.9 | -1.5 |
| 2. පාන වර්ග (8.1%) | 110.2 | 107.4 | -2.5 |
| 3. දුම්කොළ නිෂ්පාදිත (8.4%) | 106.0 | 99.9 | -5.7 |
| 4. රෙදිපිළි (1.6%) | 99.8 | 113.9 | 14.1 |
| 5. ඇඟලුම් (23.0%) | 113.8 | 118.5 | 4.2 |
| 6. සම් සහ ආශ්‍රිත නිෂ්පාදිත (0.8%) | 94.0 | 92.9 | -1.1 |
| 7. ගෘහ භාණ්ඩ හැර, දැව සහ දැව නිෂ්පාදිත (0.1%) | 107.9 | 98.4 | -8.8 |
| 8. කඩදාසි සහ කඩදාසි නිෂ්පාදිත (0.1%) | 89.0 | 98.8 | 11.0 |
| 9. මුද්‍රණය සහ තැටි පිටපත් කිරීම (0.7%) | 100.5 | 106.3 | 5.8 |
| 10. පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදිත (2.2%) | 106.3 | 81.3 | -23.5 |
| 11. රසායන ද්‍රව්‍ය සහ ඒ ආශ්‍රිත නිෂ්පාදිත (6.3%) | 67.5 | 78.1 | 15.7 |
| 12. ඖෂධ, ඖෂධීය සහ උද්භිද විද්‍යාත්මක නිෂ්පාදන (0.1%) | 133.0 | 138.8 | 4.4 |
| 13. රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත (10.5%) | 116.6 | 116.9 | 0.3 |
| 14. අනෙකුත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (7.2%) | 116.7 | 117.5 | 0.7 |
| 15. මූලික ලෝහ නිෂ්පාදිත (1.0%) | 110.2 | 98.1 | -11.0 |
| 16. යන්ත්‍රෝපකරණ සහ උපකරණ හැර, සකස් කළ ලෝහ නිෂ්පාදිත (3.8%) | 89.6 | 111.7 | 24.7 |
| 17. විදුලි උපකරණ (2.3%) | 98.7 | 98.4 | -0.4 |
| **කාර්මික නිෂ්පාදන දර්ශකය** | **107.2** | **108.4** | **1.1** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

කර්මාන්තවල නිෂ්පාදනය ඉහළ මට්ටමේ පවත්වා ගැනීමට උපකාරී වූ අතර, සංචාරක කර්මාන්තයේ ප්‍රසාරණය හේතුවෙන් බොහෝ භාණ්ඩ සඳහා දේශීය ඉල්ලුම ද වැඩිදියුණු විය. මේ අතර, රාජ්‍ය අංශයේ ක්‍රියාත්මක වෙමින් පවතින සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් සහ වාණිජ අංශයේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් ජනිත වූ ඉල්ලුම හමුවේ, ඉදිකිරීම් කර්මාන්තවල විවිධ භාණ්ඩ නිෂ්පාදන කටයුතු ද වසර තුළදී ඉහළ ගියේය.

**දුර්වල ගෝලීය ආර්ථික ක්‍රියාකාරිත්වය හමුවේ, 2012 වසර තුළ දී ඇඟලුම් නිෂ්පාදනය ඉහල ගිය ද, එය පෙර වසරට වඩා මන්දගාමී තත්ත්වයක පැවතුනි.** 2012 වසර තුළ දී ඇඟලුම් නිෂ්පාදනය සියයට 4.2 කින් වැඩි විය. විශේෂයෙන්ම යුරෝපීය කලාපයේ දුර්වල ආර්ථික ක්‍රියාකාරිත්වය, ශ්‍රී ලංකාවේ අපනයන සඳහා වන ඉල්ලුම කෙරෙහි අහිතකර ලෙස බලපා ඇත. කෙසේ වුවද, යුරෝපය සහ ඇමෙරිකා එක්සත් ජනපදය වෙත ඉහළ ප්‍රමිතියෙන් සහ ඔබින මිලකට ඇඟලුම් සපයන රටවල් අතර ශ්‍රී ලංකාව තවදුරටත් සිටී. තවදුරටත් ප්‍රධාන අපනයන වෙළෙඳපොළ ගමනාන්තයන් වන මෙම රටවල ආර්ථිකයන්හි වර්ධන වේගය අඩුවීම හමුවේ වුවද, තම ක්‍රියාකාරිත්වය ස්ථාවර මට්ටමක පවත්වා ගැනීමට දේශීය ඇඟලුම් නිෂ්පාදන කර්මාන්තයට හැකි විය. ඇඟලුම් නිෂ්පාදකයින් ඔවුන්ගේ ව්‍යාපාර අනෙක් වෙළෙඳපොළවලට තවදුරටත් විවිධාංගීකරණයට උත්සාහ කරමින් සිටී. මේ අතර, ප්‍රධාන වශයෙන් රෙදි විවීම සහ නිමැවුම්වලින් සමන්විත රෙදිපිළි නිෂ්පාදන අංශය, 2012 වසරේ දී ප්‍රසංශනීය වර්ධනයක් පෙන්නුම් කරන ලදී. වෙළෙඳපොළ මූලාශ්‍රයන්ට අනුව, සංචාරකයින්ගෙන් වූ යහපත් ඉල්ලුම දේශීය වෙළෙඳපොළ වෙත රෙදිපිළි සැපයීමට අනුබලයක් විය.

**රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන උප අංශය, එහි ක්‍රියාකාරිත්වය 2012 වසර මුළුල්ලේ ස්ථාවරව පවත්වා ගන්නා ලදී.** රබර් සහ ප්ලාස්ටික් උප අංශයේ සියයට 80 කට වඩා සැලකිය යුතු දායකත්වයක් සපයන ටයර් සහ ටියුබ් නිෂ්පාදනවල ආන්තික පසුබෑමක් තිබියදීත්, එම අංශයේ නිමැවුම සියයට 0.3 කින් වර්ධනය විය. යුරෝපයේ ආර්ථික කටයුතු පහත වැටීමේ ප්‍රවණතාවය හේතුවෙන් ඇතිවූන ආනයන ඉල්ලුමේ සම්ප්‍රයුක්ත පහත වැටීම, ටයර් අපනයනය කෙරෙහි අහිතකර ලෙස බලපාන ලදී. එහෙත්, උප අංශයේ වර්ධනයට ඇත්වැසුම් ඇතුළු අනෙකුත් රබර් නිෂ්පාදන මෙන්ම ප්ලාස්ටික් නිෂ්පාදන කාණ්ඩයන්හි වර්ධනයන් ද ඉවහල් විය. ඇත්වැසුම් නිෂ්පාදනය සඳහා විදේශ වෙළෙඳපොළවලින් ඇති වූ ඉල්ලුම දායක වූ අතර ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය පුළුල් වීමට විශාල වශයෙන් දේශීය ඉල්ලුම දායක විය.

**නැව් ඉදිකිරීම සහ නැව් අළුත්වැඩියා කිරීමේ අංශය ප්‍රමුඛ සකස් කළ ලෝහ නිෂ්පාදන උප අංශය 2012 වසරේ දී මනා ක්‍රියාකාරිත්වක් පෙන්වීය.** මෙම උප අංශයේ ක්‍රියාකාරිත්වයට ඉන්දියාවෙන් සහ සිංගප්පූරුවෙන් වූ ඇනවුම් දායක විය. සංචාරක අංශයේ වූ වේගවත් ප්‍රසාරණය හේතුවෙන්, විනෝද කටයුතු සඳහා යොදා ගන්නා කුඩා හා මධ්‍යම පරිමාණයේ බෝට්ටු සඳහා දේශීය ඉල්ලුම ඉහළ ගිය අතර, ධීවර බෝට්ටු සඳහා වන ඉල්ලුම ඉහළ යාම ද මෙම උප අංශයේ ක්‍රියාකාරිත්වය ඉහළ නැංවීමට දායක විය.

**රසායන ද්‍රව්‍ය සහ රසායනික ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදන උප අංශය ද 2012 වසර තුළ දී ඉහළ වර්ධනයක් පෙන්නුම් කළේය.** 2012 වසරේ දී මෙම උප අංශයේ වර්ධනයට පොහොර, සබන් සහ සේදුම් කුඩු මෙන්ම තීන්ත සහ වාර්නිෂ් නිෂ්පාදනයේ ද වර්ධනය දායක විය. රටේ කෘෂිකාර්මික සහ ඉදිකිරීම් ආශ්‍රිත

**2.3 රූප සටහන** **කාර්මික නිෂ්පාදන දර්ශකය**




ක්‍රියාකාරකම්වල වර්ධනය පොහොර, තීන්ත සහ වාර්නිෂ් නිෂ්පාදනය ඉහළ යාමට හේතු වූ අතර, සබන් සහ සේදුම් කුඩු නිෂ්පාදනවල වර්ධනයට සංචාරක අංශයෙන් වූ ඉල්ලුමෙන් ද දායකත්වයක් ලැබුණි. වසරේ දෙවන භාගය තුළ දී පොහොර නිෂ්පාදනය පහත වැටීම රසායන ද්‍රව්‍ය සහ රසායනික ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදන උප අංශයේ ක්‍රියාකාරිත්වයට අහිතකර ලෙස බලපෑවේය. මේ අතර, වී වගාව සඳහා කාබනික පොහොර භාවිතය දිරිගැන්වීමට රජය විසින් විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇත. 2013 වසර සඳහා වූ ජාතික අය-වැය මගින් කාබනික පොහොර නිෂ්පාදනය, බෙදාහැරීම සහ අලෙවිය සඳහා වූ සියළුම සෘජු සහ වක්‍ර බදු නිදහස් කොට ඇත. කාබනික පොහොර භාවිතය ඉහළ යාම මගින් රසායනික පොහොර මත යැපීම ඉදිරියේ දී අඩුවනු ඇතැයි අපේක්ෂා කෙරේ.


**අනෙකුත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන උප අංශය 2012 වර්ෂය තුළ දී තවදුරටත් වර්ධනය විය.** මෙම උප අංශයේ සියයට පනහකට වඩා වැඩි දායකත්වයක් සපයන සිමෙන්ති, හුණු සහ බදාම නිෂ්පාදිත, මෙම උප අංශයේ ක්‍රියාකාරිත්වය ප්‍රධාන වශයෙන් මෙහෙයවීය. පෞද්ගලික නිවාස ඉදිකිරීමේ ක්‍රියාකාරකම්හි යම් මන්දගාමීත්වයක් තිබුණද, රජය විසින් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා දියත් කරන ලද ව්‍යාපෘතීන් සහ වාණිජ ඉදිකිරීම්වල වූ ක්‍රියාකාරිත්වය දේශීය වෙළෙඳපළේ සිමෙන්ති නිෂ්පාදනයට දායක විය. වීදුරු සහ වීදුරු ආශ්‍රිත නිෂ්පාදන ද 2012 වසරේ දී වර්ධනය විය. කෙසේවුවද කොන්ක්‍රීට්, බදාම, පෝසිලේන් සහ පිඟන් මැටි ආශ්‍රිත නිෂ්පාදනවල වාර්තා කළ පහත වැටීම, සිමෙන්ති නිෂ්පාදනය පුළුල් වීමෙන් ඇති වූ වර්ධනීය බලපෑම යම් දුරකට නිශේධනය විය.

**බෝතල් කළ ජලය සහ සිසිල් බීම වැනි මධ්‍යසාර නොවන පාන හා බීර වර්ග නිෂ්පාදනයේ වර්ධනයක් වාර්තා කළ ද, මත්පැන් නිෂ්පාදනයේ පහත වැටීම හේතුවෙන් 2012 වසර තුළ දී පාන වර්ග නිෂ්පාදන උප අංශයේ පහත වැටීමක් පෙන්වීය.** 2012 දී මත්පැන් නිෂ්පාදනයට අදාළ සුරාබදු ඉහළ දැමූ අතර, මේ හේතුවෙන් මත්පැන් මිල ඉහළ යාම නිසා ස්ප්‍රීතු සෑදීම, පිරිපහදු කිරීම සහ මිශ්‍ර කිරීම යන අංශවල පහත වැටීමක් දක්නට ලැබුණි. එනමුත්, 2012 දී බීර නිෂ්පාදනය ඉහළ යන ලදී. මත්පැන් නිෂ්පාදන හා අදාළව පාරිභෝගික රටාව වෙනස්වීම මෙන්ම සංචාරක කර්මාන්තයේ පුළුල් වීම ද මෙම ඉහළ යාමට හේතු විය හැකිය. පාන වර්ග නිෂ්පාදනයෙන් සියයට 25 කට පමණ දායකත්වයක් ලබා දෙන සිසිල් බීම, පානීය ජලය සහ බෝතල් කළ ජලය නිෂ්පාදනය සියයට 10 ට ආසන්නව ඉහළ වර්ධනයක් පෙන්වීය.

**2012 වසරේ දී දුම්කොළ නිෂ්පාදනයේ අඩුවීමක් වාර්තා විය.** ඉහළ සුරාබදු අයකිරීම හේතුවෙන් දුම්කොළ නිෂ්පාදනවල මිල ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස එහි දේශීය ඉල්ලුම පහත වැටීමෙන් නිෂ්පාදනය අඩු වීමට යම් බලපෑමක් විය. දුම්කොළ නිෂ්පාදන අංශයේ ඉල්ලුම පහත වැටීමට මෑත කාලයේ සිදු වූ මිල සංශෝධන මෙන්ම දුම්කොළ භාවිතයෙන් ඇතිවන ප්‍රතිවිපාක සම්බන්ධයෙන් පාරිභෝගිකයන්ගේ සැලකිල්ල වැඩි වශයෙන් යොමුවීම ද සඳහන් කළ හැක.

**වසර තුළ දී ආහාර උප අංශයේ කර්මාන්තවල මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් වාර්තා විය.** කාර්මික නිෂ්පාදන දර්ශකයේ ආහාර නිෂ්පාදන අංශයෙන් සියයට 20 ක පමණ දායකත්වයක් සපයන කිරි නිෂ්පාදන අංශයේ නිෂ්පාදනය වසර තුළ දී පහත වැටුණි. දේශීයව

**2.4 රූප සටහන** **කාර්මික නිෂ්පාදනයේ සංයුතිය 2012**



නිපදවන නැවුම් කිරි, දේශීය කිරි නිෂ්පාදන අංශයේ කිරි අවශ්‍යතාවයෙන් තුනෙන් එකක පමණ ප්‍රමාණයකට පමණක් ප්‍රමාණවත් වන බැවින්, ආනයනය කළ පිටිකළ කිරි නිෂ්පාදන මත විශාල වශයෙන් යැපෙන කිරි නිෂ්පාදිත සැකසීම් අංශයේ ක්‍රියාකාරිත්වය සඳහා රුපියලේ අගය අවප්‍රමාණය වීමත්, දේශීය කිරි කර්මාන්තය ආරක්ෂා කර ගැනීමට ආනයනය කරනු ලබන කිරි නිෂ්පාදන මත ඉහළ තීරු බදු පැනවීමත් වඩාත් බලපා ඇත. තිරිඟු මත ඉහළ ආනයන බදු පැනවීමත්, දේශීය වෙළෙඳපොළ තුළ තිරිඟු පිටිවල පාලන මිල ඉහළ යන ලෙස ගැලපුමත්, සහල් පරිභෝජනයේ ඉහළ යාමත් හේතුවෙන් ආහාර නිෂ්පාදන උප අංශයේ සියයට 30 ක පමණ බරතැබීමක් හිමි බේකරි නිෂ්පාදනවල ද පහත වැටීමක් 2012 වසරේ දී වාර්තා විය. පිෂ්ඨමය සහ පිෂ්ඨමය නිෂ්පාදන උප අංශයට, අපනයනය සඳහා තිරිඟු පිටි සැකසීම ඇතුළත් වන අතර, මෙම ද්‍රව්‍ය අපනයන කරන ප්‍රධාන රටවල් විසින් පැනවූ ඉහළ බදු නිසා මෙම වසරේ දී මෙම කාණ්ඩයේ නිෂ්පාදන පහත වැටුණි. මෙම උප අංශවල ක්‍රියාකාරිත්වයට පටහැනිව මාළු සැකසීම, සහ කල්තබා ගැනීමේ අංශය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 25.2 ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළේය. මෙම වර්ධනයේ දායකත්වය කෙරෙහි පසුගිය වසර කිහිපයක සිට ධීවර යාත්‍රා සංඛ්‍යාවේ ඉහල යාමත්, මාළු ටින් කිරීම සඳහා කර්මාන්ත ශාලා පිහිටුවීමත් මෙන්ම උතුරු හා නැගෙනහිර පළාත්වල මත්ස්‍ය කර්මාන්තය සංවර්ධනය කෙරෙහි රජය විසින් ගන්නා නොයෙකුත් පියවර හේතුවිය. මේ අතර, නූඩ්ල්ස්, මැකරෝනි වැනි ආහාර වර්ග නිෂ්පාදනය ආසන්න වශයෙන් සියයට 20 ක පමණ සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළ අතර, සංචාරක ව්‍යාපාරයේ වර්ධනය ඊට සැලකිය යුතු දායකත්වයක් දක්වන ලදී. සොසේජස් වැනි ආහාර ඇතුළත් සකස් කළ ආහාර නිෂ්පාදිත ද සියයට 7 ක පමණ වර්ධනයක් වාර්තා කළේය.

**2012 වසරේ දී ගල් අඟුරු සහ පෙට්‍රෝලියම් නිෂ්පාදිත පසුබෑමකට ලක්විය.** ඇමෙරිකා එක්සත් ජනපදය විසින් ඉරානය මත පනවන ලද සම්බාධක හේතුවෙන්, ශ්‍රී ලංකාව විසින් ඉරානයෙන් ආනයනය කරන බොරතෙල් සැපයුමට බාධා ඇති වූ අතර එය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පිරිපහදුවල ධාරිතා උපයෝජනය අඩුවීමට හේතු විය. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පිරිපහදු වඩාත් යෝග්‍ය වන්නේ ඉරානියන් ලයිට් (Iranian Light) වර්ගයේ බොරතෙල් පිරිපහදුවට වන අතර, විශේෂයෙන් අඩංගු සල්ෆර් ප්‍රමාණය වෙනස් වීම හේතුවෙන් එම බොරතෙල් වෙනත් රටවල නිපදවන බොරතෙල්වලට වඩා සංයුතියෙන් වෙනස් වේ. ඉරානියන් ලයිට් වර්ගයේ බොරතෙල් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පිරිපහදුවල පිරිපහදු කිරීමෙන් වඩාත් ඉහළ ප්‍රතිලාභ අත්වන නමුත්, ඉරානයෙන් බොරතෙල් ආනයනය අඩුවීම හේතුවෙන් මෙම උප අංශයේ නිෂ්පාදනය ද සැලකිය යුතු ලෙස පහත වැටුණි. 2011 වසරේ දී මෙට්‍රික් ටොන් 1,932,000 ක් වූ ඉරානයෙන් සිදුකළ බොරතෙල් ආනයනය 2012 වසරේ දී මෙට්‍රික් ටොන් 834,000 ක් දක්වා සියයට 56.8 කින් පහත වැටුණු අතර, 2012 වසරේ දී සමස්ත බොරතෙල් ආනයනය සියයට 28.2 කින් පහත වැටුණි. බොරතෙල් ආනයනයේ මෙම පහත වැටීමත් සමඟ 2012 වසරේ දී ඩීසල් සහ පෙට්‍රල් නිෂ්පාදනය ද පිළිවෙළින් සියයට 18.0 කින් සහ 26.7 කින් පහත වැටුණි. එමෙන්ම, ගුවන් යානා ඉන්ධන, ද්‍රව පෙට්‍රෝලියම් වායුව සහ දැවි තෙල් නිෂ්පාදනය ද පිළිවෙළින් සියයට 40.0 කින්, සියයට 27.6 කින් සහ සියයට 16.7 කින් පහත වැටුණි.

### කාර්මික ප්‍රතිපත්ති හා ආයතනික අනුග්‍රහය

**2012 දී රජය විසින් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය තුළින් ප්‍රාදේශීය කර්මාන්ත සංවර්ධන ප්‍රතිපත්තිය අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.** කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා වූ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු දිවයිනේ විවිධ පළාත්වල කාර්මික ජනපද පිහිටුවීම තුළින් තවදුරටත් සිදුකරන ලදී. උතුරු හා නැගෙනහිර පළාත්වල "වඩක්කිල් වසන්තම්" හා "නැගෙනහිර නවෝදය" වැඩසටහන් හා සමගාමීව කාර්මික ජනපද සංවර්ධන වැඩකටයුතු ද තවදුරටත් සිදුකරන ලදී. මේ අනුව, ත්‍රිකුණාමලයේ ඉදිකෙරෙමින් පවතින කාර්මික ජනපදයේ දෙවන අදියරෙන් සියයට පනහක් ද, මන්නාරම කාර්මික ජනපදයේ සංවර්ධන කටයුතු වලින් සියයට හැටක් ද 2012 වසර අවසන් වන විට නිම කරන ලදී. තවද, වවුනියාවේ කාර්මික ජනපදයක් ඉදිකිරීමට යෝග්‍ය භූමියක් හඳුනාගෙන ඇති අතර, ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ද ලැබී ඇත. කර්මාන්ත අමාත්‍යාංශය විසින් උතුරු පළාතේ සංවර්ධනය කිරීමට උචිත කර්මාන්ත ලෙස ලුණු ආශ්‍රිත කර්මාන්ත, මසුන් ඇල්ලීමට උපයෝගී කරගන්නා ආම්පන්න නිෂ්පාදනය, බෝට්ටු නිෂ්පාදනය, මත්ස්‍ය සැකසුම් හා තල් ආශ්‍රිත නිෂ්පාදිත හඳුනාගෙන ඇත. මතුගම (පල්ලේගොඩවත්ත) කාර්මික ජනපදයේ මූලික කටයුතු අවසන් කෙරෙමින් පවතින අතර එහි යටිතල පහසුකම් සංවර්ධනය 2013 වසරේ දී ඇරඹීමට නියමිතය.

**කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කළ බලශක්ති කාර්යක්‍ෂමතාවය, අපද්‍රව්‍ය කළමනාකරණය හා ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ වැඩසටහන් තුළින් ඵලදායීතාව වර්ධනය කිරීම උදෙසා රජයේ කැපවීම පෙන්නුම් කරන ලදී.** හෝමාගම, මාකඳුර සහ දංකොටුව කාර්මික ජනපදවල පිහිටුවන ලද කර්මාන්ත ශාලා 15 ක්, "බලශක්ති කාර්යක්‍ෂමතා වැඩිදියුණු කිරීමේ" වැඩසටහනට ඇතුළත් වූ අතර කර්මාන්තශාලා පහක පුළුල් බලශක්ති විගණන වැඩසටහන් අරඹා ඇත. මේ අතර කාර්මික අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනක් සහ කර්මාන්ත අංශයේ අපද්‍රව්‍ය හුවමාරුව මගින් අතුරු නිෂ්පාදිත වැඩි දියුණු කිරීමේ වැඩසටහනක් මීට සමාන්තරව ක්‍රියාත්මක වෙමින් පවතී. එමෙන්ම, කොන්ක්‍රීට් හා සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදිතවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමෙන් වැඩසටහනක් අමාත්‍යාංශය විසින් දියත් කර ඇති අතර මේ තුළින් කාර්මික ඵලදායිතාවය දියුණු කිරීම සහ වේගයෙන් වර්ධනය වෙමින් පවතින ඉදිකිරීම් ක්ෂේත්‍රයට පහසුකම් සැපයීම අරමුණු කරගෙන ඇත.

**වෙනත් රාජ්‍ය ආයතනවලද සහභාගිත්වයෙන් සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායකයින් සඳහා රජයේ ප්‍රධානතම ආයතනය වන ජාතික ව්‍යවසායය සංවර්ධන අධිකාරිය (NEDA) විසින් කර්මාන්ත සඳහා අනුග්‍රහය ලබා දෙන ලදී.** ජාතික ව්‍යවසායය සංවර්ධන අධිකාරිය විසින් "ගමට ඔබින ව්‍යාපාර" වැඩසටහන ප්‍රාදේශීය මට්ටමෙන් ක්‍රියාත්මක කරන ලද අතර මෙමගින් ව්‍යවසායකයින් යෝග්‍ය කර්මාන්ත වෙත යොමු කරන ලදී. එමෙන්ම, ජාතික ව්‍යවසායය සංවර්ධන අධිකාරිය විසින් "දිවි නැගුම" ගෘහ කර්මාන්ත වැඩසටහන යටතේ තෝරාගත් ව්‍යවසායකයින් සඳහා අවශ්‍ය ශිල්පීය පුහුණුව ලබා දෙන ලදී. සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාරවලට අදාළ සේවා වෙළෙඳපොළ, ප්‍රතිපත්ති හා නියාමන රාමුවට අදාළ ගැටළුවලට විසඳුම් ලබාදීම සඳහා කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය විසින් "දිස්ත්‍රික් ව්‍යවසායය සංසද" දිවයින පුරා පිහිටුවන ලදී.

**නව නිපැයුම් දිරිමත් කිරීමේ අරමුණින් තාක්ෂණික හා පර්යේෂණ කටයුතුවලට නැඹුරු පරිසරයක් සංවර්ධනය කිරීම සඳහා රජය තවදුරටත් කටයුතු කරන ලදී.** කැනේඩියානු ආයතනයක් වන ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානයේ (IDRC) මූල්‍ය අනුග්‍රහය ඇතිව, ජාතික විද්‍යා පදනම (NSF) විසින් නැනෝ තාක්ෂණය යොදා ගැනීම සහ එය උපයෝගී කර නව නිපැයුම් නිපදවීම සම්බන්ධව ජාතික නීතිමය රාමුවක් සකස් කිරීමට යොමු වී ඇත. තවද, නැනෝ තාක්ෂණික උද්‍යානයට අයත් ජාතික විශිෂ්ටත්ව මධ්‍යස්ථානයේ පළමු අදියරේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලදී. මේ අනුව පර්යේෂණ හා නවෝත්පාදන මධ්‍යස්ථානය, තාක්ෂණ වාණිජකරණ මධ්‍යස්ථානය, ඉන්කියුබේටර් මධ්‍යස්ථානය සහ කළමනාකරණ මධ්‍යස්ථානය හා අදාළ කටයුතු ආරම්භ කරන ලදී. මේ අතර ජාතික ව්‍යවසායය සංවර්ධන අධිකාරිය විසින් මැලේසියාවේ තාක්‍ෂණික සංවර්ධන ආයතනය හා එක්ව තාක්ෂණික සංවර්ධන අරමුදලක් ඇරඹීම සඳහා ශක්‍යතා අධ්‍යයනයක් කිරීම ආරම්භ කර ඇත. මෙම අරමුදලෙන් සුළු හා මධ්‍ය පරිමාණයේ ආයතන සඳහා අවශ්‍ය තාක්ෂණය සැපයීම, ආරම්භක ප්‍රාග්ධනය ලබාදීම සහ වාණිජකරණයට සහාය වීම තුළින් තාක්‍ෂණය භාවිතයට අනුග්‍රහය දැක්වීමට බලාපොරොත්තු වේ.

**උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල කර්මාන්ත සංවර්ධනය සඳහා විවිධ රාජ්‍ය ආයතන විසින් පියවර ගන්නා ලදී.** කර්මාන්ත සංවර්ධන මණ්ඩලය විසින් මන්නාරම, මුලතිව් සහ කිලිනොච්චිය යන දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් කාර්යාල ඉදිකරන ලද අතර මේවායේ කටයුතු 2013 වසරේ දී ඇරඹීමට නියමිතය. මේ අතර, අච්චුවේලි කාර්මික ජනපදය ඉන්දියානු රජයේ ආධාර ඇතිව පුනරුත්ථාපනය කිරීමට නියමිතව තිබේ. මීට අදාළ මූලික වැඩකටයුතු නිම වී ඇති අතර දුරකථන පහසුකම්, විදුලි බලය සහ අභ්‍යන්තර මාර්ග පද්ධතිය සංවර්ධනය සඳහා ශ්‍රී ලංකා රජය හා ඉන්දියානු රජය එකඟතා ගිවිසුමකට එළඹ ඇත. ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය (CNCI) විසින් උතුරු සහ නැගෙනහිර පළාත්වල කුඩා, සුළු සහ මධ්‍ය පරිමාණයේ ව්‍යාපාරවල කාර්යක්ෂමතාවය සහ ව්‍යාපාරික විශිෂ්ටත්වය දිරිමත් කිරීමේ අරමුණින් තම සේවාවන් ලබා දෙන ලදී.

**පවත්නා බදු ව්‍යුහය වඩා තාර්කීකරණය කිරීමේ අරමුණින් 2012 වසර තුළ දී, ලංකා ආයෝජන මණ්ඩලය යටතට ගැනෙන ආයෝජන සඳහා වන ආයෝජන දිරිගැන්වීම් මාලාව විධිමත් කරන ලදී.** මේ අනුව ලංකා ආයෝජන මණ්ඩලයට අදාළ නීතීන් ආදායම් බදු දෙපාර්තමේන්තු පනත හා ගළපන ලද අතර ඊට අදාළව පනත් හයක් සංශෝධනය කරන ලදී. මෙම සංශෝධිත පනත් අතර 2012 අංක 7 දරන එකතු කළ අගය මත බදු (සංශෝධිත) පනත, 2012 අංක 8 දරන ආදායම් බදු (සංශෝධිත) පනත, 2012 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධිත) පනත, 2012 අංක 10 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු (සංශෝධිත) පනත, 2012 අංක 11 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධිත) පනත, 2012 අංක 12 දරන මූල්‍ය පනත ඇතුළත් වේ. මෙම නව දිරිගැන්වීම් මාලාව සුළු, මධ්‍යම සහ විශාල පරිමාණයේ යන කර්මාන්ත අංශ තුන අරමුණු කර ඇත. විශාල පරිමාණයේ කර්මාන්ත දිරිගැන්වීමේ අරමුණින් වසර 6 - 12 දක්වා බදු විවේක කාලයක් හඳුන්වා දෙන ලදී. ආනයන ආදේශක කර්මාන්ත දිරිගැන්වීම සඳහා රෙදිපිළි, බෙහෙත්,

**විශේෂ සටහන 4**

## ශිල්පීය ව්‍යවසායය පරිසරයක් සඳහා ශිල්පීය ව්‍යවසායය ඉන්කියුබේටර් සංවර්ධනය කිරීම

තාක්ෂණික ශිල්ප ක්‍රම උපයෝගී කෙරෙන ව්‍යාපාරයක නියැලෙන ව්‍යවසායකයෙක් ශිල්පීය ව්‍යවසායකයෙක් ලෙස හැඳින්වේ. මීට ඉතා යෝග්‍ය උදාහරණ ලෙස, තොරතුරු තාක්ෂණ කර්මාන්තයෙන් මෙන්ම විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික ආම්පන්න කර්මාන්තවලින් ලොව ප්‍රචලිත ශිල්පීය ව්‍යවසායකයින් විදහා දැක්විය හැක. මෙම ශිල්පීය ව්‍යවසායකයින් ඔවුන්ගේ රටවල්වල ඇති වූ වේගවත් තාක්ෂණික දියුණුවට මූලික වූ අතර මේ තාක්ෂණික දියුණුව තුළින් ඒ රටවල් ඉහළ ආර්ථික වර්ධනයක් ළඟාකර ගත්තේය. තාක්ෂණික වටිනාකමක් ඇති ව්‍යාපාරික අදහස් ඉහළ එකතු කළ අගයක් සහිත අලෙවි කළ හැකි නිෂ්පාදිත බවට පත් කිරීමට, ශිල්පීය ව්‍යවසායය දිරිගන්වන පරිසරය රුකුලක් වන අතර, මෙමගින් අපනයන විවිධාංගීකරණය තුළින් කලාපීය හා දේශීය තරගකාරීත්වය ද වැඩි දියුණු වනු ඇත. මේ අනුව, බොහෝ රටවල්, විශේෂයෙන් ම, දකුණු අපරදිග ආසියානු රටවල් ශිල්පීය-ව්‍යවසායය පරිසරයක් ගොඩනැඟීම ආර්ථික සංවර්ධනයට ඇති වඩාත් කඩිනම් මඟ ලෙස තෝරාගත් අතර, මෙම ශිල්පීය ව්‍යවසායය දිරිමත් කිරීමේ ප්‍රතිපත්ති “ශිල්පීය ව්‍යවසායය ඉන්කියුබේටර්” තුළින් ක්‍රියාත්මක කර ඇත. තවද, ශිල්පීය ව්‍යවසායය ඉන්කියුබේටර් නැගී එන ආර්ථික බොහොමයක ජාතික මට්ටමේ උපාය මාර්ගවල වඩා ප්‍රචලිත වෙමින් පවතින අතර, මෙමගින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය සංවර්ධනය තුළින් ග්‍රාමීය ජන කොටස්වල ආර්ථික ගැටළු විසඳීමේ හැකියාව ඇති වේ. එමනිසා, ශිල්පීය ව්‍යවසායය ඉන්කියුබේටර් ප්‍රවර්ධනය තුළින් ශිල්පීය ව්‍යවසායය පරිසරයක් නිර්මාණය කිරීම ශ්‍රී ලංකාවට ද වැදගත් වන අතර ඉන් වඩා ඉහළ ජාතික ආදායම් තලයකට ළඟාවීමටත්, නව්‍යතා ප්‍රවර්ධනය හා එම නව්‍යතා වාණිජ අවශ්‍යතා සඳහා යොදා ගැනීමෙන් ආර්ථිකය තවදුරටත් විවිධාංගීකරණය තුළින් ස්ථායී ආර්ථික වර්ධන මට්ටමක් ළඟා කර ගැනීමටත් හැකි වනු ඇත.

ශිල්පීය ව්‍යවසායය ඉන්කියුබේටරයක් (Technology Business Incubator) යනු නව්‍ය තාක්ෂණික අදහස් පෝෂණය කරමින් ඒවා අධිතාක්ෂණික වාණිජ ව්‍යාපාර දක්වා පුළුල් කෙරෙන භෞතික හෝ භෞතික නොවන ඒකකයකි. ප්‍රවීන තාක්ෂණික සේවා සපයන, තාක්ෂණික දැනුම පවරන සහ දේශීය අවශ්‍යතාවයන් අනුව තාක්ෂණය ගැලපීමෙහි නියැලෙන ව්‍යවසායය ඉන්කියුබේටර් ද ශිල්පීය ව්‍යවසායය ඉන්කියුබේටර් ලෙස හැඳින්වේ. සාමාන්‍යයෙන්, ශිල්පීය ව්‍යවසායය ඉන්කියුබේටර් මගින්, නවෝත්පාදකයින්ට සහ අලුතින් ඇරඹූ කර්මාන්ත සඳහා ඔවුන්ගේ සංවර්ධන චක්‍රයේ මුල් අවධිවල හා වෙනස්වීම් සිදුවන අවධිවල ඔවුන්ට අවශ්‍ය විවිධ ආධාරක සේවා සපයනු ලැබේ. මෙම ආධාරක සේවා අතරට නිපුණතා සංවර්ධනය, මූල්‍යයන පහසුකම්, තොරතුරු සේවා, නීතිමය උපදේශක සේවා, අධිවේගී අන්තර්ජාල පහසුකම්, සාමූහික කාර්යාල අවකාශ පහසුකම් සහ සංවර්ධන උපාය මාර්ගය සැකසීමේ දී උපකාර කිරීම ආදිය ඇතුළත් වේ. මෙම ඉන්කියුබේටර්, බැංකු ණය සහ ආරම්භක ප්‍රාග්ධනය සපයන සේවාවලින් වෙනස් වනුයේ, මූල්‍ය සහ ව්‍යාපාරික ආධාරක සේවා හැරුණුවිට, මෙම ආයතන විසින් පර්යේෂණ හා සංවර්ධනයට උචිත පරිසරයක් ඇති කරමින් සුදුසු තාක්ෂණය ලබාදීමේ කටයුතුවලද ක්‍රියාකාරීව නියැලෙනු ලැබීම වේ. කෙසේ වුවද, ඉන්කියුබේටර් මූල්‍ය ආයතන සහ ආරම්භක ප්‍රාග්ධනය සපයන සේවා හා සම්බන්ධව කටයුතු කරනු දැකිය හැකි අතර මීට ප්‍රධාන හේතුව වන්නේ ඉන්කියුබේටරයේ මූලික ක්‍රියාකාරීත්වය සඳහා මෙම සේවාවන් අත්‍යාවශ්‍ය වීමයි. සාමාන්‍යයෙන්, මෙම ශිල්පීය ව්‍යවසායය ඉන්කියුබේටර්, නව නිෂ්පාදිත අදහස් වඩාත්ම හොඳින් ජනනය වන තෘතීයික අධ්‍යාපනික පද්ධතීන් තුළ පිහිටුවනු ලැබේ. බොහෝ අවස්ථාවල දී ප්‍රධාන තාක්ෂණික ආයතනවලට අනුබද්ධව ද මෙම ආයතන පවතින අතර, රැකියා පුහුණු අවස්ථා ඇති කිරීම, තාක්ෂණික දැනුම ලබාදීම මෙන්ම නව නිෂ්පාදිත අදහස් මිලදී ගෙන වාණිජ කර්මාන්ත බවට සංවර්ධනය කිරීම වැනි සේවාවන් මෙම ආයතනය විසින් සපයනු ලැබේ. සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායක අංශය සංවර්ධනයේදී තාක්ෂණික දැනුම ලබාදීම සහ නව්‍යතා ප්‍රවර්ධනය ඉතා අත්‍යවශ්‍ය වන අතර, මේ සඳහා ජාතික මට්ටමින් ශිල්පීය ව්‍යවසායය ඉන්කියුබේටර් පිහිටවනු ලැබේ. තවද, වඩා විශාල විද්‍යා උද්‍යානවල මූලික අංගයක් වශයෙන් ද මෙම ඉන්කියුබේටර් පිහිටුවනු ලැබේ.

ශිල්පීය ව්‍යවසායය ඉන්කියුබේටර් සංකල්පය, බටහිර රටවල් වලින් ඇරඹුන ද, වර්තමානයේ නැගී එන ආර්ථිකයන් විසින් අධි තාක්ෂණික අපනයන සහ තාක්ෂණික සංවර්ධනය තුළින් ඉතා ඉහළ ආර්ථික වර්ධනයක් ළඟාකර ගැනීම සඳහා මෙම සංකල්පය අනුකරණය කිරීම දැකිය හැකිය. උදාහරණයක් වශයෙන්, භෞතික සම්පත් පාදක කරගත් ආර්ථිකයක සිට දැනුම පාදක කරගත් ආර්ථිකයක් ලෙස සංවර්ධනය වූ මැලේසියාවේ, පුළුල් ජාතික ඉන්කියුබේටර් වැඩසටහනක් දියත් කිරීමෙන් ශිල්පීය ව්‍යවසායකයින් දිරිමත් කරන ලදී. එමෙන්ම ග්‍රාමීය කාන්තාවන් දිරිමත් කිරීමේ වැඩසටහන් සහ ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් සඳහා මෙම සංකල්පය මූලික අනුග්‍රහයක් දක්වා ඇත. විද්‍යාව සහ තාක්ෂණය පෙරදැරිව ග්‍රාමීය ආර්ථිකය සංවර්ධනය ඉලක්ක කරගත් චීනයේ ස්පාර්ක් වැඩසටහන මෙවැනි පුරෝගාමී උත්සාහයක් විය. මදුරාසියේ පිහිටි ඉන්දියානු තාක්ෂණික ආයතනයට

අයත් ග්‍රාමීය ශිල්පීය ව්‍යවසායක ඉන්කියුබේටරය (Rural Technology Business Incubator at Indian Institute of Technology Madras), චීනයේ ටියැන්ජින් කාන්තාවන්ගේ ඉන්කියුබේටරය (Tianjin Women's Incubator) සහ ඉන්දියාවේ තිරුචිරාප්පල්ලි ග්‍රාමීය ඉංජිනේරු විද්‍යාලයට අයත් විද්‍යා හා තාක්ෂණික ව්‍යවසාය උද්‍යානය (Tiruchirappalli Regional Engineering College-Science and Technology Entrepreneurs Park) අනෙකුත් නිදසුන් ලෙස දැක්විය හැක. කෙසේ නමුදු, මෑතක් වන තුරු ශ්‍රී ලංකාවේ මෙම සංකල්පය ප්‍රචලිත නොවීය. එනමුත්, අපනයන විවිධාංගීකරණය තුළින් ඉහළ එකතුකළ අගයක් ඇති නිෂ්පාදිත දිරිගැන්වීම සඳහා මෙන්ම සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසාය සංවර්ධනයේ වැදගත්කම වැඩි වීම හේතුවෙන් ජාත්‍යන්තර ඒජන්සිවල මූල්‍යාධාර ද ඇතිව තෘතීයික අධ්‍යාපන ආයතන කිහිපයකම මෙම සංකල්පය ක්‍රියාත්මක කරන ලදී. මේ ආකාරයෙන් තොරතුරු තාක්ෂණය, ඉංජිනේරු ශිල්පය, විද්‍යාව හා කෘෂිකර්මය යන අංශවල ශිල්පීය ව්‍යවසාය ඉන්කියුබේටර් පිහිටුවන ලද නමුත්, වර්තමානයේ මෙම ඉන්කියුබේටර්වල ඇත්තේ අවම ක්‍රියාකාරිත්වයකි.

**මොරටුව විශ්ව විද්‍යාලයේ විද්‍යුත් හා ඉලෙක්ට්‍රානික තාක්ෂණ ඉන්කියුබේටරය**

මෙම ප්‍රයත්නයේ නව උත්සාහයක් ලෙස 2011 වර්ෂයේ දී, මොරටුව විශ්ව විද්‍යාලය හා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශ අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමෙන් විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික තාක්ෂණ ඉන්කියුබේටරයක් (Electrical and Electronic Technology Incubator - EETI) පිහිටුවන ලදී. නව්‍යතා දිරිගැන්වීම සහ ව්‍යවසාය සංවර්ධනය තුළින් විද්‍යුත් ආම්පන්න සහ ඉලෙක්ට්‍රොනික උපකරණ කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් රජය විසින් මෙම පියවර ගන්නා ලදී. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයෙන් මූල්‍යයන පහසුකම් ලබන මෙම විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික තාක්ෂණ ඉන්කියුබේටරය විසින් විශ්ව විද්‍යාලයේ දැනටමත් පවතින සම්පත් පරිහරණය කරමින් එහි සාමාජිකයින්ට ඉන්කියුබේටර් සේවා ලබා දෙනු ඇත. මෙම විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික තාක්ෂණ ඉන්කියුබේටරය විසින් අද වන විට අධි තාක්ෂණික කර්මාන්ත දක්වා වර්ධනය වීමට හැකියාවක් ඇති නව්‍යතා කිහිපයක්ම ජනනය කර ඇති නමුත්, එය තවමත් ප්‍රාරම්භක අවදියක වේ. ඒ හේතුවෙන් මෙම නවෝත්පාදකයින් නොයෙක් සීමාකිරීම්වලට මුහුණපා ඇති අතර මෙම නව්‍යතා වාණිජකරණ මට්ටමට ගෙන ඒම පිණිස මෙම අවශ්‍යතා සඳහා විසඳුම් ලබාදිය යුතුව ඇත. ප්‍රමාණවත් භෞතික කාර්යාල පහසුකම් නොමැති වීම, මූල්‍යනය සහය සීමා වීම, විශ්වාසනීය සැපයුම්කරුවන්, විශේෂිත උපකරණ සහ වෘත්තීමය මඟ පෙන්වන්නෙකු නොමැතිවීම සහ ව්‍යාපාර කරගෙන යාමේ දී මුහුණපාන අවහිරතා යන්න මෙම සීමාකිරීම් තුළට ඇතුළත් වේ. කෙසේ වුවද, ශිල්පීය ව්‍යවසායට සුදුසු පරිසරයක් ගොඩනැංවීම සඳහාත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායය අංශයට සහය වීමටත් මෙම විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික තාක්ෂණ ඉන්කියුබේටරය වඩා ප්‍රවීන මට්ටමකට ගෙන ආ යුතුව තිබේ. තවද, මෙම ශිල්පීය ව්‍යවසායය ඉන්කියුබේටර් සංකල්පය වෙනත් තෘතීයික අධ්‍යාපනික ආයතන වෙත ද, ජාතික විද්‍යා උද්‍යාන හා අඩු සංවර්ධිත ප්‍රදේශ කරා තවදුරටත් පුළුල් කිරීම තුළින් ශිල්පීය කර්මාන්ත සංවර්ධනය ප්‍රවර්ධනය කළ යුතු වේ.

**ඉදිරි දැක්ම**

වත්මන් රාජ්‍ය ප්‍රතිපත්තිය විසින් පර්යේෂණ හා සංවර්ධනය, ව්‍යවසායකත්වය සහ ග්‍රාමීය සංවර්ධනය නැංවීමට උචිත පරිසරයක් සකසා ඇත. කෙසේ නමුත්, දේශීය වාතාවරණයට ඉතා උචිත වන ශිල්පීය ව්‍යවසායය ඉන්කියුබේටර් ගොඩනැංවීම තුළින් මෙම විවිධ අංශ සංවර්ධනය කෙරෙහි සාමූහික ප්‍රයත්නයක් මෙතෙක් ගෙන නොමැත.

ශිල්පීය ව්‍යවසායය ඉන්කියුබේටර් රටක ආර්ථික සහ සමාජයීය සංවර්ධනය සඳහා යොදාගත හැකි වැදගත් ක්‍රියාවලියකි. මෙම සංකල්පය ව්‍යවසායකයින් සඳහා යෝග්‍ය පරිසරයක් නිර්මාණය කරන හෙයින් "ශිල්පීය ව්‍යවසායය පරිසර පද්ධතියක්" සඳහා අත්‍යවශ්‍ය අංගයක් වේ. එමෙන්ම, ආර්ථිකයේ සුවිශේෂී අංගයක් වන ග්‍රාමීය සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශය සංවර්ධනයට ආයක වීම තුළින් ප්‍රාදේශීය සංවර්ධනය, කාන්තාවන්ට බලය පැවරීම සහ ජීවන මට්ටම් ඉහළ නැංවීම ආදිය සිදුවනු ඇත. ව්‍යාපාර ජීවන චක්‍රයේ මුල් අවධිය තුළ ලබන ආධාරක සේවා හේතුවෙන් පසු කාලයේදී මෙම නව ව්‍යාපාරවලට සාර්ථක ව්‍යාපාර ක්‍රියාකාරිත්වයක් අත්කර ගැනීමට හැකිවෙනු ඇත. තාක්ෂණික ශිල්ප ක්‍රම හඳුන්වා දීම තුළින් ඵලදායීතාව හා ව්‍යාපාරවල නිෂ්පාදන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමට උපකාර වනු ඇත.

එමනිසා, රජයෙත්, ජාත්‍යන්තර ආයතනවලත් පෞද්ගලික අංශයෙත් සාමූහික ක්‍රියාකාරිත්වය තුළින් ශිල්පීය ව්‍යවසායය සඳහා උචිත පරිසරයක් නිර්මාණය කිරීම ඉතා වැදගත් වේ. ජාතික ප්‍රතිපත්ති රාමුව තුළින් මෙම සංකල්පය, ග්‍රාමීය හා සුළු ජන කොටස් දක්වා හඳුන්වා දීමට අරමුණු කරගත යුතුයි. තෘතීයික අධ්‍යාපනික ආයතන, කර්මාන්ත සහ රජය යන පාර්ශව අතර සම්බන්ධීකරණය, ජාත්‍යන්තර මූල්‍ය ආයතන සමඟ සාමූහිකව කටයුතු කිරීම, ශක්තිමත් ප්‍රාරම්භක මූල්‍යයන දාමයක් ගොඩනැංවීම, ස්ථිර නීතිමය රාමුවක් හා ව්‍යවසායකයින් දිරිගන්වන බදු ප්‍රතිපත්ති හඳුන්වා දීම, ව්‍යාපාර කරගෙන යාමේ පහසුව වැඩි දියුණු කිරීම, ඇඩි විද්‍යා හා තාක්ෂණික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම, අදාළ පාර්ශව පුහුණු කිරීම සහ කර්මාන්ත අංශය දැනුවත් කිරීමේ වැඩසටහන් යනාදි අංශ වැඩි දියුණු කිරීම මෙම ප්‍රයත්නයේ ඉදිරි ගමනේදී සැළකිය යුතුව ඇත.

කිරි පිටි සහ සිමෙන්ති කර්මාන්ත සඳහා වසර පහක බදු විවේක කාලයක් සහ ඉන්පසු සියයට 12 ක සහන බදු අනුපාතයක් ලබා දී ඇත. විශාල පරිමාණයේ සහ උපායශීලී ආනයන ආදේශක කර්මාන්ත පුළුල් කිරීම සඳහා ලබාදුන් දිරිගැන්වීම් අතර යන්ත්‍රෝපකරණ ආනයනය සඳහා වන බදු වගකීම කල් දැමීම ඇතුළත් වේ. මේ අතර, රටට ආර්ථික සහ සමාජයීය වාසි ලබාදෙන ව්‍යාපෘති "උපායශීලී සංවර්ධන ව්‍යාපෘති" වශයෙන් වර්ගීකරණය වන අතර, 2008 අංක 14 දරන උපායශීලී සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ විශේෂ දිරිගැන්වීම් ලබා දෙනු ඇත.

**ඇඟලුම් අංශයේ සංවර්ධන උපාය මාර්ග සැකසීමේ දී ඒකාබද්ධ ඇඟලුම් සංගමය විශේෂ කාර්යභාරයක් ඉටු කළේය.** 2012, අංක 12 දරන මූල්‍ය පනත අනුමත වීමත් සමග ඇඟලුම් කර්මාන්තයට අදාළව බදු නිදහස් වෙළෙඳාම, ආයාත ඇඟලුම්වල සුළු අගයක් එකතු කිරීම, ප්‍රධාන ඇඟලුම් මිලදී ගනු ලබන්නන්ගේ ප්‍රධාන කාර්යාල පවත්වාගෙන යාම සහ නිදහස් වරායන් තුළ අනුයාත සේවා ලබාදීම වැනි සංකල්ප වටා ගොඩනැගුණු යෝජිත කලාපීය ඇඟලුම් මධ්‍යස්ථානය ආරම්භ කිරීමට අවශ්‍ය මූලික නීතිමය පසුබිම සකස් කර ඇත. තවද, ජාත්‍යන්තර පිළිගත් වෙළෙඳ නාම සඳහා ශ්‍රී ලංකාවේ වෙළෙඳසැල් විවෘත කිරීමට අවස්ථාව ලබා දෙමින් ඇඟලුම් වෙළෙඳපොළ හා සම්බන්ධ නීති රීති සහ සීමා ලිහිල් කරමින් නිමවුමෙන් සියයට 40 ක් දේශීය වෙළෙඳපොළෙහි අලෙවි කිරීමට අවසර ලබා දී ඇත. තවද, අපනයන හා දේශීය යන දෙ අංශයේම විකුණුම් සඳහා සියයට 12 ක ආදායම් බදු අනුපාතයක් හඳුන්වා දීම තුළින් දේශීය සහ විදේශීය වෙළෙඳපොළ යන දෙඅංශයම ඉලක්ක කර ඇඟලුම් නිෂ්පාදනය වැඩි කිරීමට පියවර ගෙන ඇත. මෙම පියවර සඳහා මුල් වූයේ දේශීය පාරිභෝගිකයින්ට ඉහළ තත්ත්වයේ ඇඟලුම් මිල දී ගැනීමට අවස්ථාව ලබාදීම මෙන්ම සංචාරක කර්මාන්තය දිරිගැන්වීමත් ය. මේ අතර, වෙනත් අපනයනකරුවන්ගෙන් එල්ල වූ දැඩි තරඟකාරිත්වය හමුවේ ඇඟලුම් කර්මාන්තයේ ස්ථායී වර්ධනයක් පවත්වා ගැනීමට ඒකාබද්ධ ඇඟලුම් සංගමය විසින් වෙළෙඳපොළ විවිධාංගීකරණ උපක්‍රම, සුළු හා මධ්‍යම පරිමාණයේ ඇඟලුම් කර්මාන්තකරුවන් පුනරුත්ථාපනය සහ ප්‍රතිරූපය ගොඩනැංවීමේ වැඩසහන් කෙරෙහි යොමු වන ලදී. "ජාතික අනුකූලතා ප්‍රමිතියක්" හඳුන්වා දීම සහ ඉලෙක්ට්‍රොනික රේගු සටහන්කර (E-CUSDEC) පහසුකම තුළින් අඩු පිරිවැයකින් සහ පහසුවෙන් විදේශ වෙළෙඳාම් ක්‍රියාවලියක් පවත්වාගෙන යාමට අවශ්‍ය පරිසරයක් සැපයීම අපේක්ෂා කෙරේ.

**ශ්‍රී ලංකාවේ මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය ගොඩනැංවීමට, 2012 වසරේ දී රජය විසින් විවිධ ක්‍රියාමාර්ග ගන්නා ලදී.** ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් ගම්පහ සහ ගාලු දිස්ත්‍රික්කවල පිහිටුවා ඇති සුළු හා මධ්‍ය පරිමාණ ස්වර්ණාභරණ කර්මාන්තකරුවන් සඳහා අලුත් යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න ලබා දෙන ලදී. මැණික් කැණීම් හේතු කොට ගෙන සිදුවන පාරිසරික හානිය අවම කිරීම සඳහා රජය විසින් පරිසර හිතකාමී කැණීම් තාක්ෂණ සහ පිළිගත හැකි වෙළෙඳ ප්‍රමිතීන් ප්‍රවර්ධනයට පියවර ගෙන ඇත. මේ අනුව යන්ත්‍රසූත්‍ර භාවිතා කරමින් සිදුකරන කැණීම් කටයුතු සඳහා නව චක්‍රලේඛයක් නිකුත් කළ අතර පරිසර හිතකාමී යන්ත්‍රානුසාරයෙන් කෙරෙන කැණීම් කටයුතු සඳහා ආදර්ශමත් ව්‍යාපෘතියක් ලෙස විශේෂ මැණික් කැණීමේ ව්‍යාපෘතියක් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ සෘජු අධීක්ෂණය යටතේ සිදු කෙරුණේය. මේ අතර, බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපළේ දී එ.ජ. ඩොලර් 200 ක සේවා ගාස්තුවක් ශ්‍රී ලංකා රේගුවට ගුවන් තොටුපොළේදීම ගෙවමින් මැණික් ගල් නිදහස් කර ගැනීමට සලස්වමින්, මැණික් අපනයනය සඳහා වූ බදු රෙගුලාසි ලිහිල් කර ඇත. 2012 අය-වැයෙන් හඳුන්වා දුන් මෙම ක්‍රියාමාර්ගය හේතුවෙන් ප්‍රතිඅපනයනය සඳහා ඔප නොදැමූ මැණික් ගල් ආනයනය ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**දේශීය කර්මාන්තකරුවන් සඳහා යෝග්‍ය ආර්ථික පසුබිමක් සැකසීම සඳහා විවිධ කර්මාන්ත මණ්ඩල විවිධ කටයුතුවල නිරත විය.** ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය (CNCI) විසින් ආහාරවල සුරක්ෂිතභාවය සහ ප්‍රමිතීන් සම්බන්ධව, සකස් කළ ආහාර සපයන කර්මාන්තකරුවන්ට සහ සංචාරක හෝටල් සඳහා පුහුණුවක් ලබාදීමට ජාත්‍යන්තර පිළිගැනීමක් ඇති ක්‍රියාපටිපාටියක් හඳුන්වා දී ඇත. ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය විසින් මේ සම්බන්ධයෙන් සංචාරක අමාත්‍යාංශය සමඟ විශේෂ එකඟතා ගිවිසුමක් ද අත්සන් කර ඇත. ශ්‍රී ලංකා සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත මණ්ඩලය (SLCSMI) වාණිජ බැංකුවක් සමඟ සහභාගීත්වයෙන්, එම බැංකුවේ ගනුදෙනුකරුවන්ට තම මණ්ඩලයේ සේවාවන් ලබා දීම සඳහා එහි සාමාජිකත්වය ලබා ගැනීමට දිරිගන්වන ලදී. මේ අතර ශ්‍රී ලංකා සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත මණ්ඩලය විසින් රටපුරා ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීමට පියවර ගෙන ඇත.

### ගෘහ කර්මාන්ත

**කුඩා පරිමාණ කර්මාන්ත ඇතුළත් වන ගෘහ කර්මාන්ත උප අංශය 2011 වසර තුළ දී පැවති සියයට 7.0 ක වර්ධනයට සාපේක්ෂව 2012 වසරේ දී සියයට 4.6 ක වර්ධනයක් පෙන්වීය.** රට පුරා ගෘහ කර්මාන්ත දිරිගැන්වීමට සහ වැඩිදියුණු කිරීමට සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසායය සංවර්ධන අමාත්‍යාංශය වසර තුළ දී පියවර රැසක් ක්‍රියාවට නැංවීය. ගෘහස්ථ කර්මාන්ත පිළිබඳ දිවි නැගුම ජාතික සංවර්ධන වැඩසටහන, නිෂ්පාදන කර්මාන්ත ගම්මාන සංවර්ධන වැඩසටහන, තල්/කිතුල් අංශ සංවර්ධන වැඩසටහන සහ හස්ත කර්මාන්ත සංවර්ධන වැඩසටහන යනාදිය මෙම උප අංශයෙහි වර්ධනයට දායක වෙමින් නව කුඩා පරිමාණ කර්මාන්ත සඳහා මෙන්ම පවතින කර්මාන්ත වැඩිදියුණු කිරීමට ද සහාය දක්වමින් ස්වයං රැකියා අවස්ථා උත්පාදනය සඳහා එම අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කළ වැඩසටහන් කිහිපයකි. මේ අතරින් ඇතැම් වැඩසටහන් ගෘහ කර්මාන්තවල නියුතු ශ්‍රම බලකාය පුහුණු කිරීම සහ ප්‍රදර්ශන හරහා විභව ගැණුම්කරුවන් මුණගැස්වීම තුළින් ඔවුන්ගේ වෙළෙඳපොළ පුළුල් කිරීමට උපකාරී වීම වැනි අරමුණු මූලික කර ගනිමින් මෙහෙයවනු ලැබිණි. මෙම ක්‍රියාදාමයන්හි ප්‍රතිලාභ ඉදිරි වර්ෂයන්හි දී මෙම අංශයෙහි පුළුල් ක්‍රියාකාරිත්වයට හේතු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉදිකිරීම් අංශය තුළ වූ වර්ධනය මගින් කුඩා පරිමාණ ඉදිකිරීම් ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා ද, සංචාරක කර්මාන්ත අංශය තුළ වූ වර්ධනය මගින් හස්ත කර්මාන්ත නිපැයුම් සඳහා ඉහළ ගිය ඉල්ලුම මෙම අංශයේ වර්ධනයට ධනාත්මකව බලපාන ලදී.

### විදුලිය, ගෑස් සහ ජලය

**විදුලිය, ගෑස් සහ ජලය උප අංශය 2011 වසරේ දී වාර්තා කළ සියයට 9.2 ක වර්ධනය සමග සැසඳීමේ දී සියයට 4.4 කින් ප්‍රසාරණය විය.** මෙම අංශය සඳහා විශාලම දායකත්වයක් සපයන විදුලිය උප අංශය, විශේෂයෙන්ම වසරේ තෙවන කාර්තුවේ දී ජලාශ්‍රිත ප්‍රදේශවලට බලපෑ වියළි කාලගුණික තත්ත්වය හේතුවෙන් ඉහළ එකතු කළ අගයන් එක් කරනු ලබන ජල විදුලිබල උත්පාදනය සීමා කිරීමට සිදු වූ නිසා දැඩි පසුබෑමකට මුහුණ දුණි. එමනිසා මුළු විදුලිබල උත්පාදනය සියයට 28.6 ක සෘණාත්මක වර්ධනයක් වාර්තා කළේය. ජල විදුලිබල උත්පාදනය පහත වැටීම පිරිමැසීමට ඉහළ පිරිවැයකින් යුත් තාප විදුලිබල ජනනය සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, 2012 වසරේ දී එය සියයට 22.9 ක වර්ධනයක් වාර්තා කළේය. කෙසේ වෙතත්, වසරේ සිව්වන කාර්තුව තුළ දී ලැබුණු අධික වැසි නිසා ජල විදුලිබල ජනනය සැලකිය යුතු ලෙස ඉහළ යාමට හේතු වූ අතර, එය විදුලිය උප අංශය තුළ එකතු කළ අගය යම් තරමකට යථාතත්ත්වයට පත්කිරීමට උපකාරී විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස විදුලිය උප අංශය පෙර වසරේ දී පැවති සියයට 9.6 ක වර්ධනයට සාපේක්ෂව සියයට 4.3 කින් වර්ධනය විය. ඉන්ධන පිරිවැය මෙන්ම, වසර තුළ දී තාප විදුලිබල සහ ජල විදුලිබල ජනනය යන දෙඅංශයටම අවශ්‍ය අනෙකුත් ද්‍රව්‍ය සඳහා ද යෙදවුම් පිරිවැය ඉහළ ගියේය. ඒ අතරතුර දී පෙර වසරේ වාර්තා කළ සියයට 5.7 ක වර්ධනයට සාපේක්ෂව ගෑස් උප අංශය සියයට 5.1 කින් ප්‍රසාරණය විය. වසර තුළ ගෘහස්ථ සහ කාර්මික යන දෙඅංශයෙහිම පරිභෝජනය සඳහා එල්.පී. ගෑස් බෙදා හැරීම ප්‍රසාරණය විය. එකතු කළ අගය අනුව, ජලය උප අංශය සියයට 7.1 කින් ප්‍රසාරණය විය. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් 2012 වසර තුළ දී බෙදාහරින ජල පරිමාව සියයට 7.7 කින් ඉහළ යාම සහ එම මණ්ඩලයට ඇතුළත් පාරිභෝගික ගිණුම් සංඛ්‍යාව සියයට 9.8 කින් ඉහළ යාම මගින් මෙම වර්ධනය පිළිබිඹු වේ.

### ඉදිකිරීම්

**පසුගිය වසර තුළ වාර්තා කළ ඉහළ වර්ධන ගාමකත්වය අඛණ්ඩව පවත්වා ගනිමින් ඉදිකිරීම් උප අංශය 2011 වසරේ වාර්තා කළ සියයට 14.2 ක වර්ධනයට සාපේක්ෂව 2012 වසරේ දී සියයට 21.6 ක ආකර්ෂණීය වර්ධනයක් වාර්තා කළේය.** මෙය මෙම උප අංශය පසුගිය දස වසර තුළ ලබාගත් ඉහළම වර්ධනයයි. මෙම උප අංශය කර්මාන්ත අංශය තුළ වර්ධන නියමුවා බවට පත්වෙමින් සමස්ත ද.දේ.නි. යට සියයට 8.1 ක දායකත්වයක් සහ 2011 වසර සිට 2012 වසර දක්වා ද.දේ.නි. හි වෙනස්වීම සඳහා සියයට 23.9 ක දායකත්වයක් දැක්වීය. 2009 වසරේ දී වාර්තා කළ ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස සියයට 6.6 සහ ද.දේ.නි. හි වෙනස්වීමේ ප්‍රතිශතය වූ සියයට 10.3 සමග සැසඳීමේ දී යුද්ධය නිමා වීමෙන් පසු මෙම උප අංශය තුළ ඇති වූ ඉහළ ක්‍රියාකාරිත්වය පෙන්නුම් කරයි. රාජ්‍ය අංශයෙහි සංවර්ධන ව්‍යාපෘති විශේෂයෙන්ම මහාමාර්ග සංවර්ධනය, බලශක්ති ව්‍යාපෘති, වරාය සහ ගුවන් තොටුපොළ සංවර්ධන ව්‍යාපෘති සහ නිවාස සංවර්ධන ව්‍යාපෘති වැනි යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති, ඉදිකිරීම් අංශයට සැලකිය යුතු වර්ධන ගාමකත්වයක් සැපයීය. පෞද්ගලික අංශය ද, විශේෂයෙන් හෝටල් සහ නිවාස ඉදිකිරීම් කටයුතු හරහා මෙම උප අංශයෙහි වර්ධනයට සැලකිය යුතු දායකත්වයක් සැපයීය. ආයෝජන භාණ්ඩ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයනය, පරිමාව අනුව පිළිවෙළින් සියයට 21.7 කින්

සහ සියයට 13.5 කින් ඉහළ යාම තුළින් මෙම උප අංශයෙහි වර්ධනය පිළිබිඹු වේ. තවදුරටත්, සලකා බලන විට ඉදිකිරීම් කටයුතු සඳහා වාණිජ බැංකු මගින් පෞද්ගලික අංශයට ලබාදෙන ණය සහ අත්තිකාරම් 2011 වසරේ වාර්තා වූ සියයට 14.5 ක වර්ධනයට සාපේක්ෂව 2012 වසරේ දී සියයට 22.9 කින් වර්ධනය විය. ඉදිකිරීම් පුහුණු කිරීමේ සහ සංවර්ධනය කිරීමේ ආයතනය (ICTAD) සකස් කරන මිල දර්ශකය අනුව, ඉදිකිරීම් කටයුතුවල මිල මට්ටම් 2011 වසරේ දී වාර්තා වූ සියයට 5.4 ට සාපේක්ෂව මෙම වසර තුළ දී සියයට 12.2 කින් ඉහළ ගොස් ඇත.

### සේවා අංශය

**ආර්ථිකයේ විශාලතම අංශය ලෙස දළ දේශීය නිෂ්පාදිතයට සියයට 58.5 ක දායකත්වයක් සපයනු ලබන සේවා අංශය 2011 වසරේ දී වාර්තා කළ සියයට 8.6 ක වර්ධනයට සාපේක්ෂව 2012 දී සියයට 4.6 ක මධ්‍යස්ත වර්ධනයක් වාර්තා කර ඇත.** මෙම මන්දගාමිත්වයට දේශීය මෙන්ම විදේශීය සාධක හේතුවෙන් ඇති වූ විදේශ වෙළෙඳාමේ ක්‍රියාකාරිත්වය අඩපණ වීම ප්‍රධාන වශයෙන් හේතු විය. විශේෂයෙන් යුරෝපයේ ප්‍රධාන අපනයන වෙළෙඳපොළ දුර්වල වීම සමඟ ගෝලීය ආර්ථික තත්ත්වයෙහි වූ පසුබෑම අපනයන වෙළෙඳාම් උප අංශයේ වර්ධනය සීමා කරන ලදී. එසේම, දේශීය වශයෙන් සැලකු කල සාර්ව ආර්ථික ස්ථායිතාවය උදෙසා වසර ආරම්භයේ දී ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්තිමය පියවර මගින් ඇතැම් භාණ්ඩ ආනයනය සඳහා සීමා කිරීම් පැනවුණු අතර, එමගින් ආනයන වෙළෙඳාම් උප අංශයේ වර්ධනයට බාධා ඇති විය. එලෙස සමානුපාතිකවම නොවුව ද වර්ධනය මන්දගාමී කරවන සාධකයන්ගේ බලපෑම මධ්‍යයේ දේශීය වෙළෙඳාම, ප්‍රවාහනය සහ සන්නිවේදනය, බැංකු, රක්ෂණ සහ දේපළ වෙළෙඳාම් හා හෝටල් සහ ආපනශාලා යන උප අංශයන් ධනාත්මකව වර්ධනය වීම සමස්ත සේවා අංශයේම වර්ධනයට හේතු විය. ඒ අනුව, 2011 වසරේ දී සියයට 61.9 ක් වූ ද.දේ.නි. හි වෙනස්වීම සඳහා සේවා අංශයේ දායකත්වය මෙම වසරේ දී සියයට 42.9 ක් වී ඇත.

### තොග සහ සිල්ලර වෙළෙඳාම

**තොග සහ සිල්ලර වෙළෙඳාම් උප අංශය පෙර වසරේ දී ලබාගත් සියයට 10.3 ක වර්ධනයට සාපේක්ෂව 2012 වසර තුළ දී සියයට 3.7 ක වර්ධනයක් ලබා ගත්තේය.** ද.දේ.නි. සඳහා විශාලතම දායකත්වය සපයන මෙම උප අංශයෙහි වර්ධනය පහළ යාම 2012 වසරේ දී සමස්ත ආර්ථිකයේම වර්ධනය මන්දගාමී කිරීමට හේතු විය. මෙම මන්දගාමිත්වයට ප්‍රධාන වශයෙන්, ආනයන සහ අපනයන වෙළෙඳ කටයුතු සැලකිය යුතු ලෙස පහළ යෑම සමඟ ආන්තික ප්‍රසාරණයක් පමණක් වාර්තා කිරීම හේතු විය. වසර තුළ තොග සහ සිල්ලර වෙළෙඳාම් උප අංශයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් අඩු මට්ටමින් වුව ද ධනාත්මකව දේශීය ඉල්ලුම වර්ධනය වීම නිසා ඇති වූ දේශීය වෙළෙඳාම් උප අංශයේ වර්ධනය හේතු විය.

**ආනයන වෙළෙඳාම් උප අංශයේ එකතු කළ අගය 2011 වසරේ දී ලබාගත් සියයට 14.3 ක වර්ධනයට සාපේක්ෂව 2012 වසරේ දී සියයට 1.0 දක්වා සැලකිය යුතු ලෙස අඩු වී ඇත.** 2011 වසරේ දී පැවතුණු පුළුල් වෙළෙඳ හිඟය අවම කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්තිමය පෙළගැස්ම අපේක්ෂිත ප්‍රතිඵලය අත්කර දුන්න ද එම ක්‍රියාමාර්ග 2012 වසරේ ආනයන ඉල්ලුම අඩු කිරීමට හේතු වන ලදී. මෙම ප්‍රවණතා හේතුවෙන් ආනයන වෙළෙඳාම් උප අංශයේ වර්ධනය 2012 වසර තුළ දී සැලකිය යුතු ලෙස මන්දගාමී විය. එසේම සමස්තයක් ලෙස ජාත්‍යන්තර වෙළෙඳපොළවල මිල මට්ටම් එ.ජ.ඩොලර් මිල අනුව පහළ වැටීමක් පෙන්නුම් කළ ද, එය දේශීය මුදල් ඒකක අනුව සියයට 8.9 කින් 2012 වසර තුළ ඉහළ ගියේය. ප්‍රධාන ලෙස පාරිභෝගික භාණ්ඩ සහ අන්තර් භාණ්ඩවල ආනයන පරිමාව පිළිවෙළින් සියයට 11.0 කින් හා සියයට 4.1 කින් අඩු වී ඇත. මෙම භාණ්ඩ ආනයන පහත වැටීමට ප්‍රධාන වශයෙන්, පාරිභෝගික භාණ්ඩ ආනයනය සඳහා පැවතුණු දේශීය ඉල්ලුම අඩුවීම සහ දේශීය මෙන්ම විදේශීය වෙළෙඳපොළ සඳහා නිපැයුම් සපයනු ලබන නිෂ්පාදන කර්මාන්තවල පසුබෑම නිසා ඇති වූ අන්තර් භාණ්ඩ සඳහා ඉල්ලුම පහත යාම ද බලපා ඇත. කෙසේ වෙතත්, මහ බැංකු වෙළෙඳ දර්ශකවලට අනුව ආයෝජන භාණ්ඩවල ආනයන පරිමාව සියයට 21.7 කින් වර්ධනය වී ඇති බව පෙනී යයි. මෙයට ඉදිකිරීම් උප අංශයේ ඇති වූ වර්ධනය සහ 2012 අයවැය මගින් දේශීය කර්මාන්තයන් ධෛර්යමත් කිරීම සඳහා යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයනකරුවන් වෙත ලබාදුන් බදු සහන දායක විය.

**අපනයන වෙළෙඳාම් උප අංශය පෙර වසරේ ලබාගත් සියයට 10.1 ක වර්ධනයට සාපේක්ෂව 2012 වසරේ දී සියයට 0.8 කින් ආන්තික ලෙස වර්ධනය විය.** ප්‍රධාන අපනයන වෙළෙඳපොළවල පැවති කැළඹිලි සහිත ආර්ථික තත්ත්වයන් නිසා ගෝලීය ඉල්ලුම දුර්වල වීම සහ ජගත් වෙළෙඳපොළෙහි වෙළෙඳ ද්‍රව්‍යවල මිල පහළ යාම මෙම අවනතියට හේතු වී ඇත. මහ බැංකු වෙළෙඳ දර්ශක අනුව 2011 වසරට සාපේක්ෂව සමස්ත අපනයන පරිමාව සියයට 0.4 කින් හා අපනයන මිල මට්ටම් (එ.ජ.ඩොලර් වටිනාකමින්) සියයට 7.1 කින් සංකෝචනය වී ඇත.

එසේම, ජගත් වෙළෙඳපොළෙහි කෘෂිකාර්මික වෙළෙඳ ද්‍රව්‍යවල මිල මට්ටම් එ.ජ.ඩොලර් වටිනාකම් අනුව සියයට 2.3 කින් අඩු වී ඇති අතර, අපනයන පරිමාව ද සියයට 5.6 කින් අඩු වී ඇති බව මහ බැංකු වෙළෙඳ දර්ශක පෙන්නුම් කරයි. මෙම පරිමාව සහ මිල මට්ටම් යන දෙඅංශයෙන්ම සංකෝචනය වන ප්‍රවණතාවය තේ, රබර්, පොල්, එළවළු සහ සුළු අපනයන භෝග ආදී සියලුම ප්‍රධාන කෘෂිකාර්මික අපනයනවල දක්නට ලැබිණි. එසේම, කාර්මික අපනයනයන් සියයට 1.4 කින් සුළු වශයෙන් වර්ධනය වන අතරතුර එ.ජ.ඩොලර් අගය අනුව ගත් කල මිල මට්ටම් සියයට 9.1 කින් අඩු වී ඇත. ආහාර පාන සහ දුම්කොළ මෙන්ම රෙදිපිළි හා ඇඟළුම් වැනි සියළුම කාර්මික අපනයන ප්‍රභේදයකම පාහේ අපනයන පරිමාව පහත බැස ඇත. එමෙන්ම ඛණිජ ද්‍රව්‍යවල මිල මට්ටම් සියයට 92.2 ක් වැනි සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි වී තිබුණ ද අපනයනයන් සියයට 3.0 කින් පහත බැස ඇත.

**දේශීයව නිෂ්පාදනය කරන ලද සහ භූවමාරු කරන ලද භාණ්ඩ වෙළෙඳාම මගින් නියෝජනය කරනු ලබන දේශීය වෙළෙඳාම් උප අංශය පෙර වසරේ දී අත්කරගත් සියයට 7.5 ක වර්ධනයට සාපේක්ෂව 2012 වසරේ දී සියයට 6.8 ක වර්ධනයක් වාර්තා කරනු ලැබීය.** මෙම අංශය පසුගිය වසරවලදී රඳවා ගත් ඉහළ වර්ධනය සලකා බලන විට මෙම වසරේ ප්‍රසාරණය මන්දගාමී වීමක් දක්නට ලැබෙයි. මෙම මන්දගාමිත්වයට සාධක කිහිපයකම සංකලනයක් හේතු විය හැක. ඉහළ වෙළෙඳපොළ පොලී අනුපාතික සහ පෞද්ගලික අංශයේ ණය වර්ධනය මත පැන වූ සීමාව මගින් දේශීය ඉල්ලුම සීමා කරන ලද අතර, එමගින් දේශීය නිෂ්පාදනයට මෙන්ම භාණ්ඩ සැපයුමට ද බලපෑම් ඇති කරන ලදී. මේ බව නිෂ්පාදන කර්මාන්ත උප අංශයේ පසුබෑම තුළින් ද පිළිබිඹු වූ අතර, දේශීය වෙළෙඳ උප අංශයේ ප්‍රසාරණය ද මෙමගින් අධෛර්යමත් කෙරිණි. එසේම, අහිතකර කාලගුණික තත්ත්වයන් හමුවේ යල කන්නයේ වී වගාව මුහුණ දුන් ආකාරයේ කෘෂිකාර්මික බෝග හානි වීම ද මෙම උප අංශයේ වර්ධනයට බාධා ඇති කරන ලදී.

### හෝටල් සහ ආපනශාලා

**සාමයේ ප්‍රතිලාභ ලෙස පසුගිය වසරේදී ද සාක්ෂාත් කරගත් සියයට 26.4 ක වර්ධන ගාමකත්වය රැක ගනිමින් හෝටල් සහ ආපනශාලා උප අංශය 2012 වර්ෂයේ දී සියයට 20.2 කින් වර්ධනය විය.** එසේම, මෙම වසර තුළ සංචාරකයන්ගේ පැමිණීම අපේක්ෂිත වර්ධන ඉලක්ක හා සමගාමී වෙමින් මිලියනයේ මංසලකුණ ඉක්මවා යාමට හැකි විය. එසේම, සංචාරක ඉපයීම් ද වර්ෂයක දී අත්කරගත් ඉහළම ආදායම වාර්තා කරමින් එ.ජ.ඩොලර් බිලියනය ඉක්මවා යාමට සමත් වූ අතර, මෙය පසුගිය වසරට සාපේක්ෂව සියයට 25.1 ක වර්ධනයකි. සංචාරකයින්ගේ පැමිණීමට සාපේක්ෂව සංචාරක ඉපයීම් වැඩි වේගයකින් වර්ධනය වූ අතර, මෙමගින් සාංචාරකයකුගේ සාමාන්‍ය වියදමෙහි ඉහළ යාමක් පිළිබිඹු කෙරෙයි. එසේ වුවද, ශ්‍රේණිගත හෝටල් සම්බන්ධව සැලකූ විට සංචාරකයින් නවාතැන්ගත් රාත්‍රී ගණන මෙන්ම කාමර උපයෝජන අනුපාතය ද 2012 වසරේ දී පහත බැස ඇත. හෝටල් අංශයේ ශීඝ්‍ර ප්‍රසාරණය නිසා ලියාපදිංචි නොකළ හෝටල්, නවාතැන් පොළවල් සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින්ම අනුග්‍රහය දක්වනු ලබන සංචාරක සත්කාරක නිවාස ඒකක වැඩසටහන මගින් දේශීය සහ විදේශීය සංචාරකයන් ආකර්ශනය කර ගැනීම මෙයට හේතු වූවා විය හැක. එසේම, රට තුළ කාර්යක්ෂම ලෙස සංචාරකයින්ගේ ගමනාගමනය පහසු කරවන ශීඝ්‍ර යටිතල පහසුකම් සංවර්ධනය සහ අභ්‍යන්තර දුම්රිය හා ගුවන් ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු වීම මගින් මෙම කර්මාන්තයට විශාල වශයෙන් ප්‍රතිලාභ ලැබී ඇත. තවද, මෑත කාලීනව ඉදි කරන ලද සහ පවත්නා හෝටල් ප්‍රතිසංස්කරණය කිරීම මගින් අපේක්ෂා කරන ප්‍රතිලාභ ඉදිරි වසරවලදී මෙම උප අංශයේ වර්ධනය තවදුරටත් ඉහළ නැංවීමට හේතු වනු ඇත.

### ප්‍රවාහනය සහ සන්නිවේදනය

**ප්‍රවාහනය සහ සන්නිවේදනය උප අංශය පසුගිය වසර දෙකෙහිදී ම පවත්වාගත් සියයට 11.0 ක වර්ධනයට සාපේක්ෂව 2012 වසරේ දී සිය එකතු කළ අගය සියයට 6.2 කින් වර්ධනය කර ගැනීමට සමත්විය.** මෙම මන්දගාමීත්වය ප්‍රවාහනය, භාණ්ඩ මෙහෙයවීම - වරාය සහ සිවිල් ගුවන් සේවා සහ තැපැල් හා විදුලිසංදේශ යන ප්‍රවාහනය සහ සන්නිවේදනය උප අංශයේ කොටස් තුනෙහිදීම විද්‍යාමාන විය.

**ප්‍රවාහනය උප අංශය පෙර වසරේ දී ලැබූ සියයට 11.3 ක වර්ධනයට සාපේක්ෂව 2012 වසරේ දී සියයට 6.0 කින් වර්ධනය විය.** මෙම අඩු වර්ධන වේගයට ප්‍රධාන වශයෙන් දේශීය භාණ්ඩ නිෂ්පාදනය පහළ යාම නිසා භාණ්ඩ ප්‍රවාහනය අඩුවීම හේතු වූ අතර, මේ බව නිෂ්පාදන කර්මාන්ත උප අංශයේ සහ විදේශ වෙළෙඳාමේ සිදු වූ මන්දගාමීත්වයෙන් ද පෙන්නුම් කරන ලදී. එසේම, පොදු ප්‍රවාහන සේවාවේ සිදු වූ ප්‍රසාරණයට මගී ප්‍රවාහනයේ ඇති වූ වර්ධනය සාක්ෂි දරනු ඇත. තවද, වසර තුළ බස් රථ සංඛ්‍යාව වැඩිවීම සමග ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය හා පෞද්ගලික බස්රථ ක්‍රියාකරුවන් විසින් මෙහෙයවන ලද මගී කිලෝමීටර් ප්‍රමාණයේ සිදුවූ සියයට 8.1 ක

වැඩිවීම මගින් මගී ප්‍රවාහන සේවාවේ වර්ධනය පිළිබිඹු වේ. එමෙන්ම, ශ්‍රී ලංකා දුම්රිය සේවය විසින් 2012 වසරේ දී අලුතින් එන්ජින් හඳුන්වා දීම දුම්රිය මගී කිලෝමීටර් ප්‍රමාණය සහ භාණ්ඩ ටොන් කිලෝමීටර් ප්‍රමාණය වැඩිවීමට සාධක විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, දුම්රිය ප්‍රවාහන උප අංශයේ 2011 දී ලබාගත් සියයට 2.8 ක වර්ධනයට සාපේක්ෂව මෙම වසරේ දී සියයට 4.9 ක වර්ධනයක් අත්කර ගෙන ඇත. එසේම, සංචාරකයන් පැමිණීමේ වර්ධනයත් සමගම වසර තුළ දී ශ්‍රී ලංකන් සහ මිහින් ලංකා යන ගුවන් සේවා මගින් මෙහෙයවන ලද මගී කිලෝමීටර් ප්‍රමාණය ඉහළ යාම ද මෙම උප අංශයේ වර්ධනයට හේතු විය. තවද, අභ්‍යන්තර ගුවන් සේවා මගින් මෙහෙයවන ලද මගී කිලෝමීටර් ප්‍රමාණය වැඩිවීම තුළින් අභ්‍යන්තර ගුවන් ගමනාගමනයේ සිදුවූ දියුණුව සහ උතුරු ප්‍රදේශයේ සංචාරය සඳහා මතුවූ ඉල්ලුම පෙන්නුම් කෙරෙන අතර, එමගින් දප්‍රවාහන උප අංශයේ වර්ධනයට දායකත්වය සපයනු ලැබීය. මේ අතරතුර දී නව මෝටර් රථ වාහන ලියාපදිංචි කිරීමේ වාර්තා අනුව 2012 වසරේ දී භාණ්ඩ හා පොදු ප්‍රවාහන රථ ලියාපදිංචිය වර්ධනයේ අඩු වීමක් දක්නට ලැබීම ප්‍රවාහන උප අංශයේ මන්දගාමිත්වය සඳහා දායක වී ඇත.

**භාණ්ඩ මෙහෙයවීම - වරාය සහ සිවිල් ගුවන් සේවා උප අංශය පසුගිය වසරේ දී ලබාගත් සියයට 7.2 ක වර්ධනයට සාපේක්ෂව විදේශ වෙළෙඳාමේ දක්නට ලැබුණු උදාසීන ක්‍රියාකාරිත්වය හමුවේ 2012 වසරේ දී සියයට 5.7 ක වර්ධනයක් අත්කර ගන්නා ලදී.** කොළඹ වරාය සහ දකුණු ආසියානු පිවිසුම් පර්යන්ත සමාගම (SAGT) එක්ව 2012 වසර තුළ අඩි විස්සට සමාන බහාලුම් ඒකක (TEUs) මිලියන 4.19 ක ප්‍රමාණයක් හසුරුවන ලද අතර, මෙය පෙර වසරට සාපේක්ෂව සියයට 1.8 ක පසුබැස්මකි. සාමාන්‍යයෙන් මෙහෙයවන ලද මුළු භාණ්ඩ ප්‍රමාණයෙන් විශාලතම දායකත්වයක් දක්වන ප්‍රති නැව්ගත කිරීම් (නැවත ඇසිරීම් හැර) සියයට 1.9 කින් පහත වැටී ඇති අතර, දේශීයව මෙහෙයවන ලද බහාලුම් ප්‍රමාණය සියයට 2.5 කින් පහත බැස ඇත. තවද, නැව් ගමනාගමනය ද 2012 වසරේ දී සියයට 4.6 කින් අඩු වී ඇත. මෙම උප අංශයේ මන්දගාමිත්වයට වසර තුළ පැවති විදේශ වෙළෙඳාමේ අඩපන වීම ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවත්, වසර තුළ දී රුපියලේ අගය අවප්‍රමාණ වීම හේතුවෙන් කොළඹ වරාය සිය ලාභය වැඩිකර ගැනීමට සමත්වීම නිසා ක්‍රියාකාරී මට්ටම්වල දක්නට ලැබුණු පසුබෑම තරමක් දුරට හානිපූර්ණ කරගැනීමට හැකි විය. මේ අතරතුර වසර තුළ දී ගුවන් භාණ්ඩ පරිමාවේ ඇති වූ ප්‍රසාරණය ද මෙම උප අංශයේ වර්ධනය කෙරෙහි ධනාත්මක ලෙස බලපා ඇත.

**තැපැල් සහ විදුලි සංදේශ උප අංශය 2012 වසරේ දී සියයට 7.9 කින් ප්‍රසාරණය විය.** මෙහිදී විදුලි සංදේශ උප අංශය සැලකූ විට පසුගිය වසරවලදී ශීඝ්‍ර වර්ධනයක් ලබාගත් ස්ථාවර දුරකථන සම්බන්ධතාවන් මෙන්ම ජංගම දුරකථන සේවා ග්‍රාහකයින්ගේ ද වර්ධනය මන්දගාමී වන ලක්ෂණ පිළිබිඹු කර ඇත. නමුත් අන්තර්ජාල හා විද්‍යුත් තැපැල් ග්‍රාහකයින් සංඛ්‍යාව තවදුරටත් ශීඝ්‍රයෙන් ප්‍රසාරණය වී ඇත. විදුලි සංදේශ උප අංශයේ වර්තමාන ප්‍රවණතා සලකන විට දුරකථන සේවා සංතෘප්ත මට්ටම දක්වා ළඟා වී ඇති බව තහවුරු වෙයි. එසේ වුව ද, යටිතල ව්‍යුහය වැඩිදියුණු කිරීම මගින් පුළුල් පරාස ජාල සේවා වැනි සේවාවන්ගේ ධාරිතාවය, ආවරණ පරාසය සහ විශ්වාසනීයත්වය වැඩිදියුණු කරගැනීමෙන් තවදුරටත් මෙම අංශය වර්ධනය කරගැනීමේ අවස්ථාව පවතී. එසේම, දැනුම්මූලික සේවාවන් සම්පාදනයේ දී ස්ථාවර සන්නිවේදන යටිතල ව්‍යුහයක පැවැත්ම ප්‍රමුඛ සාධකයක් වන බැවින් ඉලක්කගත දැනුම් කේන්ද්‍ර සංකල්පය සාක්ෂාත් කරගැනීම උදෙසා නවීන සන්නිවේදන සේවාවන්වල දියුණුව ප්‍රධාන ලෙස වැදගත් වේ. තවද, තැපැල් උප අංශය පසුගිය වසරේ අත්කරගත් පසුගාමිත්වයෙන් මිදී 2012 වසර තුළ දී හසුරුවන ලද දේශීය සහ විදේශීය ලිපි/පාර්සල් පරිමාව වර්ධනය කරගැනීමට සමත් විය.

## බැංකු, රක්ෂණ සහ දේපළ වෙළෙඳාම් යනාදිය

**බැංකු, රක්ෂණ හා දේපළ වෙළෙඳාම් උප අංශය 2011 වසරේ දී අත්කරගත් සියයට 7.9 ක වර්ධනයට සාපේක්ෂව 2012 වසරේ දී සියයට 6.7 කින් ප්‍රසාරණය විය.** මෙම මන්දගාමී වර්ධනයට මූලික වශයෙන් දේශීය ආර්ථිකය ස්ථායී කිරීම උදෙසා පූර්ව ක්‍රියාකාරී පිළිවෙත් ලෙස යොදා ගන්නා ලද මුදල් හා රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ගයන් සහ තියුණු ගෝලීය අභියෝගයන් හේතු විය. බලපත්‍රලාභී බැංකු සඳහා පනවන ලද ණය සීමා මගින් රුපියල් ණය ප්‍රසාරණය පාලනය කරන ලද අතර, එතෙක් පවත්වාගෙන ආ තියුණු වර්ධන ගාමකත්වය එමගින් සීමා විය. ඒ අනුව, පසුගිය වසරේ දී සියයට 34.5 ක් වූ පෞද්ගලික අංශයට ලබා දෙන ලද ණය වර්ධනය මෙම වසරේ දී සියයට 17.6 දක්වා පහත බසිනු දක්නට ලැබුණි. කෙසේ වුවද, පෙබරවාරි සහ අප්‍රේල් මාසවලදී සිදු කරන ලද ප්‍රතිපත්තිමය පොලී අනුපාතික ඉහළ නැංවීම හේතුවෙන් ඉහළ ගිය මූල්‍යකරණ පිරිවැය සහ අඩු මට්ටමක පැවති මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතාව මධ්‍යයේ වුවද, 2012 වසරේ වාර්තා කරන ලද වර්ධනය අත්කර ගැනීමට හැකි විය. එසේ වුවද, බැංකු පද්ධතියේ ආදායම් මට්ටම් සහ ලාභ සැලකුව හොත් 2012 වසරේ දී සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කර ඇත. එසේම, පසුගිය වසරේ දී වාණිජ බැංකු කිහිපයක්ම සිය මූල්‍යකරණ කළඹ පුළුල් කරමින් සාර්ථක ලෙස

අඩු පිරිවැය විදෙස් ණය පහසුකම් ලබාගන්නා ලදී. තවද, අභියෝගාත්මක වාතාවරණයක් මධ්‍යයේ වුව ද රක්ෂණ අංශය ද සතුටුදායක වර්ධනයක් වාර්තා කර ඇති අතර, ලාභ මට්ටම්වල ඇති වූ ප්‍රශංසනීය වර්ධනය මේ බව තහවුරු කරයි. ඉහළ ගිය මූල්‍ය හා මෙහෙයුම් වියදම් මෙන්ම රථවාහන ආනයනය ශීඝ්‍රයෙන් පහළ යාම නිසා සිය ප්‍රධාන ව්‍යපාරික අංශයට එල්ල වූ බලපෑම හේතුවෙන් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල වර්ධනයට බාධා ඇති විය. කෙසේ වුවද, වසර තුළ දී විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් කිහිපයක්ම සාර්ථකව මුදල් සමාගම් තත්ත්වයට උසස් වීම තුළ ඔවුන් හට සාපේක්ෂව අඩු පිරිවැය මහජන තැන්පතු රැස්කර ගැනීමේ මාර්ගය විවර විය. මෙම වාසිදායක තත්ත්වය ඉදිරි වසරවලදී සතුටුදායක ප්‍රතිඵල ලබා ගැනීමට හේතු විය හැකිය. තවද, රට තුළ මූල්‍ය කටයුතු සඳහා මෙතෙක් විවර නොවූ ප්‍රදේශ රැසක් ආවරණය වන පරිදි සිදුවූ ශාඛා ජාලයේ සහ අනෙකුත් සේවා කවුළුවල ශීඝ්‍ර ව්‍යාප්තිය ද මෙම උප අංශයේ වර්ධනයට බෙහෙවින් උපකාරී විය.

### රාජ්‍ය සේවා

**රාජ්‍ය සේවා උප අංශය 2011 වසරේ දී ලබාගත් සියයට 1.2 ක වර්ධනයට සාපේක්ෂව 2012 වසරේ දී සියයට 1.4 ක වර්ධනයක් ලබාගැනීමට සමත් විය.** එසේම එකතු කළ අගය මත ලබාගත් වර්ධනයේ රාජ්‍ය අංශයේ දායකත්වය පෙන්නුම් කරමින් මෙම වර්ෂය තුළ දී රාජ්‍ය අංශයේ රැකියා නියුක්තිය මිලියන 1.2 ක් දක්වා සියයට 1.2 කින් ඉහළ ගියේය.

### පෞද්ගලික සේවා

**පෙර වසරේ දී ලබාගත් සියයට 7.2 ක ප්‍රසාරණයට සාපේක්ෂව පෞද්ගලික සේවා අංශය 2012 වසරේ දී සියයට 5.5 කින් වර්ධනය විය.** වසර මුළුල්ලෙහි පැවති ඉහළ ණය පොලී අනුපාත සහ පෞද්ගලික අංශය සඳහා වූ ණය ප්‍රසාරණයට ඇති කරන ලද සීමා කිරීම් මගින් ණය ගැනීම් මත පදනම් වූ ආයෝජනවලට ඇති වූ බලපෑම ද මෙම උප අංශයේ අඩු වර්ධනයට හේතු විය. කෙසේ වුවත්, ඉහළ මට්ටමේ ආර්ථික ක්‍රියාකාරකම් සමග පෞද්ගලික අධ්‍යාපන සේවා සහ සංචාරක ව්‍යාපාරය හා සබැඳුනු පෞද්ගලික සේවා ආදී ක්ෂේත්‍ර සැලකිය යුතු වර්ධනයක් වාර්තා කිරීමට සමත් විය.

## 2.3 වියදම

**වියදම් ප්‍රවේශයෙහි ඇස්තමේන්තු අනුව 2012 වසර තුළ දී මූර්ත වශයෙන් පරිභෝජන වියදමෙහි වර්ධනය මන්දගාමී ස්වභාවයක් ඉසිලූ අතර, ආයෝජන ක්‍රියාකාරකම් සඳහා කරන ලද වියදම් ද 2011 ට වඩා අඩු වේගයකින් වර්ධනය විය.** එබැවින් 2012 වසරේ දී අත්දකින ලද වර්ධන ගාමකත්වයෙහි වූ මන්දගාමීත්වයට මූලිකවම පහළ මට්ටමක පැවති පරිභෝජන වියදමෙහි වර්ධනය හේතු විය. මෙම තත්ත්වය 2011 වසරට සාපේක්ෂව 2012 වසරේ

**2.8 සංඛ්‍යා සටහන**

**සමස්ත ඉල්ලුම**

රුපියල් මිලියන

| අයිතමය | පවත්නා වෙළෙඳ මිල අනුව | | | 2002 ස්ථාවර මිල අනුව | | |
|---|---|---|---|---|---|---|
| | 2010 | 2011 (අ) | 2012 (ආ) | 2010 | 2011 (අ) | 2012 (ආ) |
| 1. දේශීය ඉල්ලුම | | | | | | |
| පරිභෝජනය | 4,524,188 | 5,536,095 | 6,295,894 | 2,145,036 | 2,422,786 | 2,556,181 |
| (% වෙනස) | 14.0 | 22.4 | 13.7 | 7.6 | 12.9 | 5.5 |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 1,545,500 | 1,960,179 | 2,322,732 | 768,341 | 827,480 | 882,311 |
| (% වෙනස) | 30.8 | 26.8 | 18.5 | 14.5 | 7.7 | 6.6 |
| **මුළු දේශීය ඉල්ලුම** | **6,069,688** | **7,496,274** | **8,618,626** | **2,913,377** | **3,250,266** | **3,438,492** |
| **(% වෙනස)** | **17.9** | **23.5** | **15.0** | **9.4** | **11.6** | **5.8** |
| 2. විදේශීය ඉල්ලුම | | | | | | |
| භාණ්ඩ සහ සේවා අපනයන | 1,254,021 | 1,508,565 | 1,729,033 | 723,880 | 803,507 | 804,793 |
| (% වෙනස) | 21.6 | 20.3 | 14.6 | 8.8 | 11.0 | 0.2 |
| භාණ්ඩ සහ සේවා ආනයන | 1,719,605 | 2,460,830 | 2,765,283 | 991,714 | 1,190,057 | 1,196,008 |
| (% වෙනස) | 27.8 | 43.1 | 12.4 | 12.6 | 20.0 | 0.5 |
| **ශුද්ධ බාහිර ඉල්ලුම** | **-465,584** | **-952,265** | **-1,036,250** | **-267,835** | **-386,551** | **-391,215** |
| 3. **මුළු ඉල්ලුම** | **5,604,104** | **6,544,009** | **7,582,376** | **2,645,542** | **2,863,715** | **3,047,277** |
| **(% වෙනස)** | **15.9** | **16.8** | **15.9** | **8.0** | **8.2** | **6.4** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

දී දක්නට ලැබුණු දේශීය නිෂ්පාදිතයෙහි වූ අඩු වර්ධනය සහ පරිභෝජන භාණ්ඩ ආනයනයෙහි වූ පසුබෑස්ම මගින් විදහා දැක්වේ. 2012 වසරේ පෙබරවාරි සහ මාර්තු සමයේ දී හඳුන්වා දෙනු ලැබූ ස්ථායීකරණ ප්‍රතිපත්ති තීරණවල ප්‍රතිඵලයක් ලෙස විදේශීය භාණ්ඩ ආනයනය සැලකිය යුතු ලෙස පහළ වැටුණු අතර, පෞද්ගලික අංශයෙහි ණය වර්ධනය ද මන්දගාමී විය. එබැවින් ආර්ථිකයෙහි සමස්ත පරිභෝජන වියදම් සහ ආයෝජන ක්‍රියාකාරකම් ඇතුළත් වන දළ දේශීය වියදම (ද.දේ.වි.), 2011 වසරේ වාර්තා කළ සියයට 23.5 ක වර්ධනයට සාපේක්ෂව 2012 වසර තුළ සියයට 15.0 ක් දක්වා මන්දගාමී විය. තවද, ද.දේ.වි. හා ශුද්ධ භාණ්ඩ හා සේවා ආනයනයන්හි එකතුවෙන් දැක්වෙන රටෙහි ද.දේ.නි. මෙම වසර තුළ දී පවත්නා වෙළෙඳ මිල අනුව සියයට 15.9 කින් වර්ධනය විය.

## පරිභෝජනය

**2012 වසරේ දී පරිභෝජන වියදම තවදුරටත් පුළුල් වූ නමුදු එය පෙර වසරට සාපේක්ෂව අඩු වර්ධන වේගයකින් සිදු විය.** වියදම් ප්‍රවේශ ඇස්තමේන්තුවලට අනුව පරිභෝජන වියදම ආර්ථිකයේ විශාලතම භාගයට හිමිකම් කියන බැවින් මෙම තත්ත්වය සමස්ත ආර්ථික වර්ධනයෙහි ම දක්නට ලැබුණු හැසිරීම සමග සංගත වී ඇත. මෙසේ මුළු පරිභෝජන වියදමෙහි මන්දගාමිත්වයට පෞද්ගලික අංශයේ මෙන්ම රාජ්‍ය අංශයේ ද දායකත්වය හේතු විය. වසර තුළ දී පෞද්ගලික අංශයෙහි වියදම අඩු වීමට, සාපේක්ෂ ලෙස පාලනය කරන ලද පරිභෝජන වියදම ඉහළ යාම හේතු විය හැකිය. මේ අතරතුරදී දැඩි ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග හේතුවෙන් පරිභෝජනය සඳහා වූ පෞද්ගලික අංශයේ ඉල්ලුම අඩුවීම, රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් විදේශ වෙළෙඳපොළවලින් ආනයනික භාණ්ඩවල පිරිවැය ඉහළ යාම සහ ඇතැම් ආනයන භාණ්ඩ සඳහා තීරුබදු පැනවීම මගින් ඒ සඳහා වූ ඉල්ලුම කෙරෙහි ඇති කරන ලද ඍණාත්මක බලපෑම හේතුවෙන් පරිභෝජන භාණ්ඩ ආනයනය ද සංකෝචනය විය.

**පෞද්ගලික පරිභෝජන වියදමෙහි උප අංශ 12 න් විශාලතම වියදම් කාණ්ඩය වන්නේ ආහාර, පාන හා දුම්කොළ අංශයයි.** සාමාන්‍යයෙන් ආදායම් මට්ටම් ඉහළ යාමත් සමග ආහාර වැනි අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය සඳහා වන වියදමෙහි ප්‍රතිශතය පහත බසින අතර, ආහාර නොවන ද්‍රව්‍ය පරිභෝජනය ඉහළ යයි. 2012 වසර තුළ ද මෙම නැඹුරුව දක්නට ලැබුණු අතර, ආහාර, පාන හා දුම්කොළ ද්‍රව්‍ය කාණ්ඩය 2011 වසරේ දී වාර්තා කළ පෞද්ගලික පරිභෝජන වියදමෙන් සියයට 40.4 ක දායකත්වයට සාපේක්ෂව 2012 දී සියයට 37.7 කට හිමිකම් කියන ලදී. මේ සඳහා කොළඹ පාරිභෝගික මිල දර්ශනයට අනුව ආහාර නොවන ද්‍රව්‍ය කාණ්ඩයට සාපේක්ෂව මෙම වියදම් කාණ්ඩයේ පැවති ස්ථාවර මිල මට්ටම් හේතු විය. මේ අතරතුර දේශීය ඉල්ලුම අඩුවීම හේතුවෙන් මුළු ආනයනයන්ගෙන් සියයට 7 ක දායකත්වයක්

**2.9 සංඛ්‍යා සටහන** **පවත්නා වෙළෙඳ මිල අනුව පෞද්ගලික පරිභෝජන වියදමේ සංයුතිය**

| අයිතමය | මුළු පෞද්ගලික පරිභෝජන වියදමට දායකත්වය (%) | | | වෙනස්වීමේ අනුපාතය (%) | |
|---|---|---|---|---|---|
| | 2010 (අ) | 2011 (අ) | 2012 (ආ) | 11/10 | 12/11 |
| 1. ආහාර, පාන සහ දුම්කොළ | 39.6 | 40.4 | 37.7 | 27.7 | 7.7 |
| 2. රෙදිපිළි සහ පාවහන් | 6.0 | 5.5 | 5.4 | 16.1 | 13.3 |
| 3. නිවාස කටයුතු, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන | 11.2 | 12.5 | 12.4 | 39.0 | 14.7 |
| 4. ගෘහභාණ්ඩ, ගෘහස්ථ උපකරණ සහ නෛත්‍යක නිවාස නඩත්තුව | 4.9 | 4.3 | 3.9 | 9.4 | 5.4 |
| 5. සෞඛ්‍යය | 2.0 | 1.8 | 1.6 | 9.6 | 3.7 |
| 6. ප්‍රවාහනය | 21.2 | 21.1 | 23.5 | 24.4 | 28.8 |
| 7. විනෝද සේවා සහ සංස්කෘතික කටයුතු | 2.5 | 2.1 | 1.9 | 5.6 | 6.6 |
| 8. අධ්‍යාපනය | 0.3 | 0.3 | 0.4 | 22.2 | 26.1 |
| 9. හෝටල් සහ ආපනශාලා | 1.3 | 1.3 | 1.7 | 20.3 | 50.5 |
| 10. විවිධ භාණ්ඩ සහ සේවා | 4.8 | 4.1 | 3.9 | 6.0 | 10.2 |
| 11. ශ්‍රී ලාංකිකයින් එතෙරදී කරන වියදම් | 9.3 | 9.3 | 11.1 | 26.1 | 37.2 |
| 12. අඩු කළා : විදේශිකයින් මෙතෙරදී කරන වියදම් | 3.2 | 2.7 | 3.5 | 7.4 | 48.9 |
| **මුළු පෞද්ගලික පරිභෝජන වියදම** | **100.0** | **100.0** | **100.0** | **25.1** | **15.5** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

දක්වන ආහාර සහ පාන ආනයනය ද පහත බැස ඇත. තවද, කෘෂිකාර්මික බෝග, පශු සම්පත් සහ මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ යාම මගින් ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය ඉහළ ගිය අතර, එමගින් මෙරට නිෂ්පාදිත ආහාර ද්‍රව්‍ය පරිභෝජනයෙහි ඉහළ යාමක් පෙන්නුම් කෙරේ. මේ අතරතුර දී රෙදිපිළි සහ පාවහන් සඳහා වූ වියදම මුළු පෞද්ගලික පරිභෝජන වියදමෙන් සියයට 5.4 ක ප්‍රතිශතයක් දක්වා මෙම වසර තුළ දී පහළ ගොස් ඇත.

**නිවාස කටයුතු, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන සඳහා වූ වියදම සියයට 14.7 කින් 2012 වසරේ දී වර්ධනය වී ඇත.** තවද, 2012 වසර සඳහා වූ දත්තයන්ට අනුව කුටුම්බ අංශයෙහි විදුලිය, ජලය හා ගෑස් සඳහා වූ පරිභෝජනය ඉහළ ගොස් ඇත. මේ අතර, විදුලිය හා ගෑස් මිල ගණන් ඉහළ යාමද මෙම අංශයෙහි වියදම වැඩිවීමට දායක වී ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2012 වසරේ දී සමස්ත පෞද්ගලික පරිභෝජන වියදම තුළ මෙම අංශයෙහි දායකත්වය සියයට 12.4 ක් වී ඇති අතර, මෙය 2011 වසරට සාපේක්ෂව ආන්තික අඩුවීමකි.

**සෞඛ්‍යය සහ අධ්‍යාපනය සඳහා වන පෞද්ගලික අංශයේ වියදම් 2012 වසරේ දී වර්ධනය වී ඇත.** මෙහිදී පෞද්ගලික අංශයෙහි අධ්‍යාපන කටයුතු සඳහා වූ වියදම 2012 වසරේ දී සියයට 26.1 ක ඉහළ වර්ධනයක් වාර්තා කළ අතර, සෞඛ්‍ය සේවාවන් සඳහා වූ වියදම සියයට 3.7 ක අඩු වර්ධනයක් දැක්වීය. ඒ අනුව, සමස්ත පරිභෝජන වියදම තුළ සෞඛ්‍ය සහ අධ්‍යාපනික අංශයෙහි දායකත්වය පිළිවෙළින් සියයට 1.6 ක් හා සියයට 0.4 ක් විය. මෙම සේවාවන් සැපයීමේදී රාජ්‍ය අංශයේ ඉහළ මට්ටමක සහභාගීත්වය හේතුවෙන් පසුගිය වසරවල දී මෙන්ම මෙම වසරේදී ද ඉහත වියදම් කාණ්ඩවල අඩු දායකත්වයක් පෙන්නුම් කර ඇත.

**පෞද්ගලික අංශයේ ප්‍රවාහන වියදම් ද 2012 වසරේ දී සැලකිය යුතු ලෙස වර්ධනය විය.** පෞද්ගලික පරිභෝජන වියදමෙන් පහෙන් පංගුවකට වඩා වැඩි අගයක් ගන්නා ප්‍රවාහනය සඳහා වූ වියදම මුළු පෞද්ගලික පරිභෝජනයෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 23.5 ක් දක්වා තවදුරටත් ඉහළ ගියේය. මෙම කාණ්ඩයෙහි වූ වියදම ඉහළ යාම සඳහා පොදු ප්‍රවාහන සේවාවන්වල ගාස්තු ඉහළ නැංවීම සහ රට තුළ ඉහළ ගිය ගමනාගමන කටයුතු ඉවහල් විය. තවද, ඉන්ධන මිල ගණන් ඉහළ යාම ද මෙම අංශයෙහි වියදම වැඩි වීමට හේතු විය.

**ආදායම් මට්ටම්වල ඇති වූ ඉහළ යාමත් සමගම හෝටල් සහ ආපනශාලා වැනි විනෝද සේවා ක්‍රියාකාරකම් සඳහා වන පෞද්ගලික වියදම් 2012 වසරේ දී වැඩි වේගයකින් වර්ධනය විය.** පරිභෝජන කාණ්ඩයේ අදාළ භාගය ඉහළ යාමෙන් ද ඒ බව පැහැදිලි වෙයි. පශ්චාත් යුද සමයේ දී රටෙහි ඉහළ ගිය අභ්‍යන්තර සංචලතාවය මෙම අඛණ්ඩ වර්ධනයට දායකත්වය සපයන ලදී. මේ අතරතුර දී විනෝද සේවා සහ සංස්කෘතික කටයුතු සඳහා වන වියදම සියයට 6.6 ක් ලෙස සාපේක්ෂව අඩු වර්ධනයක් වාර්තා කර ඇත. ශ්‍රී ලාංකිකයන් විදේශයන්හි දී සිදු කරන වියදම්හි දක්නට ලැබුණු සියයට 37.2 ක වර්ධනය ද වසර තුළ දී පෞද්ගලික පරිභෝජන වියදමෙහි ප්‍රසාරණයට හේතු විය.

**2012 වසරේ දී රාජ්‍ය අංශයේ වියදම් සියයට 5.6 කින් වර්ධනය විය.** එනමුත් මෙය 2011 වසරේ දී වාර්තා කරන ලද සියයට 10.9 ක වර්ධනයට වඩා අඩු වීමකි. ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය අංශයේ වියදම 2011 වසරේ දී වාර්තා කළ සියයට 14.8 ක සිට මෙම වසරේ දී සියයට 13.5 ක් දක්වා පහත වැටී ඇත. මෙම වර්ධනය වැටුප්, පොලී සහ පැවරුම් ගෙවීම් වැනි පිරිවැය ඉහළ යාමේ ප්‍රතිඵලයකි. කෙසේ වුවද, 2012 වසරේ දී ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස පුනරාවර්තන වියදම්වල අඩුවීම සඳහා, වර්තන වියදම් අඩු කිරීම වෙනුවෙන් දරන ලද පරිශ්‍රමය මෙන්ම සමස්ත ද.දේ.නි. වැඩි වර්ධන වේගයකින් වැඩිවීම ද හේතු විය.

### ආයෝජන

**අනාගත වර්ධන අපේක්ෂාවන් නිර්ණය කිරීම සඳහා ප්‍රධාන සාධකයක් වන ආයෝජන වියදම් 2012 වසරේ දී ද අඛණ්ඩව ප්‍රසාරණය වී තිබුණ ද එය 2011 වසරට වඩා අඩු ශීඝ්‍රතාවයක් අත්කර ගෙන ඇත.** ආයෝජනයෙහි (දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය) සිදු වූ මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් 2012 වසරේ ප්‍රධාන වර්ධක බලවේගය වූ ඉදිකිරීම් උප අංශයේ ප්‍රසාරණය හේතු විය. එසේම නේවාසික මෙන්ම අනේවාසික කටයුතු සඳහා වන ඉදිකිරීම් වැනි සියළුම මාදිලියේ ඉදිකිරීම් ක්‍රියාකාරකම් වසර තුළ දී නාමික වශයෙන් වැඩි වේගයකින් වර්ධනය වී ඇති අතර, මෙමගින් ආර්ථිකය පිළිබඳව ධනාත්මක භාවයක් පිළිබිඹු කර ඇත. එසේම, ආනයන සීමා කිරීම සඳහා පනවන ලද ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග, යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආයෝජනයන් හි වර්ධනය උදෙසා දක්වා ඇත්තේ අඩු බලපෑමක් බව පෙනී යයි. වසරෙහි ආයෝජන සඳහා වූ වියදම රුපියල් බිලියන 2,323 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස සියයට 30.6 කි. එමනිසා නාමික වශයෙන් ආයෝජන වර්ධනය මන්දගාමී වුව ද 2012 වසරේ සමස්ත ද.දේ.නි. යෙහි අනුපාතිකයක් ලෙස සැලකූ විට අඛණ්ඩ වර්ධනයක් අත්කර ගෙන ඇත.

**2.10 සංඛ්‍යා සටහන** **ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වූ ව්‍යවසායයන්හි ආයෝජන සහ සේවා නියුක්තිය**

| | ව්‍යාපෘති සංඛ්‍යාව | | ආයෝජන (රු. මිලියන) | | | | | | සේවා නියුක්තිය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2011 (අ) | 2012 (ආ) | 2011 (අ) | | | 2012 (ආ) | | | 2011 (අ) | 2012 (ආ) |
| | | | විදේශීය | දේශීය | එකතුව | විදේශීය | දේශීය | එකතුව | | |
| ආයෝජන මණ්ඩලය (1978 අංක 4 දරන පනත යටතේ) | | | | | | | | | | |
| අනුමත කළ ව්‍යාපෘති | 183 | 251 | 280,172 | 148,351 | 428,524 | 453,934 | 223,037 | 676,971 | 49,462 | 53,056 |
| 17 වන වගන්තිය යටතේ (ඇ) | 160 | 219 | 277,655 | 147,215 | 424,870 | 450,290 | 222,689 | 672,979 | 48,868 | 50,886 |
| 16 වන වගන්තිය යටතේ | 23 | 32 | 2,517 | 1,136 | 3,654 | 3,644 | 348 | 3,992 | 594 | 2,170 |
| 17 වන වගන්තිය යටතේ ගිවිසගත් ව්‍යාපෘති (ඇ) | 164 | 160 | 238,489 | 133,573 | 372,062 | 273,008 | 131,941 | 404,948 | 44,701 | 37,314 |
| 17 වන වගන්තිය යටතේ දැනට කර ඇති ආයෝජන (ඈ) | 2,019 | 2,045 | 657,686 | 374,926 | 1,032,613 | 828,313 | 452,524 | 1,280,837 | 450,913 | ලැ.නො. |
| වාණිජ කටයුතු වල නිරතවූ (ඈ) | 2,693 | 2,492 | 267,556 | 3,988,236 | 4,255,792 | 264,875 | 3,995,598 | 4,260,473 | 399,310 | 367,347 |
| 17 වන වගන්තිය යටතේ (ඇ) (ඈ) | 1,887 | 1,784 | 245,717 | 3,976,886 | 4,222,603 | 245,126 | 3,985,230 | 4,230,356 | 361,347 | 334,330 |
| 16 වන වගන්තිය යටතේ (ඈ) | 806 | 708 | 21,839 | 11,350 | 33,189 | 19,749 | 10,368 | 30,117 | 37,963 | 33,017 |
| කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය ලියාපදිංචි වූ ව්‍යාපෘති (ඈ) | 2,006 | 2,048 | - | - | 150,268 | - | - | 153,303 | 299,902 | 303,762 |


(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) පුළුල් කළ ව්‍යාපෘතීන් ද ඇතුළත්ව
(ඈ) වර්ෂය අවසානයේ සමුච්චිත අගය

මූලයන් : ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය

සමස්ත ආයෝජන සඳහා පෞද්ගලික අංශයේ ආයෝජන ක්‍රියාකාරකම්වල දායකත්වය සියයට 75 කට වඩා වැඩි අගයක් ගනී. එසේම, නාමික වශයෙන් ආයෝජනයන්හි අඩු වර්ධනයට පෞද්ගලික අංශයේ ආයෝජන ක්‍රියාකාරකම්වල මන්දගාමිත්වය සහ ආනයනික ආයෝජන ද්‍රව්‍යවල මිල මට්ටම්වල අඩු වර්ධනය හේතු විය. ඉහළ පොලී අනුපාතික, ණය වර්ධනය මත පැනවූ ඉහළ සීමාව සහ ආනයන අධෛර්යමත් කිරීමේ පිළිවෙත් වැනි දැඩි ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග මෙම ආයෝජන කටයුතුවල පහත වැටීමට දායක විය. විදේශ ආයෝජන ද ඇතුළුව, පෞද්ගලික අංශයේ දක්නට ලැබුණු අඛණ්ඩ ආයෝජනයන් ආර්ථිකය සම්බන්ධයෙන් ආයෝජකයන්ගේ ඇති විශ්වාසය පෙන්නුම් කෙරෙයි. එසේම හෝටල් සහ විදුලි සංදේශ වැනි ක්ෂේත්‍ර සඳහා පෞද්ගලික අංශයේ ඉහළ මට්ටමක දායකත්වයක් දක්නට ලැබුණි.

2012 වසරේ සෘජු විදේශ ආයෝජන ගලා ඒම් එ.ජ.ඩොලර් මිලියන 1,338 ක් දක්වා සියයට 26 කින් වර්ධනය වූ අතර මුළු සෘජු විදේශ ආයෝජනවලින් සියයට 45 ක ප්‍රමාණයක් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා විය. දුරකථන හා විදුලි සංදේශ ජාලා සංවර්ධනය, වරාය බහලු පර්යන්ත සංවර්ධනය, ඉන්ධන, ඛනිජ තෙල් හා ගෑස් ආශ්‍රිත ව්‍යාපෘති, බලශක්ති උත්පාදනය, නිවාස හා දේපළ සංවර්ධනය සහ කාර්යාල සංකීර්ණ

**2.5 රූප සටහන** **අනුමතකළ සහ ගිවිසගත් ආයෝජන මණ්ඩල ව්‍යාපෘතීන්හි ආයෝජන (පුළුල් කරන ලද ව්‍යාපෘතීන් ද ඇතුළත්ව)**




(අ) සංශෝධිත
(ආ) තාවකාලික

ඉදිකිරීමේ කටයුතු මෙම ව්‍යාපෘතීන් අතර විය. නිෂ්පාදන කර්මාන්ත අංශයේ රෙදිපිළි, ඇඟලුම් හා සම් භාණ්ඩ, ආහාර පාන හා දුම්කොළ නිෂ්පාදිත, රබර් නිෂ්පාදිත, සකස් කළ ලෝහ සහ යන්ත්‍රෝපකරණ හා ප්‍රවාහන උපකරණ උප අංශයන් මුළු සෘජු විදේශ ආයෝජනවලින් සියයට 25 කට ආසන්න විය. සේවා අංශයට යොමු වූ සෘජු විදේශ ආයෝජන, හෝටල් හා ආපනශාලා උප අංශවලින් විය.

**2012 වසරේ දී ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය සහ 16 වන වගන්තිය යටතේ අවසර ලද ව්‍යාපෘති සඳහා වූ ආයෝජන ප්‍රමාණය රුපියල් බිලියන 677 ක ඇස්තමේන්තු කළ අගයක් ගත් අතර එය 2011 වසරේ වාර්තා කළ අගයට වඩා සියයට 58 කින් වැඩි විය.** මෙම වැඩිවීම ප්‍රධාන වශයෙන් සේවා අංශයේ දේශීය හා විදේශීය ආයෝජන හේතුවෙන් විය. 2012 වසරේ දී නිෂ්පාදන කර්මාන්ත උප අංශය යටතේ, ආහාර, පාන හා දුම්කොළ නිෂ්පාදිත අංශයේ අවසර ලද ව්‍යාපෘති ගණන 2011 වසර හා සැසඳීමේ දී දෙගුණයක් ඉක්ම වූ අතර මීට කුඩා පරිමාණයේ ව්‍යාපෘති විශාල සංඛ්‍යාවක් ඇතුළු විය. එමෙන්ම, ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත අංශය යටතේ ද වැඩි ව්‍යාපෘති ගණනක් සඳහා අවසර ලබා ඇත. 2012 වසරේ දී ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ගිවිස ගත් ව්‍යාපෘති සඳහා ආයෝජන සියයට 8.8 ක වර්ධනයක් වූ අතර මෙය රුපියල් බිලියන 405 ක ඇස්තමේන්තු කළ වටිනාකමක් ගත්තේය. ආයෝජන මණ්ඩලය විසින් අනුමත ව්‍යාපෘති අතුරින් 2012 වසර තුළ දී ලබා තිබූ මුළු ආයෝජන වටිනාකම රුපියල් බිලියන 248 ක් විය. මේ අතර, 2012 වසර තුළ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ කර්මාන්ත 42 ක් ලියාපදිංචි කර තිබුණු අතර ඒවායේ මුළු වටිනාකම රුපියල් බිලියන 3 ක් විය.

**රටෙහි ප්‍රාග්ධන සම්භාරය වර්ධනය කිරීම උදෙසා සිය කැපවීම පෙන්නුම් කරමින් රාජ්‍ය මූල්‍ය අංශයේ අභියෝග මධ්‍යයේ වුව ද රාජ්‍ය අංශය සිය ආයෝජන වැඩසටහන ප්‍රසාරණය කර ගැනීමට සමත් වී ඇත.** ඒ අනුව, රාජ්‍ය අංශයේ ආයෝජන ක්‍රියාකාරකම් සියයට 28.1 කින් වර්ධනය වී ඇත. මෙය 2012 වසර තුළ දී සිදු වූ සමස්ත ආයෝජන ක්‍රියාවලියෙන් සියයට 22.6 කට පමණ හිමිකම් කියයි. අනාගත ආර්ථික වර්ධනයේ ප්‍රධාන ගාමක බලවේග ලෙස හඳුනාගෙන ඇති පංච කේන්ද්‍රයන් සඳහා අනුග්‍රහ දක්වමින් රජය විසින් මාර්ග පද්ධතිය ආදී ප්‍රවාහන කටයුතු සඳහා වන යටිතල ව්‍යුහය සංවර්ධනය කිරීම, ගුවන් තොටුපොළ හා වරාය සහ විදුලි උත්පාදන ක්‍රියාකාරකම් ආදී සංවර්ධන කටයුතු සඳහා ඉහළ දායකත්වයක් දක්වා ඇත.

**2.11 සංඛ්‍යා සටහන — සම්පත් සංයුතිය සහ උපයෝජනය (පවත්නා වෙළෙඳ මිල අනුව)**

| අයිතමය | ප්‍රතිශතාත්මක දායකත්වය | | ප්‍රතිශතාත්මක වර්ධනය | |
|---|---|---|---|---|
| | 2011 (අ) | 2012 (ආ) | 2011 (අ) | 2012 (ආ) |
| 1. සම්පත් | | | | |
| වෙළෙඳ මිල අනුව ද.දේ.නි. | 72.7 | 73.3 | 16.8 | 15.9 |
| භාණ්ඩ සහ සේවා ආනයන | 27.3 | 26.7 | 43.1 | 12.4 |
| **එකතුව** | **100.0** | **100.0** | **23.0** | **14.9** |
| 2. උපයෝජනය | | | | |
| පරිභෝජනය | 61.5 | 60.8 | 22.4 | 13.7 |
| දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | 19.7 | 21.2 | 22.1 | 23.5 |
| පෞද්ගලික | 15.6 | 16.4 | 24.3 | 20.9 |
| රජය | 4.1 | 4.8 | 14.3 | 33.6 |
| තොග වෙනස්වීම් | 2.1 | 1.3 | 100.7 | -29.2 |
| භාණ්ඩ සහ සේවා අපනයන | 16.8 | 16.7 | 20.3 | 14.6 |
| **එකතුව** | **100.0** | **100.0** | **23.0** | **14.9** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික


මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

## පවත්නා සම්පත් සහ උපයෝජනය

**දේශීය නිමැවුම් සහ ආනයනවලින් සමන්විත ආර්ථිකය සතු සමස්ත සම්පත් ප්‍රමාණය 2012 වසර තුළ දී සියයට 14.9 ක් වැනි අඩු වේගයකින් වර්ධනය වී ඇත.** මෙහිදී නිෂ්පාදිතය මෙන්ම ආනයනයන් ද මන්දගාමී වුව ද 2011 වසරට සාපේක්ෂව ආනයනය ශීඝ්‍රයෙන් පහත බැස ඇත. එබැවින් ආනයනයන්ගේ සිදුවූ මන්දගාමීත්වය දේශීය ආර්ථිකය සතු සම්පත්හි දක්නට ලැබුණු අඩු ප්‍රසාරණයට ප්‍රධාන දායකත්වයක් දක්වා තිබේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස පවත්නා සම්පත්වල සංයුතිය, දේශීය සම්පත් දෙසට නැඹුරු වී වර්ධනය වූ අතර, එහි දායකත්වය මුළු සම්පත්වලින් සියයට 73.3 ක් විය. මේ අතරතුර, සෙසු භාගය විදේශීය අංශය මගින් නියෝජනය කරන ලදී. පවත්නා මිල අනුව, මේ වසරේ මුළු සම්පත් ප්‍රමාණය පිළිබඳ තක්සේරුව රුපියල් බිලියන 10,348 ක් විය. ඒ අනුව, සමස්ත සම්පත් ප්‍රමාණය 2011 වසරේ දී ලබාගත් සියයට 11.5 ක මූර්ත ප්‍රසාරණයට සාපේක්ෂව මෙම වසරේ දී සියයට 4.7 ක අඩු වර්ධනයක් වාර්තා කර ඇත.

**පරිභෝජනය, ආයෝජනය සහ අපනයනය සඳහා වන අවශ්‍යතා සම්පූර්ණ කිරීම උදෙසා ආර්ථිකයට සම්පත්වල අවශ්‍යතාවයක් පවතී.** උපයෝජනයේ සංයුතිය ආයෝජන ක්‍රියාකාරකම් දෙසට විතැන් වී තිබෙනු දක්නට ලැබෙන අතර, එය සමස්ත

**2.6 රූප සටහන** **2012 වර්ෂයේ ආර්ථිකය (පවත්නා මිල යටතේ)**




උපයෝජනයට දක්වනු ලබන දායකත්වය ප්‍රතිශතාංශක 0.5 කින් පමණ දියුණු විය. ඒ අනුව, උපයෝජනයෙහි පරිභෝජනය සතුව තිබූ ප්‍රතිශතයෙහි පහත වැටීමක් දක්නට ලැබෙයි. මේ අතරතුර, ආනයනයෙහි සිදුවූ සැලකිය යුතු පසුබෑම ආයෝජන ආශ්‍රිත වියදම්වලට වඩා පරිභෝජන වියදම්වලට වැඩි බලපෑමක් ඇති කළ බව පෙනීයයි. එසේම, 2012 වසර තුළ දී භාණ්ඩ සහ සේවා අපනයනය සතුව තිබූ ප්‍රතිශතයෙහි ද නාමික වශයෙන් ආන්තික අඩු වීමක් වාර්තා කර ඇත. සේවා අපනයනයේ මෙම වසර තුළ දී ප්‍රසාරණයක් ඇති වූ බැවින් අපනයන අංශයේ සිදුවූ අවනතියට හේතු වූයේ වසර තුළ භාණ්ඩ අපනයන ප්‍රතිශතය පහත වැටීමයි. එසේම, අපනයන ව්‍යුහය විවිධාංගීකරණය කිරීමේ දී සහ වැඩි එකතු කළ අගයන්ගෙන් සමන්විත අපනයන දෙසට සංක්‍රමණය වීම උදෙසා සේවා අංශයේ අපනයනයන්හි සිදුවූ මෙම ඉහළ වර්ධනය සතුටුදායක ප්‍රවණතාවයක් ලෙස සැලකිය හැක.

කාර්මික අංශයේ ඉහළ දායකත්වය හේතුවෙන් සම්පත් සම්පාදනයෙහිලා දේශීය අංශයේ සහභාගිත්වය සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත. මේ සඳහා කෘෂිකාර්මික අංශයේ දායකත්වයෙහි පහත බැසීමක් දක්නට ලැබෙන අතර, සේවා අංශයේ දායකත්වය නොවෙනස්ව පවත්වා ගෙන ඇත. ඒ අනුව, දේශීය සේවා අංශය විසින් විශාලතම භාගය වන සියයට 42.1 ක දායකත්වයක් දක්වා ඇති අතර, කාර්මික අංශයේ නිෂ්පාදනය සියයට 23.1 ක දායකත්වයක් දක්වා ඇත. එමෙන්ම භාණ්ඩ හා සේවා ආනයනය සම්බන්ධව සලකන විට භාණ්ඩ ආනයනය සතු භාගය සියයට එකකින් පමණ අඩු වූ අතර සේවා ආනයනය සිය භාගය වර්ධනය කරගෙන තිබෙයි.

## ඉතුරුම්

2011 වසරේ දී ඇතිවුණු පසුබෑම තරමක් දුරට අභිබවමින් දේශීය ඉතුරුම් අනුපාතිකය 2012 වසරේ දී සියයට 17.0 දක්වා වැඩිදියුණු විය. දේශීය ඉතුරුම්හි දක්නට ලැබුණු මෙම සුබදායී ප්‍රවණතාවයට පෞද්ගලික අංශයේ ඉහළ ක්‍රියාකාරිත්වය හේතු වී ඇත. 2011 වසරට සාපේක්ෂව පෞද්ගලික ඉතුරුම් සියයට 29 ක වේගයකින් ඉහළ ගිය අතර, රාජ්‍ය නිර්-ඉතුරුම් සැලකිය යුතු ප්‍රමාණයකින් පිරිහී යනු දක්නට ලැබුණි. වසර තුළ දී රාජ්‍ය ආදායමෙහි සිදු වූ මන්දගාමී වර්ධනය මෙම රාජ්‍ය නිර්-ඉතුරුම්වල පිරිහීමට හේතු වී ඇත. වසර තුළ හඳුන්වා දෙන ලද උපායමාර්ගික ක්‍රියාපිළිවෙත්වල ප්‍රතිඵලයක් ලෙස පහළ ගිය ආනයන වර්ධනය මගින් සීමා කෙරුණු විදේශ වියදම් තුළින් ද ඉතුරුම් වැඩිදියුණු වී ඇත.

දේශීය ඉතුරුම්වල වූ සතුටුදායක වර්ධනය සමඟ ජාතික ඉතුරුම් ද වර්ධනය වී ඇත. ජාතික ඉතුරුම් මෙම වසර තුළ දී සියයට 26.2 ක ප්‍රසාරණයක් වාර්තා කරමින්, ද.දේ.නි. හි අනුපාතයක් ලෙස සියයට 24.0 ක් දක්වා පුළුල් වූ අතර, මෙය 2011 වසර හා සැසඳීමේ දී ප්‍රතිශතාංක දෙකක ඉහළ යාමකි. දේශීය ඉතුරුම්වල සුබදායී ප්‍රවණතාවය සඳහා රුපියල අවප්‍රමාණ වීම සමඟ සිදුවූ ශුද්ධ පෞද්ගලික සංක්‍රාමවල වර්ධනය ද හේතු විය. ශුද්ධ පෞද්ගලික සංක්‍රාම 2012 වසරේ දී සතුටුදායක ලෙස සියයට 34.6 ක වේගයකින් වර්ධනය වූ අතර, විදේශීය ප්‍රේෂණ ලැබීම් ඉහළ මට්ටමක පැවතීම මෙයට ප්‍රධාන හේතුව විය. විදේශීය ශුද්ධ සාධක ආදායම් පිරිහීම ජාතික ඉතුරුම්වල වර්ධනයට තරමක සෘණාත්මක බලපෑමක් ඇති කරන ලදී. මේ අතර, සම්පත් පරතරය ද.දේ.නි. හි

**2.12 සංඛ්‍යා සටහන**

**පරිභෝජනය, ආයෝජන සහ ඉතිරිකිරීම් (පවත්නා වෙළෙඳ මිල අනුව)**

| අයිතමය | රුපියල් මිලියන | | ප්‍රතිශතක වෙනස | | ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස | |
|---|---|---|---|---|---|---|
| | 2011 (අ) | 2012 (ආ) | 2011 (අ) | 2012 (ආ) | 2011 (අ) | 2012 (ආ) |
| 1. වෙළෙඳ මිල අනුව ද.දේ.නි. | 6,544,009 | 7,582,376 | 16.8 | 15.9 | 100.0 | 100.0 |
| 2. පරිභෝජන වියදම | 5,536,095 | 6,295,894 | 22.4 | 13.7 | 84.6 | 83.0 |
| පෞද්ගලික | 4,568,393 | 5,274,451 | 25.1 | 15.5 | 69.8 | 69.6 |
| රජය | 967,702 | 1,021,443 | 10.9 | 5.6 | 14.8 | 13.5 |
| 3. ආයෝජන | 1,960,179 | 2,322,732 | 26.8 | 18.5 | 30.0 | 30.6 |
| පෞද්ගලික | 1,550,676 | 1,798,086 | 29.1 | 16.0 | 23.7 | 23.7 |
| රජය | 409,503 | 524,646 | 18.8 | 28.1 | 6.3 | 6.9 |
| 4. දේශීය ඉතුරුම් | 1,007,914 | 1,286,482 | -6.7 | 27.6 | 15.4 | 17.0 |
| පෞද්ගලික | 1,079,770 | 1,392,887 | -10.0 | 29.0 | 16.5 | 18.4 |
| රජය | -71,856 | -106,405 | 40.0 | -48.1 | -1.1 | -1.4 |
| 5. දේශීය ඉතුරුම්-ආයෝජන පරතරය | -952,265 | -1,036,250 | -104.5 | -8.8 | -14.6 | -13.7 |
| 6. විදේශීය ශුද්ධ සාධක ආදායම | -72,041 | -148,422 | -3.2 | -106.0 | -1.1 | -2.0 |
| 7. විදේශීය ශුද්ධ පෞද්ගලික වර්තන සංක්‍රාම | 506,630 | 681,714 | 24.2 | 34.6 | 7.7 | 9.0 |
| 8. ජාතික ඉතුරුම් | 1,442,503 | 1,819,774 | 1.7 | 26.2 | 22.0 | 24.0 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රතිශතයක් ලෙස, 2011 දී වාර්තා කළ සියයට 7.9 ට සාපේක්ෂව 2012 වසරේ දී සියයට 6.6 දක්වා අඩු වී ඇත. සම්පත් පරතරය සෘණ අගයක් වීම මගින් ආයෝජන සඳහා විදේශීය මුදල් මත වූ යැපීම පිළිබිඹු කෙරෙයි. එසේම, මෙමගින් අඛණ්ඩ ආර්ථික වර්ධනයට උපකාරී වන ආයෝජන ඉහළ මට්ටමක පවත්වා ගැනීමට, ජාතික ඉතුරුම් තවදුරටත් වර්ධනය කිරීමෙහි ඇති වැදගත්කම ද ඉස්මතු කරයි.